ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාව

இலங்கை ஒலிபரப்புக் கூட்டுத்தாபனம்

**Sri Lanka Broadcasting Corporation**



# වාර්ෂික වාර්තාව
# ஆண்டறிக்கை
# ANNUAL REPORT 2014

# ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාව

# වාර්ෂික වාර්තාව සහ
# ගිණුම් ප්‍රකාශනය
# 2014

**2014 ජනවාරි මස 01 වෙනි දින සිට 2014 දෙසැම්බර් මස 31 වෙනි දින දක්වා**

ගරු පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ හා ජනමාධ්‍ය අමාත්‍යතුමා
පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ හා ජනමාධ්‍ය අමාත්‍යාංශය
කොළඹ 05

ගරු අමාත්‍යතුමනි,

<u>වාර්ෂික වාර්තාව -2014</u>

1971 අංක 38 දරන මුදල් පනතේ 14 (1) වගන්තිය ප්‍රකාරව 2014 දෙසැම්බර් මස 31 වෙනි දිනට අවසන් වර්ෂය වෙනුවෙන් පහත සඳහන් ලේඛන ඇතුළත් සංස්ථාවේ වාර්ෂික වාර්තාව මේ සමඟ ඉදිරිපත් කරමි.

01. 2014 ජනවාරි මස 01 වෙනි දින සිට 2014 දෙසැම්බර් මස 31 වෙනි දින දක්වා වූ වර්ෂය සඳහා ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාව ඉටුකළ කාර්යයන් පිළිබඳ පාලන වාර්තාවකි.

02. 2014 ජනවාරි මස 01 වෙනි දින සිට 2014 දෙසැම්බර් මස 31 වෙනි දින දක්වා වූ ගිණුම් වර්ෂය සඳහා ගිණුම් සම්බන්ධ වාර්තාව.

03. 2014 දෙසැම්බර් මස 31 වෙනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා අවසන් ගිණුම් සම්බන්ධයෙන් වූ විගණකාධිපති වාර්තාව.

04. 2014 වර්ෂයේ විගණකාධිපති වාර්තාව සඳහා සංස්ථාව ඉදිරිපත් කරන පරිකථනය.

මෙයට - විශ්වාසී,

නීතිඥ නන්ද මුරුත්තෙට්ටුවේගම
සභාපති
ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාව
කොළඹ 07

# <u>පටුන</u>


| | පිටු අංක |
|---|---|
| 01. පාලන වාර්තාව | 01 - 09 |
| 02. ගිණුම් ප්‍රකාශනය | 11 - 40 |
| 03. මූල්‍ය ප්‍රකාශය පිළිබඳ විගණකාධිපති වාර්තාව | 41 - 61 |
| 04. 2014 විගණකාධිපති වාර්තාව සඳහා සංස්ථාවේ පරිකථනය | 63 - 78 |

# ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාව

## දැක්ම

ප්‍රමුඛ ශ්‍රී ලාංකික ගුවන්විදුලි සන්නිවේදකයා වේ.

## මෙහෙවර

ශ්‍රාවකයාගේ ජීවිතයට බලපාන ආර්ථික, සාමාජීය, සංස්කෘතික, සදාචාරාත්මක, අධ්‍යාපනික, විනෝදාත්මක යනාදී විවිධ ක්ෂේත්‍ර ඇසුරෙන් ඔවුන්ගේ ජීවන තත්ත්වය වඩාත් උසස් මට්ටමකට ගෙන ඒමෙන් ඔවුන්ගේ ජීවිත ආලෝකමත් කිරීමක් උදෙසා දැනුම, ආකල්ප සහ කුසලතා වර්ධනයට සමත් වන ආකාරයෙන් ගුවන්විදුලි මාධ්‍ය මෙහෙයවීම.

## අරමුණ

01. සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂා තුන සඳහා වැඩිම ශ්‍රාවක පිරිසක් සහිත ගුවන්විදුලි නාලිකා පවත්-වාගෙන යන ආයතනය ලෙස කටයුතු කිරීම.

02. වගකීමෙන් යුතුව සමබර තොරතුරු කඩිනමින් ලබාදෙන, ශ්‍රී ලාංකික මාධ්‍ය ක්ෂේත්‍රයේ ප්‍රමුඛයා ලෙස කටයුතු කිරීම.

03. දේශීය සංස්කෘතියේ අභිවෘද්ධිය පිණිස උසස් සහ නිර්මාණාත්මක වැඩසටහන් නිෂ්පාදනය කර ඉදිරිපත් කිරීම.

04, දැනුම, ආකල්ප සහ කුසලතාවන්ගෙන් පිරිපුන් ස්වයං අභිප්‍රේරණ කාර්ය මණ්ඩලයක් බිහි කිරීමට අවශ්‍ය පුහුණුව ලබාදීම.

05. නිෂ්පාදන සහ විකාශන තාක්ෂණය නිසි පරිදි යාවත්කාලීන කරමින් දෙස් විදෙස් ශ්‍රාවකයන්ට පැහැදිලි ශ්‍රවණ තත්ත්වයක් ලබාදීම.

06. ආචාරධර්ම පද්ධතියකට අනුව හරවත් ගුවන් විදුලි මාධ්‍ය සම්ප්‍රදායක් බිහිකිරීම උදෙසා පුරෝගාමී ආයතනය ලෙස ක්‍රියා කිරීම.

07. ජාතික ගුවන්විදුලිය ලෙස රාජ්‍ය ප්‍රතිපත්ති හා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සම්බන්ධව ජනතාව දැනුවත් කිරීම සඳහා නිර්මාණශීලී දායකත්වය සැපයීම.

08. යහපත් මූල්‍ය පාලනයක් හා මානව සම්පත් කළමනාකාරිත්වයක් පවත්වාගෙන යාම.

09. තරඟකාරී වෙළඳපොළ උපායශීලීව ජයගැනීම.

# පාලන වාර්තාව
# 2014

## පාලන වාර්තාව - 2014

### හැඳින්වීම

1966 අංක 37 දරන පාර්ලිමේන්තු පනත යටතේ ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාව 1967 ජනවාරි මස 05 වන දින සිට ක්‍රියාත්මක වන ලෙසට ප්‍රතිෂ්ඨාපනය කරන ලද්දකි.

2014 ජනවාරි මස 01 දින සිට දෙසැම්බර් 31 දින දක්වා වූ මාස 12 ක කාලපරිච්ඡේදය මෙම වාර්තාවෙන් ආවරණ වේ.

සමාලෝචනයට ලක්වන කාලපරිච්ඡේදය තුළ පහත දැක්වෙන සාමාජිකයින් සංස්ථා මණ්ඩලයට ඇතුළත් විය.

| | | | |
|---|---|---|---|
| 01. | හඩ්සන් සමරසිංහ මහතා | - | සභාපති |
| 02. | කුමාරදාස සපුතන්ත්‍රී මහතා | - | සංස්ථා මණ්ඩල සාමාජික |
| 03. | ආචාර්ය හරිස්චන්ද්‍ර විජේතුංග මහතා | - | සංස්ථා මණ්ඩල සාමාජික |
| 04. | මනෝජ් පීරිස් මහතා | - | සංස්ථා මණ්ඩල සාමාජික |
| 05. | ලයනල් පින්තු මහතා | - | සංස්ථා මණ්ඩල සාමාජික |
| 06. | දර්ශනා සේනානායක මිය | - | සංස්ථා මණ්ඩල සාමාජික |

## පාලන වාර්තාව - 2014

ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාව 2014 වර්ෂය වනවිටත් ශ්‍රවණ විද්‍යුත් මාධ්‍ය ක්ෂේත්‍රයේ පුරෝගාමී ආයතනය-යි. මහජනතාවගේ ගුවන්විදුලිය ලෙස තම අරමුණු ඉටුකර ගැනීම සඳහා ප්‍රමුඛතම කාර්යයන් රැසක් ඉටුකිරීමට සංස්ථාව කටයුතු කර ඇත. රජය විසින් දියත් කරනු ලබන සංවර්ධන වැඩසටහන්වල ප්‍රමුඛතම මාධ්‍යකරුවා වන්නේ ද, ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාවයි. ලක්වාසීන්ගේ දැනුම අවබෝධය මෙන්ම රසවින්දනය පුළුල් කරමින් ජාතික වශයෙන් පුරෝගාමී මෙහෙවරක යෙදුනු 2014 වර්ෂය තුළ සංස්ථාවේ ක්‍රියාත්මක වූ සේවාවන් හා ඒවායේ ප්‍රචාරයට යොදා ඇති වැඩසටහන් සම්බන්ධයෙන් ලුහුඬු සටහන් පහත සටහන්කර ඇත.

### ස්වදේශීය සේවය

ප්‍රමුඛතම ජාතික නාලිකාව වශයෙන් ස්වදේශීය සේවය ආර්ථික, සාමාජික, සංස්කෘතික, සදාචාරාත්මක අධ්‍යාපනික හා රසාස්වාදනය ආදී විවිධ අංශයන් ඔස්සේ වැඩසටහන් ප්‍රචාරයට යොදා ඇත.

ආගමික වැඩසටහන් සඳහා ප්‍රමුඛ දායකත්වයක් ලබාදෙන අතර, ප්‍රචාරයට යෙදූ සර්ව ආගමික වැඩසටහන් අතර ධර්ම දේශනා, ධම්මචින්තා, ධර්ම සාකච්ඡා, කිතුරස වින්දන, ක්‍රිස්තියානි අඩ පැය, සිනගෝගය හා මීට අමතරව පාප් වහන්සේගේ ලංකා සංචාරය වෙනුවෙන් විවිධ වැඩසටහන් හා සංගීත සංධ්වනි සංයුක්ත තැටිය එළිදැක්වීම ආදිය දැක්විය හැකිය.

ප්‍රවෘත්ති හා කාලීන තොරතුරු සම්බන්ධයෙන් ප්‍රචාරය වූ වැඩසටහන් අතර සුභාරතී, පුවත් අටුවාව, ප්‍රවෘත්ති පසුබිම දැක්විය හැකිය. මීට අමතරව ජාතික ඩෙංගු සතිය, ජගත් පරිසර දිනය, ඉසිවර අසපුව, සුවසෙත වෛද්‍ය සාකච්ඡාව, ලිය සරණි, සිරිමැදුර, ලලනා, ලතා මඩුල්ල දැක්විය හැකිය.

උසස් රසවින්දනය හා සාහිත්‍ය සම්බන්ධයෙන් දැනුම වර්ධනය කිරීම සඳහා මහාවංශය, පූජිත ජීවිත, ගුවන් විදුලි රඟ මඩල, සරස රාවය, නූර්ති හා නාඩගම් ගී, සේවක සංග්‍රහය, ලලිත කළාලේ, මැන්ඩෙලා ගීතය, ගුවන්විදුලි නාට්‍ය දැක්ම, ධර්මපාල පුනරාගමනය ආදී වැඩසටහන් පෙන්වාදිය හැකිය.

කෘෂිකර්මය සම්බන්ධ වැඩසටහන් ලෙස ගෙවත්ත, සාරභූමි ගොවිතැනට පැයක්, සන්ධ්‍යා සේවය ආදී වැඩසටහන් ප්‍රචාරය කර ඇත.

රටේ ජීවනාලිය බඳු දරුවන් වෙනුවෙන් දිනපතා ප.ව. 02.00 සිට 06.00 දක්වා ළමා වැඩසටහන් ප්‍රචාරයට යොදනු ලැබීය. රටක මහිම, ගුවනින් නුවණට, කිතුණු ළමා හමුව, සමනල ලන්ද, මතුදා ප්‍රතිභා ප්‍රභා, දොස්තර හොඳ හිත, ගුවන් තක්සලාව, මේ අපේ පාසැල, රටට පිපෙන මල් ආදී වැඩසටහන් විදුල ළමා ගුවන් විදුලිය මගින් ස්වදේශීය සේවය ඔස්සේ ප්‍රචාරය කරනු ලැබ ඇත.

### අධ්‍යාපන සේවය

සුපුරුදු පරිදි 2014 වර්ෂයේ ද ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව පැවැත්වූ ජාතික මට්ටමේ තරඟ විභාග සඳහා උපකාරක වැඩසටහන් ප්‍රචාරයට යොදා ඇත. 2014 වර්ෂයේ දී කොළඹ, ගම්පහ, කළුතර අධ්‍යාපන කලාපවල අඩු පහසුකම් සහිත පාසැල්වල දරුවන් සහභාගී කරවාගෙන සම්මන්ත්‍රණ මාලාවක් පවත්වන ලදී. විභාග අලලා ප්‍රචාරය කළ වැඩසටහන්වලට අමතරව ශිල්ප මඩුලු යට, ආයුර්වේද වෛද්‍ය විද්‍යාවේ මුඛ සෞඛ්‍ය, දහම් තක්සලාව සාහිත්‍යයෙන් ජීවිතය ජයගමු ආදි නොවිදිමත් අධ්‍යාපනික වැඩසටහන් ද ප්‍රචාරයකර ඇත. දිනපතා ප.ව. 03.00 - 04.00 දක්වා අධ්‍යාපන සේවයේ වැඩසටහන් ප්‍රචාරය කෙරේ.

## වෙළෙඳ සේවය

ප්‍රමුඛතම වෙළඳ නාලිකාව ලෙස ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාවට විශිෂ්ඨ සේවයක් ඉටුකරන වෙළෙඳ සේවය 2014 වර්ෂයේ ද තම වගකීම ප්‍රශස්ථ ලෙස ඉටුකර ඇත.

රන්තරු පායන රිදී රැයක්, සොබාකෙත, උරුම රකිමු, දැය සුරකිමු, පාලම ආදි වැඩසටහන් මඟින් ද, පාලම, හදමාමා, ඇවිද්ද පය දහස් වටී, ගොවි බිමයි ජය ටැඹයි, සදහම් දහර ධර්ම දේශනය, ජනප්‍රිය ගී, මධුරසාංග, ගී මනරම්, මුවන්පැලැස්ස, රටයන අත, දසදෙසින් යන වැඩසටහන් හරහා ද ශ්‍රාවක හා අනුග්‍රාහක ප්‍රසාදය දිනා ගන්නා ලදී.

විවිධ මානයන් ඔස්සේ තවදුරටත් ප්‍රචාරයට යෙදූ වැඩසටහන් අතර ජනජය මාවත, ආයුර්වේද සෙත් අරණ, සමෘද්ධි පිළිසදර, නිරෝගිමත් දරුවා දැයට සම්පතකි. ගීයක වියමන, සතියේ වෛද්‍ය සායනය, ජීවිතයට විනාඩියක්, සම්මා ආජීව, ගීයක බණ පද ආදී වැඩසටහන් පෙන්වා දිය හැක.

## සිටි එෆ් එම් සේවය

තරුණ ප්‍රජාව ආකර්ශනය කරගැනීම සඳහා ජාතික ගුවන්විදුලිය නියෝජනය කරන්නේ සිටි එෆ් එම් සේවයයි. එලෙසට ශ්‍රාවක පිරිසට වඩාත් සමීපවීම සඳහා විවිධ මානයන් ඔස්සේ වැඩසටහන් ප්‍රචාරයට කටයුතු යොදා ඇත.

ආගමික වැඩසටහන් අතර ධම්ම දේශනා හා ධම්ම පදය, ක්‍රිස්තියානි වැඩසටහන් හා විවිධ ආගමික උත්සව ප්‍රචාරයට යොදයි. මැද පෙරදිග අසන්නන් හා සම්බන්ධ වෙමින් 2014 වසරේ ද මැදපෙරදිග වැඩසටහන් ප්‍රචාරයට යොදා ඇත.

කාලීන හා සමාජීය වශයෙන් සිදුවන වැදගත් සිදුවීම් සම්බන්ධ කරගනිමින් දස දෙසින් සහ රට යන අත, පනාපුත්‍ර සමඟ හෝරාවක්, වැඩිහිටියන්ට පමණයි ආදි වැඩසටහන් ප්‍රචාරයට යොදා ඇත.

සිටි එෆ් එම් සේවයෙ ප්‍රචාරය වන සංගීත වැඩසටහන් අතර හිත මිතුරු සුළඟ, ආරාධනා, සුභාවිත ගීතය, මියුරුසැර, ජනප්‍රිය හින්දි ගීත, මියැසි කිරුළ, පැදුරු සාජ්ජය ආදී වැඩසටහන් ගුවනට මුසු කිරීමට කටයුතුකර ඇත.

මීට අමතරව සේවාදායක අනුග්‍රහය සහිත වැඩසටහන් සමඟ අධ්‍යාපනික වැඩසටහන්, කාන්තා වැඩසටහන් විනෝදාත්මක වැඩසටහන් රාශියක් ප්‍රචාරයට යෙදීම සිටි එෆ් එම් සේවය කටයුතුකර ඇත.

## දෙමළ සේවය

ද්‍රවිඩ භාෂාව කථා කරන ජනතාවගේ ප්‍රමුඛතම නාලිකාව වශයෙන් ආර්ථික, සමාජීය සංස්කෘතිය සදාචාරාත්මක අධ්‍යාපනික හා රසවින්දනය පුළුල් කිරීම සඳහා ප්‍රමුඛතම දායකත්වයක් ලබාදීමට දෙමළ සේවය සමත් වී ඇත. 2014 වර්ෂයේ දී ප්‍රචාරය වූ වැඩසටහන් අතර විඩියුම් වේලෙයි, කවිදෙයි කලසම්, මුත්තවිදානම්, පෙන්උලගම්, සිරුවර්මලර් පෙන්වාදිය හැකි අතර, ජාතික හා ජාත්‍යන්තර වශයෙන් සැමරිය යුතු විශේෂ අවස්ථා වන තයිපොංගල් වැඩසටහන්, නිදහස් දින උත්සව වැඩසටහන්, කාන්තා දින වැඩසටහන් සිංහල හින්දු අලුත් අවුරුදු වැඩසටහන්, ළමා දින සැමරීමේ වැඩසටහන් ආදිය මෙන්ම සර්ව ආගමික වැඩසටහන් ද ප්‍රචාරයට යොදා ඇත.

## තෙන්ඩ්‍රල් සේවය

ද්‍රවිඩ භාෂාව කථා කරන තරුණ අසන්නන් ඉලක්ක කරගනිමින් වැඩසටහන් ප්‍රචාරය කිරීමට 2014 වර්ෂය පුරාම තෙන්ඩ්‍රල් සේවයට හැකියාව ලැබී ඇත. වසරේ සියලුම වැදගත් අවස්ථා හා දිනයන් සම්බන්ධ කරගනිමින් වැඩසටහන් ප්‍රචාරයට යෙදා ඇති අතර, පොන් මාලෙයි පොලුදු (Pon Malai, Poludu) පාට්ටුක්කු පාට්ට (Pattuku Pattu) පාලම් (Paalam) අරිවෝලි (Arivoli) සේවාදායක වැඩසටහන් ප්‍රචාරයට යොදා ඇත.

## මුස්ලිම් සේවය

මුස්ලිම් සේවයේ ප්‍රචාරය වන බොහෝ වැඩසටහන් සේවාදායක අනුග්‍රහය ඇතිව ප්‍රචාරය වන බැවින් ගුවන් කාලය පෙ.ව. 08.00 සිට 10.30 දක්වා වෙන්කර ඇත. ගුවන් කාලය 12.30 දක්වා වෙන් කිරීමට බොහෝ විට සිදුවේ. 2014 වර්ෂයේ ද සේවාදායක අනුග්‍රහය මත හජ්ජි හා රාමසාන් උත්සව සඳහා විශේෂ වැඩසටහන් හා විශේෂ යාඥා වැඩසටහන් දේවස්ථානවල සිට ප්‍රචාරයට යොදා ඇත.

## ඉංග්‍රීසි සේවය

ගුවන්විදුලි සංස්ථාවේ ආරම්භකම නාලිකාව වන ඉංග්‍රීසි සේවය ඓතිහාසික වැදගත්කමින් යුත් පැරණි හා නව සංගීත නාට්‍ය වැඩසටහන් රාශියකට හිමිකම් කියයි. වැඩි ශ්‍රාවක පිරිසකගේ නැඹුරුවක් ඇත්තේ ද මෙවැනි වැඩසටහන්වලට බැවින්, ඉංග්‍රීසි අසන්නන් සඳහා උසස් රසවින්දනයක් ලබාදීමේ අරමුණින් මෙම නාලිකාව ක්‍රියාත්මක වේ. මීට අමතරව සෑම ක්ෂේත්‍රයක්ම නියෝජනය වන ලෙස එනම්, ප්‍රවෘත්ති හා කාලීන, ළමා හා කාන්තා සෞඛ්‍ය හා පෝෂණය ආදී මාතෘකා ඔස්සේ ද වැඩසටහන් ප්‍රචාරයකර ඇත. සියලුම විදේශ තානාපති කාර්යාල ආවරණය කරමින් විශේෂ වැඩසටහන් රාශියක් ද සිදුකර ඇත.

## සංගීත අංශය

ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාවේ වැඩසටහන් සංගීතාංගවලින් අලංකාර කරමින් ඒ සඳහා නව ජීවයක් ලබාදෙන්නේ සංගීත අංශයයි. වසර පුරාම සතියේ දින පහේම තෝරාගත් සරල ගී ශිල්පීන්ගේ ගායන කුසලතා වැඩි දියුණු කිරීමේ අරමුණින් සුභාවිත සංගීතය රසිකයින් අතර ජනප්‍රිය කිරීම සඳහා සුභාවිත ගීතය, නමින් වැඩසටහන් ප්‍රචාරයට යොදයි. ගුවන්විදුලි සංස්ථාව වාද්‍ය වෘන්දය ඉදිරිපත් කළ වාද්‍යමය සංගීත වැඩසටහන් වන 'මියුරු සර' වැඩසටහන ශ්‍රාවකයන්ගේ මනස සුවපත් කළ ජනප්‍රිය වැඩසටහනක් විය. සුපුරුදු පරිදි ඉදිරිපත් කළ ලලිත කලාලය, ඉරිදා සංග්‍රහය, ජනගී, නුර්ති ගී, නාඩගම් ගී, විරිදු, බයිලා, ධම්ම පද ගී, වැඩසටහන්වලට අමතරව විශිෂ්ඨ සංගීතඥයින්ගේ අනුස්මරණ දින අලලා ''ආවර්ජනා'' නමින් විශේෂ සංගීත වැඩසටහන් ද ප්‍රචාරයට යොදා ඇත. සරස වැස්ස නමින් නව නිර්මාණ ගීත වැඩසටහන් හා ශ්‍රද්ධාංජලී නමින් බෞද්ධ ගීත විචාරාත්මක වැඩසටහන්ද ප්‍රචාරයට යොදා ඇත.

## ප්‍රවෘත්ති හා කාලීන වැඩසටහන් අංශය

ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාවේ ප්‍රවෘත්ති සන්නිවේදන ක්‍රියාවලියේ ප්‍රමුඛතම කාර්යයක් ඉටුකරන ප්‍රවෘත්ති හා කාලීන වැඩසටහන් අංශය 2014 වර්ෂය ද සිය කාර්යභාරය නොපිරිහෙලා ඉටුකොට ඇත.

රාජ්‍ය ප්‍රතිපත්ති පිළිබඳ ජනතාව දැනුවත් කිරීමේ අරමුණින් සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි යන භාෂාත්‍රයෙන් ම ප්‍රධාන ප්‍රවෘත්ති ප්‍රකාශ දොළහක් ඉදිරිපත් කරයි. සෑම පැයකටම වරක් සිංහල දෙමළ සහ ඉංග්‍රීසි භාෂාත්‍රයෙන්ම කෙටි ප්‍රවෘත්ති ඉදිරිපත් කරයි.

රාජ්‍ය ප්‍රතිපත්ති හා ජාතික වැදගත් කමින් යුත් ප්‍රවෘත්ති ශ්‍රී ලාංකේය ජනතාව අතර නිවැරදි දැක්මක් සනිටුහන් කිරීමට ජාතික ගුවන්විදුලියේ ප්‍රවෘත්ති හා කාලීන වැඩසටහන් අංශය ප්‍රශංසාත්මක සේවයක් ඉටුකර ඇත.

## මැදිරි මෙහෙයුම් අංශය

ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාවේ වැඩසටහන් පටිගත කිරීම, සංස්කරණය හා සියලු සේවාවන් සම්බන්ධතා මැදිරිය හරහා සජීවී විකාශය කිරීම ඇතුළු සියලුම ප්‍රචාරක කටයුතු සඳහා මහගු දායකත්වයක් 2014 වර්ෂයේ දී ලබා දී ඇත.

## අභ්‍යාස හා විදේශ සම්බන්ධතා අංශය

2014 වර්ෂයේ පුහුණු වැඩමුළු සංස්ථා කාර්ය මණ්ඩලයට සහ බාහිර ආයතන/ සන්නිවේදන තාක්ෂණ සහතික පත්‍ර පාඨමාලාව ආදී මුදල් උපයන වැඩමුළු, සැසි, පුහුණු පාඨමාලා, ක්‍රියාත්මක කෙරිණි. 2014 වර්ෂයේ අගභාගය වනවිට අභ්‍යාස ආයතනය නාගරික සංවර්ධන අදිකාරිය ඉදිකිරීමේ කටයුතු සඳහා භාරගැනීම නිසා බහුකාර්ය මැදිරියේ උඩුමහලේ සීමිත ඉඩකඩක ස්ථාපිත විය.

## කැසට් හා ප්‍රකාශන අංශය

ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාවට නවතම ආදායම් උපයන කාර්යයක් ලෙස 2004 වර්ෂයේ ආරම්භ කළ කැසට් හා ප්‍රකාශන අංශය 2014 වර්ෂයේ ද සාර්ථකව ක්‍රියාත්මක විය. 2014 වර්ෂයේ නිෂ්පාදනය කර ඇති සංයුක්ත තැටි අතරට එක් වූ නවතම සංයුක්ත තැටි ලෙස 'සඳකැන් වැටිලා' සහ 'හින්දි ගී අනුවාදන' හදුන්වාදිය හැක. මීට අමතරව හඬ සඟරාව කලාප 03 ක් ද 2014 වර්ෂය තුළ දී සම්පාදනය කර ඇත. පසුගිය වර්ෂවල දී මෙන්ම මුතු පබළු, ඕලු පිපීලා, ග්‍රැමෆෝන ගී, ජන ගී, අපේ අම්මා කොළඹ ගිහිල්ලා යන සංයුක්ත තැටි සඳහා හොඳ අලෙවියක් තිබුණි.

## අලෙවි අංශය

අලෙවි අංශය 2014 වර්ෂයේ රු. 453,614,182/- ගුවන් කාලය අලෙවිකර ආදායමක් උපයා ගැනීමට සමත් වී ඇත.

2014 වර්ෂයේ ද දැයට කිරුළ ජාතික වැඩසටහනට සමගාමීව ඒ ඒ අමාත්‍යාංශ දෙපාර්තමේන්තුවල කාර්ය භාරයයන් පිළිබඳව ජනතාව දැනුවත් කිරීම සිදුකරන ලදී වෙසක් උත්සවය නිමිති කරගෙන දෙහිවල ගල්කිස්ස වෙසක් කලාපය හා මහර වෙසක් කලාපය සඳහා මාධ්‍ය දායකත්වයක් ලබාදීම ද සිදුකර ඇති තවදුරටත් අලෙවි අංශය විසින් සිදුකළ ප්‍රවර්ධන වැඩසටහන් පහත පරිදි වේ.

රාමසාන් නිමිත්තෙන් නෙළුම් පොකුණ රඟහලේ දී සංවිධානය කළ උත්සවය, මුස්ලිම් ජනතාවගේ අතිශය ගෞරවාදරයට භාජනය විය. මීට අමතරව විශ්ව විද්‍යාල සම්බන්ධ කරගනිමින් සුභාවිත ගිතය තරුණ ජනතාව අතරට ගෙන ඒම සඳහා සංගීත ප්‍රසංග සංවිධානය කල අතර ආරාධනා පේරාදෙණිය විශ්ව විද්‍යාලය හා රුහුණු විශ්වවිද්‍යාලය සම්බන්ධ කරගනිමින් කීර්තිමත් සේවාදායකත්වයක් සමග සවිධානය කරන ලදි. රාජ්‍ය අංශයේ සේවාදායකත්වය මෙන්ම පෞද්ගලික අංශයේ සේවාදායකත්වය තවදුරටත් දිනාගැනීමට සදීපා මිල ගොනුව (Price Pass) මිල ක්‍රමෝපාය අනුගමනය කරන ලදි.

## ඉංජිනේරු අංශය

2014 වර්ෂය තුළ ඉංජිනේරු අංශය විසින් කරන ලද ප්‍රමුඛතම කාර්යය වන්නේ කරගහතැන්න විකාශනාගාරය නවීකරණ කටයුතු ආරම්භ කිරීමයි. මෙම විකාශනාගාරයේ නව උපකරණ ස්ථාපිත කිරීම සඳහා මිලදී ගැනීම් සිදුකිරීමට අදාළ කටයුතු සිදුවිය.

කරගහතැන්න එෆ් එම් විකාශනාගාරය නවීකරණය කිරීමෙන් පහත සඳහන් වැඩි දියුණුවීම් සිදුවීමට නියමිතය.

01. ශ්‍රවණ තත්ත්වය හා ශ්‍රවණ ආවරණ කලාපය වැඩි දියුණුවීම.

02. ශ්‍රවණ තත්ත්වය ගුණාත්මකව වර්ධනය වීම.

03. ප්‍රධාන විදුලිය බිඳ වැටීමක දී වුවද ශ්‍රාවකයන් හට ශ්‍රවණයට බාධා නොවීම.

04. කරගහතැන්න විකාශනාගාරයේ නාලිකා සුසර කිරීමේදී එම නාලිකාවේ නම හා හඳුනාගැනීමේ විස්තර නව ගුවන්විදුලි උපකරණවල හා ජංගම දුරකථනවල තිරයේ දිස්වීම.

05. නව සම්ප්‍රේෂණ උපකරණ දුරස්ථව සිට ද පාලනය කිරීමට හැකිවීම හා ක්‍රියාකාරිත්වය නිරීක්ෂණය කිරීමට හැකිවීම.

ටොරින්ටන් චතුරශ්‍ර භූමිය නවීකරණය කිරීමේ දී සංස්ථා ගොඩනැගිලි කඩා ඉවත් කිරීමට සිදු වූ බැවින් නව ගොඩනැගිල්ලක් ඉදිකිරීම සඳහා 2014.05.05 දින මුල්ගල් තබා ආරම්භ කළ අතර ඉංජිනේරු අංශයේ පූර්ණ අධීක්ෂණය යටතේ එහි ඉදිකිරීම් 2014 වර්ෂය පුරාම සිදුවිය.

## ශ්‍රවණ පර්යේෂණ අංශය

2012 වර්ෂයේ ආරම්භ කළ ගුවන්විදුලි මාධ්‍ය භාවිතය සම්බන්ධ ක්ෂේත්‍ර සමීක්ෂණය 2014 වර්ෂයේ ද ක්‍රියාත්මක විය.

ගුවන්විදුලි සේවා පිළිබඳ සමීක්ෂණය 2014 දක්වා ද ක්‍රියාත්මක විය. ක්ෂේත්‍ර සමීක්ෂණ ක්‍රම විද්‍යාවට අනුව ගුවන්විදුලි අසන්නන් 514 ක නියැදියක් කොළඹ, ගම්පහ, මහනුවර කළුතර, මාතලේ, නුවරඑළිය, ගාල්ල, මාතර, හම්බන්තොට, යාපනය, අම්පාර, කුරුණෑගල, පුත්තලම, අනුරාධපුර, බදුල්ල, රත්නපුරය හා කෑගල්ල යන දිස්ත්‍රික්ක 17 හි සමීක්ෂණය සිදුකළේ ය. ගුවන්විදුලි සේවා 16 ක් සමීක්ෂණයට භාජනය කරන ලදී.

මීට අමතරව ගුවන්විදුලි වැඩසටහන් හි ගුණාත්මක සහ ප්‍රමාණාත්මකව ඇගයීම 2014 වර්ෂයේ ද සිදුවිය. දෙස් විදෙස් හි දිනයේ වැදගත් සිදුවීම් ඇතළත් තොරතුරු පිළිබඳව අසන්නන් දැනුවත් කිරීමේ අරමුණින් එම තොරතුරු ඇසුරින් වාර්තා සකස්කොට සිංහල සේවාවන්හි සහ ප්‍රාදේශීය සේවාවන්හි ප්‍රචාරය කිරීම සඳහා අවශ්‍ය කටයුතු යොදා ඇති ශ්‍රවණ පර්යේෂණ අංශය මගින් ඉටුකරනු ලබන තවත් මහඟු කාර්යයන් වන්නේ ගුවන්විදුලිය පිළිබඳව අධ්‍යයනය කිරීමට පැමිණෙන පාසල් සහ විශ්වවිද්‍යාලවල පර්යේෂකයන්ට ගුවන්විදුලි ඉතිහාසය සේවා සහ වැඩසටහන් පර්යේෂණ ක්‍රම හා ශ්‍රාවක ප්‍රතිචාර පිළිබඳ තොරතුරු මෙන්ම දැනුම ලබාදීමයි.

# ගිණුම් ප්‍රකාශනය
# 2014

**ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාව**
**මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය**

**(සියලුම මුදල් ප්‍රමාණයන් ශ්‍රී ලංකා රුපියල්වලින්)**

| | සටහන | 2014 දෙසැම්බර් 31 | 2013 දෙසැම්බර් 31 |
|---|---|---|---|
| **වත්කම්** | | | |
| **ජංගම නොවන වත්කම්** | | | |
| දේපල, පිරියත හා උපකරණ | 9 | 2,735,137,013 | 2,950,482,030 |
| විලම්භිත බදු වත්කම් | | 945,105 | 1,139,358 |
| සිදුකරමින් පවතින ප්‍රාග්ධන වැඩ | | 142,180,474 | 20,884,033 |
| විකිණීම සඳහා ඇති | 10 | 1,000,000 | 1,000,000 |
| | | **2,879,262,593** | **2,973,505,421** |
| **ජංගම වත්කම්** | | | |
| තොග | | 31,862,620 | 35,668,853 |
| වෙළෙඳ සහ අනෙකුත් ලැබිය යුතු දෑ | 11 | 183,852,186 | 188,653,353 |
| මාර්ගස්ථ භාණ්ඩ | | 5,501,811 | 3,448,443 |
| මුදල් සහ මුදල් සමාන දෑ | 12 | 101,096,412 | 18,046,256 |
| | | **322,313,029** | **245,816,906** |
| **මුළු වත්කම්** | | **3,201,575,622** | **3,219,322,326** |
| **ස්කන්ධය සහ බැරකම්** | | | |
| **ප්‍රාග්ධනය සහ සංචිත** | | | |
| ප්‍රකාශිත ප්‍රාග්ධනය | | 307,386,085 | 307,386,085 |
| ප්‍රත්‍යාගණන සංචිත | | 14,421,999 | 14,421,999 |
| රඳවාගත් ඉපැයුම් | 13 | (290,331,449) | (219,291,349) |
| | | **31,476,635** | **102,516,735** |
| **ජංගම නොවන බැරකම්** | | | |
| නිර්වචිත ප්‍රතිලාභ බැඳීම් | | 222,655,326 | 188,323,835 |
| විලම්භිත ආදායම් (ජපාන ප්‍රදානය) | | 84,949,026 | 90,366,039 |
| රජයේ ප්‍රදානය | | 444,048,924 | 282,901,656 |
| ට්‍රින්කෝ ප්‍රදානය | | 1,897,474,699 | 2,075,243,796 |
| විලම්භිත බදු බැරකම් | | 85,864,191 | 65,647,681 |
| කල්බදු ගිණුම (රථ වාහන) | 14 | 4,494,231 | 12,756,311 |
| | | **2,739,486,397** | **2,715,239,318** |
| **ජංගම බැරකම්** | | | |
| වෙළෙඳ සහ අනෙකුත් ලැබිය යුතු දෑ | 15 | 315,293,967 | 304,321,934 |
| මූල්‍යම නොවන බැරකම් | 16 | 115,318,623 | 97,244,339 |
| **මුළු බැරකම්** | | **430,612,590** | **401,566,273** |
| **මුළු ස්කන්ධය සහ බැරකම්** | | **3,201,575,622** | **3,219,322,326** |

ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති, 1971 අංක 38 දරන මූල්‍ය පනත සහ 1966 අංක 37 දරන ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථා පනත සමඟ අනුකූල වන පරිදි මෙම මූල්‍ය ප්‍රකාශ සකස් කර ඇති බව මුදල් අධ්‍යක්ෂ සහතික කරයි.

.................................
ලලිත් හෙට්ටිගේ මහතා - අධ්‍යක්ෂ - මුදල්     දිනය : 2015.04.28

මෙම මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීම සහ ඉදිරිපත් කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය වගකිව යුතු වේ. මෙම මූල්‍ය ප්‍රකාශ 2015 අප්‍රේල් මස 06 වෙනි දින අධ්‍යක්ෂ මණ්ඩලය අනුමත කරන ලදී.

.................................     .................................
නන්ද මුරුත්තෙට්ටුවේගම - සභාපති     අධ්‍යක්ෂ මණ්ඩලය
දිනය :     දිනය :

පිටු 05 සිට 25 දක්වා ඇති වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනයන්හි අනුකලන කොටසක් සම්පාදනය කරයි.

**ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාව**
**විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය**

**(සියලුම මුදල් ප්‍රමාණයන් ශ්‍රී ලංකා රුපියල්වලින්)**

| | සටහන | 2014 දෙසැම්බර් 31 | 2013 දෙසැම්බර් 31 |
|---|---|---|---|
| විකුණුම් | 1 | 538,486,063 | 517,749,399 |
| විකුණුම් පිරිවැය | 2 | 393,510,002 | 358,393,871 |
| **දළ ලාභය** | | **144,976,061** | **159,355,528** |
| අනෙකුත් මෙහෙයුම් ආදායම | 3 | 547,241,520 | 442,318,420 |
| බෙදාහැරීමේ පිරිවැය | 4 | 81,066,276 | 61,323,918 |
| අනෙකුත් මෙහෙයුම් වියදම | 5 | 326,026,131 | 363,632,260 |
| පරිපාලන වියදම් | 6 | 326,871,198 | 308,817,113 |
| **මෙහෙයුම් ලාභය** | | **(41,746,024)** | **(132,099,342)** |
| මූල්‍ය පිරිවැය | 7 | 8,883,313 | 7,832,182 |
| **බදු පූර්ව ලාභය** | | **(50,629,337)** | **(139,931,525)** |
| බදු වියදම් | 8 | (20,410,763) | (20,691,814) |
| **බදුවලින් පසු ලාභය** | | **(71,040,100)** | **(160,623,339)** |
| **මුළු විස්තීර්ණ ආදායම** | | **(71,040,100)** | **(160,623,339)** |

**ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාව**
**මුදල් ප්‍රවාහ ප්‍රකාශනය**

**(සියලුම මුදල් ප්‍රමාණයන් ශ්‍රී ලංකා රුපියල්වලින්)**

| | සටහන | ප්‍රකාශිත ප්‍රාග්ධනය | ප්‍රාග්ධන සංචිතය | ප්‍රත්‍යාගණන සංචිත | | රඳවාගත් ඉපැයුම් | එකතුව |
|---|---|---|---|---|---|---|---|
| 2013 ජනවාරි 01 වෙනි දිනට ශේෂය | | 307,386,085 | - | 14,421,999 | - | (75,806,365) | 246,001,719 |
| **විස්තීර්ණ ආදායම** | | | | | | | |
| වසර සඳහා විස්තීර්ණ ආදායම | | - | - | - | - | (160,623,339) | (160,623,339) |
| ආදායම් සංචිත ගැලපීම - 2013 | | - | - | - | - | 17,138,355 | 17,138,355 |
| **2013 දෙසැම්බර් 31 වෙනි දිනට ශේෂය** | | **307,386,085** | **-** | **14,421,999** | **-** | **(219,291,349)** | **102,516,735** |
| **විස්තීර්ණ ආදායම** | | | | | | | |
| කාලසීමාව සඳහා විස්තීර්ණ ආදායම | | - | - | - | - | (71,040,100) | (71,040,100) |
| **2014 දෙසැම්බර් 31 වෙනි දිනට ශේෂය** | | **307,386,085** | **-** | **14,421,999** | **-** | **(290,331,449)** | **31,476,635** |

**ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාව**
**ස්කන්ධය වෙනස් වීමේ ප්‍රකාශනය**

**(සියලුම මුදල් ප්‍රමාණයන් ශ්‍රී ලංකා රුපියල්වලින්)**

| **2013 දෙසැම්බර් 31 වෙනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා** | **2014** | |
|---|---|---|
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් මුදල් ප්‍රවාහය** | | |
| බදු සහ පොලීවලට පෙර ශුද්ධ ලාභය | | (50,629,337) |
| | | |
| **පහත සඳහන් දෑ සඳහා ගැලපුම් :** | | |
| රජයේ ප්‍රදානයේ ක්‍රමක්ෂය | (62,272,581) | |
| ත්‍රිකුණාමල ප්‍රදානයේ ක්‍රමක්ෂය | (177,769,097) | |
| ක්ෂයවීම් | 50,005,060 | |
| ක්ෂයවීම් - ත්‍රිකුණාමලය | 178,531,044 | |
| පාරිතෝෂික සඳහා ප්‍රතිපාදනය | 44,218,603 | |
| බොල් ණය සඳහා ප්‍රතිපාදනය | 2,541,373 | |
| වත්කම් බැහැරකිරීම මත ලාභය/ අලාභය | | |
| විනිමය මත ලාභ/ අලාභ | 170,572 | |
| කල්බදු පොලී | 2,490,894 | |
| අ. සේ. ගා. | 6,273,298 | 44,189,166 |
| | | |
| **කාරක ප්‍රාග්ධන වෙනස්කම්වලට පෙර මෙහෙයුම් ලාභ** | | |
| | | |
| තොග වැඩිවීම/ අඩුවීම | 3,086,233 | |
| වෙළෙඳ සහ අනෙකුත් ලැබිය යුතු දෑ වැඩිවීම/ අඩුවීම | 2,206,428 | |
| මාර්ගස්ථ භාණ්ඩවල වැඩිවීම/ අඩුවීම | (2,053,368) | |
| වෙළෙඳ සහ අනෙකුත් ගෙවිය යුතු දෑ වැඩිවීම/ අඩුවීම | 16,485,451 | |
| මූල්‍ය නොවන බැරකම්වල වැඩිවීම/ අඩුවීම | 11,800,986 | 32,245,730 |
| | | |
| ගෙවන ලද පාරිතෝෂික | | (10,104,537) |
| ගෙවන ලද බදු | | |
| | | |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ශුද්ධ මුදල්** | | |
| **ආයෝජන කටයුතුවලින් මුදල් ප්‍රවාහ** | | |
| රජයේ ප්‍රදානය | 218,002,836 | |
| වත්කම් විකිණීම | | |
| දේපල, පිරියත හා උපකරණ මිලදී ගැනීම | (13,191,090) | |
| කල්බදු කුලිය ගෙවීම | (16,266,392) | |
| සිදුකරමින් පවතින ප්‍රාග්ධන වැඩ | (121,196,219) | 67,349,135 |
| ආයෝජන ක්‍රියාකාරකම් සඳහා භාවිතා කළ ශුද්ධ මුදල් | | |
| | | |
| **ආදායම් සංචිත ගැලපීම** | | |
| මූල්‍ය ක්‍රියාකාරකම්වලින් මුදල් ප්‍රවාහ | | |
| මුදල් හා මුදලට සමාන දෑ ශුද්ධ වැඩිවීම/ අඩුවීම | | 83,050,156 |
| | | |
| කාලසීමාව ආරම්භයේ දී මුදල් හා මුදල් සමාන දෑ | | 18,046,256 |
| | | |
| කාලසීමාව අවසානයේ දී මුදල් හා මුදල් සමාන දෑ | | **101,096,412** |

## මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්

### 1. සාමාන්‍ය තොරතුරු

#### 1.1. වාර්තාකරණ අස්තිත්වය

1966 අංක 37 දරන ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථා පනත යටතේ නිසි පරිදි සංස්ථා ගතකොට ස්ථාපනයකොට ඇති ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාවේ ලියාපදිංචි කාර්යාලය කොළඹ 07 නිදහස් චතුරශ්‍රයේ ඇති අතර එහි ප්‍රධාන ව්‍යාපාරික ස්ථානය කොළඹ 07 නිදහස් චතුරශ්‍රයේ පිහිටා ඇත.

#### 1.2. ප්‍රධාන ක්‍රියාකාරකම් සහ මෙහෙයුම්වල ස්වභාවය

වසර තුළදී සමාගමේ ප්‍රධාන ක්‍රියාකාරකම් වූයේ ගුවන් කාලය විකිණීමයි.

#### 1.3. නිකුත් කිරීම සඳහා බලය පැවරූ දිනය

2014 දෙසැම්බර් 31 න් අවසන් වසර සඳහා ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශ 2015 අප්‍රේල් 06 වන දින අනුමතිය සඳහා ඉදිරිපත් කරන ලදී.

#### 1.4. සේවක සංඛ්‍යාව

වසර අවසානයේදී ස්ථිර සේවක සංඛ්‍යාව 886 කි.
වසර අවසානයේදී කොන්ත්‍රාත් සේවක සංඛ්‍යාව 3 කි.
(2013.12.31 - 891)

### 2. පිළියෙල කිරීමේ පදනම හ ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති යොදාගැනීම

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නිකුත්කර ඇති ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති (ශ්‍රී.ල.ගි.ප්‍ර.) සහ 1995 අංක 19 දරන ශ්‍රී ලංකා ගිණුම්කරණ සහ විගණන ප්‍රමිති පනත ප්‍රකාරව සංස්ථාව සිය මූල්‍ය ප්‍රකාශ සකස්කර ඇත.

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති නව වෙළුමක් නිකුත්කර ඇති අතර 2012 ජනවාරි 01 සිට හෝ ඉන් පසුව ආරම්භ වන වසර සඳහා බලාත්මක වන පරිදි ව්‍යවසායන් මෙම ප්‍රමිති ආදේශ කිරීම අවශ්‍ය කරනු ලබයි. පිටු 05 සිට 25 දක්වා ඇති වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනයන්හි අනුකලන කොටසක් සම්පාදනය කරයි.

### 3. 3. 1. වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සාරාංශය

මෙම මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීමේදී යොදාගත් මූලික ගිණුම්කරණ ප්‍රත්පත්ති පහත විස්තරකොට ඇත. අන්‍යාකාරයෙන් සඳහන්කර ඇත්තේ නම් මිස මෙම ප්‍රතිපත්ති ඉදිරිපත්කර ඇති සියලු වසර සඳහා මෙම ප්‍රතිපත්ති සංගතව ආදේශකර ඇත.

#### 3.1.1. පිළියෙල කිරීමේ පදනම

ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශ පිළියෙලකර ඇත්තේ ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතීන්ට අනුකූලවය. මූල්‍ය ප්‍රකාශන ඓතිහාසික පිරිවැය සහ පසුව පැහැදිළිකොට ඇති අනෙකුත් නිශ්චිත මැනුම් යටතේ පිළියෙලකර ඇත.

මූල්‍ය ප්‍රකාශ කෙරෙහි බලපාන උද්ධමනීය සාධක සඳහා ගැලපීම් සිදුකර නොමැත.

ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතීන්ට අනුකූලව මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීම පිණිස තීරණාත්මක ගිණුම්කරණ ඇස්තමේන්තු භාවිතා කිරීම අවශ්‍ය වේ. එසේම සංස්ථාවේ ගිණුම්කරණ ප්‍රතිපත්ති ආදේශ කිරීමේ ක්‍රියාදාමයේ දී කළමනාකාරිත්වය සිය විනිශ්චය ක්‍රියාවට නැංවීම අවශ්‍ය වේ. මූල්‍ය ප්‍රකාශන කෙරෙහි උපකල්පන සහ ඇස්තමේන්තු වැදගත් වන ක්ෂේත්‍ර සටහන් 4 හි හෙළිදරව්කොට ඇත ඊට වත්කම් සහ බැරකම් වාර්තාකොට ඇති ප්‍රමාණ සහ මූල්‍ය වාර්තාකරණ දිනයට අසම්භාව්‍ය වත්කම් සහ බැරකම් හෙළිදරව් කිරීම සහ වාර්තාකරණ කාලසීමාව තුළ ආදායම සහ වියදම් ප්‍රමාණ පිළිබඳ වාර්තාව අයත් වේ. වත්මන් සිදුවීම් සහ ක්‍රියාමාර්ග පිළිබඳ කළමනාකාරිත්වයේ උපරිම දැනුම මත මෙම ඇස්තමේන්තු පාදක වුවත් අවසානයේ දී තථ්‍ය ප්‍රතිඵල මෙම ඇස්තමේන්තුවලට වඩා වෙනස් විය හැක.

### 3.1.2. අඛණ්ඩ පැවැත්ම

ප්‍රවර්තන ව්‍යාපාරයක් ලෙස අඛණ්ඩව පැවතීමට සමාගමට ඇති හැකියාව පිළිබඳව අධ්‍යක්ෂ මණ්ඩලය ඇගයීමක් සිදුකර ඇති අතර ඈවර කිරීමට හෝ වෙළඳ කටයුතු නැවැත්වීමට ඔවුන් අදහස් නොකරයි.

### 3.1.3. පශ්චාත් ශේෂ පත්‍ර සිදුවීම්

ශේෂ පත්‍ර දිනයට පසුව සිදුවූ සියළු ද්‍රව්‍යමය සිදුවීම් සලකා බලා අවශ්‍ය තැන්හිදී මූල්‍ය ප්‍රකාශනයන්හි ගැලපීම් සිදුකොට හෝ හෙළිදරව් කිරීම් සිදුකර ඇත.

### 3.1.4. සංසන්දනාමත්ක තොරතුරු

සංස්ථාව විසින් සංගතව යොදාගෙන ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති අන්‍යාකාරයෙන් සඳහන් කර ඇත්තේනම් මින පෙර වසරේ ප්‍රතිපත්ති සමග සංගත වේ. ප්‍රවර්තන වසරේ ඉදිරිපත් කිරීම හා අනුකූල වන පරිදි අවශ්‍ය තැන්හි දී පෙර වසරේ සංඛ්‍යා නැවත සකස්කර ඇත. පිටු 05 සිට 25 දක්වා ඇති වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනයන්හි අනුකලන කොටසක් සම්පාදනය කරයි.

### 3.1.5. විදේශ ව්‍යවහාර මුදල්

#### (අ) කෘත්‍යාත්මක සහ ඉදිරිපත්කිරීමේ ව්‍යවහාර මුදල් ඒකකය

සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශනයන්හි ඇතුලත්කර ඇති අයිතම මණිනු ලබන්නේ අස්තිත්වය ක්‍රියාත්මක වන ප්‍රාථමික ආර්ථික පරිසරයේ මුදල් ඒකකය යොදා ගනිමිනි (කෘත්‍යාත්මක මුදල් ඒකකය). මෙම මූල්‍ය ප්‍රකාශ ඉදිරිපත් කරනු ලැබ ඇත්තේ සංස්ථාවේ කෘත්‍යාත්මක සහ ඉදිරිපත් කිරීමේ මුදල් ඒකකය වන ශ්‍රී ලංකා රුපියල්වලිනි.

#### (ආ) විදේශ ව්‍යවහාර මුදල් ගනුදෙනු සහ ශේෂය

විදේශ ව්‍යවහාර මුදල් ගනුදෙනු, ගනුදෙනුව සිදුකළ දිනයන්හි දී පැවති විනිමය අනුපාතය හෝ අයිතම මනිනු අවස්ථාවන්හි දී වටිනාකම යොදාගනිමින් කෘත්‍යාත්මක මුදල් ඒකකයට පරිවර්තනය කරනු ලැබේ. එබඳු ගනුදෙනු බේරුම් කිරීමේ ප්‍රතිඵලයක් ලෙස සහ විදේශ මුදලින් අභිධානකර ඇති මූල්‍ය වත්කම් සහ බැරකම් වසර අවසාන විනිමය අනුපාතයන්ට පරිවර්තනය කිරීමේ දී ඇතිවන විදේශ විනිමය ලාභ හෝ අලාභ ආදායම් ප්‍රකාශයේ පිළිගනු ලැබේ.

## 3.2. අනෙකුත් වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති

### 3.2.1. වත්කම් සහ ඒවායේ මැණීමේ පදනම

ශේෂ පත්‍රයේ ජංගම වත්කම් ලෙස වර්ගීකරණය ඇති වත්කම් වනුයේ මුදල් සහ සංස්ථාවේ ව්‍යාපාරික කටයුතුවල සමාන්‍ය මෙහෙයුම් චක්‍රය තුල හෝ ශේෂ පත්‍ර දිනයේ සිට වසරක් තුළ යන දෙකින් වඩා කෙටි කාලසීමාව තුළ මුදලින් උපලබ්ධිවීමට අපේක්ෂිත දෑ වේ. ජංගම වත්කම් හැර අනෙකුත් වත්කම් වනුයේ ශේෂ පත්‍ර දිනයේ සිට එක් වසරක කාලසීමාවක් ඉක්මවා රඳවා ගැනීමට සංස්ථාව අදහස් කරන වත්කම් වේ.

#### 3.2.1.1. දේපල, පිරියත හා උපකරණ

ඉඩම් සහ ගොඩනැගිලි සමන්විත වනුයේ මූලිකවම ප්‍රධාන කාර්යාලය, ප්‍රාදේශීය සහ සම්ප්‍රේෂණ මධ්‍යස්ථානවලිනි. සියලු දේපල, පිරියත හා උපකරණ ඓතිහාසික පිරිවැයට ප්‍රකාශ කරනු ලැබ ඇත. දේපල පිරියත හා උපරකණවල පිරිවැය යනු අත්කර ගැනීමේ හෝ ඉදිකිරීමේ පිරිවැය සමගින් අපේක්ෂිත පරමාර්ථය සඳහා අදාළ වත්කම වැඩ කරන තත්වයට ගෙන ඒම සඳහා දැරීමට සිදුවන ආනුෂංගික වියදම් ද වේ. වත්කම්වල ඉපැයුම් ධාරිතාවය දිගමට පවත්වාගනු හෝ ඉහළ නැංවීම පිණිස ස්ථිර ස්වභාවයේ වත්කම් අත්කර ගැනීම, ව්‍යාප්ත කිරීම හෝ වැඩි දියුණු කිරීම සඳහා දරන ලද ප්‍රාග්ධන වියදම් ලෙස සලකනු ලැබේ. අනෙකුත් තදනන්තර පිරිවැය වත්කමේ ධාරණ අගයට ඇතුලත් කරනු ලබන්නේ හෝ වෙනම වත්කමක් ලෙස පිළිගනු ලබන්නේ එම අයිතමය තුළ අන්තර්ගත අනාගත ආර්ථික ප්‍රතිලාභ සමාගමට ගලාඒමට හැකියාවක් ඇත්නම් සහ අයිතමයේ පිරිවැය විශ්වාසනීය ලෙස මැණිය හැකිනම් පමණි.

#### 3.2.1.2. ප්‍රතිසංස්කරණ පිරිවැය

ආරම්භයේ දී තක්සේරු කරනු ලැබූ කාර්යසාධන ප්‍රමිතියෙන් අපේක්ෂා කළ අනාගත ආර්ථික ප්‍රතිලාභ යථා තත්ත්වයට පැමිණවීම හෝ පවත්වාගෙන යාම පිණිස දේපල, පිරියත සහ උපකරණ අලුත්වැඩියා කිරීමට හෝ නඩත්තු කිරීමට දරන ලද වියදම, එලෙස වියදම දැරූ අවස්ථාවේ වියදමක් ලෙස පිළිගනු ලැබේ. පිටු 05 සිට 25 දක්වා ඇති වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනයන්හි අනුකලන කොටසක් සම්පාදනය කරයි.

#### 3.2.1.3. ක්‍ෂයවීම

ඉඩම් ක්ෂය කරනු නොලැබේ. ක්‍ෂයවීම් සඳහා ප්‍රතිපාදනය ගණනයකර ඇත්තේ සියලු දේපල, පිරියත සහ උපකරණවල පිරිවැය හෝ තක්සේරුව මත සරල රේඛීය පදනම යොදා ගනිමිනි.

මේ සඳහා යොදාගත් ප්‍රධාන වාර්ෂික අනුපාත වනුයේ,

| | |
|---|---|
| ගොඩනැගිලි | 2.5% |
| පිරියත හා යන්ත්‍රසූත්‍ර | 7.5% |
| ශ්‍රව්‍ය සංඛ්‍යාන උපකරණ | 7.5% |
| ගෘහ භාණ්ඩ,සවිකිරීම් සහ උපකරණ | 10% |
| සම්ප්‍රේෂක | 7.5% |
| රථ වාහන | 25% |
| සංගීත භාණ්ඩ | 10% |
| පරිගණක උපකරණ | 50% |
| පටිගත කිරීමේ | 33.33% |
| සුළු උපකරණ | 50% |

සෑම වාර්තාකරණ කාලසීමාවක් අවසානයේදීම, උචිත නම් වත්කමේ අවශිෂ්ඨ වටිනාකම් ප්‍රයෝජ්‍ය ආයු කාල සහ ක්ෂයකිරීමේ ක්‍රමවේදය සමාලෝචනයකොට ගලපනු ලැබේ.

වත්කමක ධාරණ මුදල එහි ඇස්තමේන්තුගත අයකර ගත හැකි මුදලට වඩා වැඩි වන්නේ නම්, එය වහාම එහි අයකරගත හැකි මුදලට පොත් කරනු ලැබේ.

දේපල, පිරියත හා උපකරණ බැහැර කිරීම මත ලාභය හෝ අලාභය නිශ්චය කරනු ලබන්නේ ඒවායේ ධාරණ වටිනාකමට සාපේක්ෂව වන අතර මෙහෙයුම් ලාභය නිශ්චය කිරීමේ දී සැලකිල්ලට ගනු ලැබේ. ප්‍රත්‍යාගණනය කරන ලද විකුණනු ලබනවිට දී, අනෙකුත් සංචිතවල ඇතුලත් කර ඇති වටිනාකම් රඳවාගත් ඉපැයුම්වලට මාරුකරනු ලැබේ.

### 3.2.2. නොනිමි ප්‍රාග්ධන වැඩ

නොනිමි ප්‍රාග්ධන වැඩ යනු වත්කමක් ඉදිකිරීමකට සෘජුවම ආශ්‍රිත ද්‍රව්‍යමය පිරිවැය සහ අනෙකුත් පිරිවැය වේ. නොනිමි වැඩ එය සාරනුකූලව සම්පූර්ණ කරනු ලැබූවිට දී සහ එහි අපේක්ෂිත භාවිතය සඳහා සූදානම්විට දී අදාළ වත්කම් ගිණුම්වලට මාරුකරනු ලැබේ. පිටු 05 සිට 25 දක්වා ඇති වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනයන්හි අනුකලන කොටසක් සම්පාදනය කරයි.

### 3.2.3 මූල්‍ය වත්කම්

#### 3.2.3.1. වර්ගීකරණය

#### 3.2.3.2. ණය සහ ලැබිය යුතු දෑ

ණය සහ ලැබිය යුතු දෑ සක්‍රීය වෙළෙඳපොළක මිල ගණන් ඉදිරිපත් කර නොමැති ස්ථාවර සහ නිශ්චයනීය ගෙවීම් සහිත ව්‍යුත්පන්න නොවන මූල්‍ය වත්කම් වේ. වාර්තාකරණ කාලසීමාව අවසානයේදී මාස 12 කට වඩා වැඩි කල්පිරීම් සඳහා හැරුණු විට, ඒවා ජංගම වත්කම්හි ඇතුලත් කරනු ලැබේ. මේවා ජංගම නොවන වත්කම් ලෙස වර්ගීකරණය කරනු ලැබේ. සමාගමේ ණය සහ ලැබිය යුතු දෑ ශේෂ පත්‍රයේ ''වෙළඳ සහ අනෙකුත් ලැබිය යුතු දේ සහ මුදල් සහ මුදලට සමාන දේවලින්'' සමන්විත වේ. (සටහන් 3.8 සහ 3.9)

#### 3.2.3.3. අලෙවියට තිබෙන මූල්‍ය වත්කම්

අලෙවියට තිබෙන මූල්‍ය වත්කම් වන්නේ මේ කාණ්ඩයේ නිශ්චය කරනු ලැබ ඇති හෝ වෙනත් කාණ්ඩ කිසිවක වර්ගීකරණය වී නැති ව්‍යුත්පන්න නොවන ඒවාය. වාර්තාකිරීමේ කාලසීමාව අවසානයේ දී මාස 12ක් ඇතුළත ආයෝජනය කල් පිරෙන්නේ නම් හෝ ඒ කාලය තුළ එය බැහැර කිරීමට ක්‍රියාමාර්ග ගැනීම අදහස් කරන්නේ නම් මිස ඒවා ජංගම නොවන වත්කම්වලට ඇතුළත් කරනු ලැබේ.

#### 3.2.3.4. පිළිගැනීම සහ මැනීම

ලාභ හෝ පාඩු හරහා සාධාරණ වටිනාකමට දැක්වෙන මූල්‍ය වත්කම් ආරම්භයේ දී සාධාරණ වටිනාකමට පිළිගනු ලබන අතර ගනුදෙනු පිරිවැය ආදායම් ප්‍රකාශනයේ වියදමක් ලෙස හිලව්කොට දක්වනු ලැබේ. ආයෝජනවලින් මුදල් ප්‍රවාහ ලැබීමේ අයිතිය

අවසන් වී ඇතිවිට දී හෝ හිමිකාරිත්වයේ සියලු අවදානම් සහ පරිදාන සැලකිය යුතු ලෙස පවරනු ලැබ ඇතිවිට දී මූල්‍ය වත්කම් පිළිගැනීම අවසන් කරනු ලැබේ. අලෙවියට තිබෙන මූල්‍ය වත්කම් සහ ලාභ හෝ අලාභ හරහා සාධාරණ වටිනාකමට දක්වා ඇති මූල්‍ය වත්කම් තදනන්තරව සාධාරණ වටිනාකමට දක්වනු ලැබේ. සඵල පොළී ක්‍රමවේදය භාවිතා කරමින් ණය සහ ලැබිය යුතු දෑ තදනන්තරව ක්‍රමක්ෂිත මිලට දක්වනු ලැබේ.

''ලාභ හෝ අලාභ හරහා සාධාරණ වටිනාකමට දක්වා ඇති මූල්‍ය වත්කම්'' කාණ්ඩයේ සාධාරණ වටිනාකමේ වෙනස්වීම්වලින් මතුවන ලාභහෝ අලාභ ඒවා මතුවන කාලසීමාව තුළ 'අනෙකුත් (අලාභ)/ලාභ - ශුද්ධ'' හි ආදායම් ප්‍රකාශයේ ඉදිරිපත් කරනු ලැබේ.

අලෙවියට තිබෙන මූල්‍ය වත්කම් වර්ගීකරණය කර ඇති මුදල් හො මුදල් නොවන සුරැකුම්පත්වල සාධාරණ වටිනාකමේ වෙනස්වීම් අනෙකුත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශයේ පිළිගනු ලැබේ. අලෙවියට තිබෙන ලෙස වර්ගීකරණය කර ඇති සුරැකුම්පත් විකුණනු ලබන විටදීහෝ හානි වූ විටදී, ස්කන්ධයේ පිළිගනු ලබන සමුච්චිත සාධාරණ වටිනාකමේ ගැලපීම් 'ආයෝජන සුරැකුම්පත්වලින් ලාභ හෝ අලාභ' ලෙස ආදායම් ප්‍රකාශයේ ඇතුළත් කරනු ලැබේ. සඵල පොළී ක්‍රමවේදය භාවිතා කරමින් ගණනය කරනු ලබන අලෙවියට තිබෙන සුරැකුම්පත් මත පොළිය අනෙකුත් ආදායමේ කොටසක් ලෙස ආදායම් ප්‍රකාශයේ පිළිගනු ලැබේ.

**3.2.3.5. මූල්‍ය වත්කම් හානි**

**(අ) ක්‍රමක්ෂිත පිරිවැයට දැක්වෙන වත්කම්**

සෑම වාර්තාකරණ කාලසීමාවක් අවසානයේදී ම මූල්‍ය වත්කමක් හෝ මූල්‍ය වත්කම් සමූහයක් හානිවීමේ වාස්තවික සාක්ෂි ඇත්දැයි සමාගම තක්සේරු කරයි. මූල්‍ය වත්කමක් හෝ මූල්‍ය වත්කම් සමූහයක් හානිවී, හානි අලාභ දැරීමට සිදුවනුයේ වත්කම් ආරම්භක පිළිගැනීමෙන් පසුව සිදුවන තනි හෝ බොහෝ සිද්ධීන් හි (හානි සිද්ධියක්) ප්‍රතිඵලයක් ලෙස හානියක් සිදුව ඇති බවට වාස්තවික සාක්ෂි ඇත්නම් සහ එම හානි සිද්ධිය (හෝ සිද්ධි) මූල්‍ය වත්කමෙහි හෝ මූල්‍ය වත්කම් සමූහයෙහි ඇස්තමේන්තුගත අනාගත මුදල් ප්‍රවාහයන්ට විශ්වාසනීය ලෙස මිණිය හැකි බලපෑමක් ඇති කරන්නේ නම් පමණි.

ණය හිමියෝ හෝ ණය හිමියන් සමූහයක් සැළකිය යුතු මූල්‍ය දුෂ්කරතා අත්විඳින බවට වන ඇඟවීම්, ඔවුන් වස්තු භංගත්වයට හෝ වෙනත් මූල්‍ය ප්‍රතිසංවිධානයක් සඳහා එළඹීමේ සම්භාවිතාව සහ පැහැර හැරීම් හා සහසම්බන්ධ වන හිඟ මුදල් වෙනස්කම් හෝ ආර්ථික තත්ත්වයන් බඳු ඇස්තමේන්තුගත අනාගත මුදල් ප්‍රවාහයන්හි මිණිය හැකි අඩුවීමක් තිබෙන බවට නිරීක්ෂණය කළ හැකි දත්ත පෙන්නුම් කිරීම ආදිය හානි පිළිබඳ සාක්ෂිවලට ඇතුළත් විය හැක.

''ණය සහ ලැබිය යුතු දේ කාණ්ඩය සඳහා, හානියේ ප්‍රමාණය මණිනු ලබනුයේ වත්කමෙහි ධාරණ මුදල සහ මූල්‍ය වත්කමෙහි මුල් සඵල පොළී අනුපාතයට වට්ටම් කරන ලද ඇස්තමේන්තුගත අනාගත මුදල් ප්‍රවාහයන්හි (දැරීමට සිදුව නොමැති අනාගත ණය අලාභ හැර) වත්මන් වටිනාකම අතර වෙනස ලෙසයි. ඒකාබද්ධ ආදායම් ප්‍රකාශයේ වත්කමෙහි ධාරණ මුදල අඩුකර අලාභයේ ප්‍රමාණය පිළිගනු ලැබේ. යම් ණයක හෝ කල්පිරීම දක්වා රඳවාගත් ආයෝජනයක විචල්‍ය ණය අනුපාතයක් තිබේනම්, කිසියම්

හානි අලාභ මැනීම සඳහා වට්ටම් අනුපාතය වනුයේ ගිවිසුම යටතේ නිශ්චය කර ඇති වත්මනෙහි ක්‍රියාත්මක පොළී අනුපාතයයි. ප්‍රායෝගික ක්‍රියාමාර්ගයක් ලෙස, නිරීක්ෂණය කළ හැකි වෙළඳපොල මිලක් යොදාගනිමින් සාධන පත්‍රයක සාධාරණ වටිනාකම පාදකව සංස්ථාව හානිය මැනීමට ඉඩ තිබේ.

තදනන්තර කාල සීමාවක දී, හානියේ අලාභයේ ප්‍රමාණය අඩුවී එම අඩුවීම හානිවීම පිළිගැනීමෙන් පසු සිදුවූ සිද්ධියකට වාස්තවිකව සම්බන්ධ වන්නේ නම් (ණය හිමියාගේ ණය ප්‍රමාණකිරීම වැඩි දියුණුවීමක් බඳු), කලින් පිළිගත් හානිවීමේ අලාභය ප්‍රතිවර්තනය ආදායම් ප්‍රකාශයෙහි පිළිගනු ලැබේ.

### 3.2.5.6. වෙළඳ ලැබිය යුතු දෑ

වෙළඳ ලැබිය යුතු දෑ අපේක්ෂිත උපලබ්ධිකළ හැකි වටිනාකමට දක්වනු ලැබේ. ලැබිය යුතු දෑ පිළිබඳ මුල් නියමයන් ප්‍රකාරව අයවිය යුතු සියලු මුදල් ප්‍රමාණ සංස්ථාවට එකතු කර ගැනීමට නොහැකි විය හැකි බවට වාස්තවික සාක්ෂි ඇතිවිට දී වෙළඳ අයවිය යුතු දේවල හානිවීම සඳහා ප්‍රතිපාදනයක් ස්ථාපිත කෙරේ. ණය ගැතියා මුහුණදෙන සැලකිය යුතු මූල්‍ය දුෂ්කරතා, ණයගැතියා බුන්වත් බවට පත්වීම හෝ මූල්‍ය ප්‍රතිසංවිධානය සඳහා ඇති ඉඩකඩ ආදිය වෙළෙඳ ලැබිය යුතු දෑ දුර්වල වී ඇති බවට දර්ශකයක් වශයෙන් සලකනු ලැබේ. දීමනා ගිණුමක් භාවිතා කිරීම මගින් වත්කමේ ධාරණ වියදම අඩුකරනු ලබන අතර විස්තීරණ ආදායම් ප්‍රකාශයේ බෙදාහැරීමේ පිරිවැය තුළ පාඩු මුදල පිළිග නු ලැබේ. වෙළඳ ලැබීමක් එකතු කරගත නොහැකි වනවිට ලැබිය යුතු වෙළෙඳ මුදල් සඳහා දීමනා ගිණුමෙන් එය කපා හරිනු ලැබේ. කලින් කපා හරින ලද මුදල් පසුව එකතු කරගැනීම් විස්තීරණ ආදායම් ප්‍රකාශයේ බෙදා හැරීමේ පිරිවැයට බාරකරනු ලැබේ.

වෙළෙඳ ලැබිය යුතු දෑ ආරම්භයේ දී සාධාරණ අගයට පිළිගනු ලබන අතර ඉන්පසුව ඒවා හානිවීම සදහා වන ප්‍රතිපාදන අඩු කිරීමෙන් පසු සඵල පොළී ක්‍රමවේදය භාවිතා කරමින් ක්‍රමක්ෂිත පිරිවැයට මණිනු ලැබේ.

### 3.2.6. තොග

වට්ටෝරු භාණ්ඩ ප්‍රකාශකර ඇත්තේ වඩා අඩු පිරිවැයට හෝ ශුද්ධ උපලබ්ධි කළ අගයටය. ශුද්ධ උපලබ්ධි කළ අගය යනු සාමාන්‍ය ව්‍යාපාරික ඇස්තමේන්තුගත සම්පූර්ණ කිරීමේ සහ විකුණුම් වියදම් අඩුකිරීමෙන් පසු ඇස්තමේන්තුගත විකුණුම් මිලය.

### 3.2.7. මුදල් හා මුදලට සමාන දෑ

මුදල් ප්‍රවාහ පිළිබඳ ඒකාබද්ධ ප්‍රකාශයන්හි, මුදල් හා මුදලට සමාන දෑට අතැති මුදල්, බැංකුවල ඇති ඉල්ලුම් තැන්පතු මාස තුනක් හෝ ඊට අඩු මූලික කල්පිරීමක් සහිත අනෙකුත් කෙටිකාලීන ඉහළ ද්‍රවශීලතාවක් ඇති ආයෝජන සහ බැංකු අයිරා අයත් වේ. මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශයේ බැංකු අයිරා පෙන්නුම් කරනු ලබන්නේ ජංගම වගකීම් තුළ ණය ගැනුම් ලෙස ය.

### 3.2.8. ණය ගැනුම් පිරිවැය

ඒවායේ අපේක්ෂිත භාවිතයට හෝ විකිණීමට සූදානම් කිරීම සඳහා අවශ්‍යයෙන්ම සැළකියයුතු කාලසීමාවක් ගන්නා වූ වත්කම් වන සුදුසුකම් ලබන වත්කම් අත්පත් කරගැනීම, ඉදිකිරීම හෝ නිෂ්පාදනය වෙත් සෘජුවම ආරෝපණය සාමාන්‍ය හෝ නිශ්චිත ණය ගැනුම් පිරිවැය,

එකී වත්කම් ඒවායේ අපේක්ෂිත භාවිතයට හෝ විකිණීමට සාරනුකූලව සූදානම් කරන කාලය තෙක් එම වත්කම්වලට පිරිවැයට එකතු කරනු ලැබේ.

නිශ්චිත ණය ගැනුම්හි තාවකාලික අයෝජන මත උපයනු ලැබූ ආයෝජන ආදායම, සුදුසුකම් ලබන වත්කම් මත ඒවායේ වියදම තීරණය කරන තෙක් ප්‍රාග්ධනීකරණය සඳහා සුදුසුකම් ඇති ණය ගැනුම් පිරිවැයෙන් අඩුකරනු ලැබේ.

අනෙකුත් සියලු ණය ගැනීමේ පිරිවැය ඒවා දරන ලද කාලසීමාව තුළ ලාභ හෝ අලාභයන් හි පිළිගනු ලැබේ.

### 3.2.9. ජංගම සහ විලම්භිත බදු

මෙම කාලසීමාව තුළ බදු වියදම් සමන්විත වන්නේ ජංගම සහ විලම්භිත බදුවලිනි. ආදායම් ප්‍රකාශය තුල බදු පිළිගනු ලබන්නේ අනෙකුතු විස්තීරණ ආදායම්වල හෝ කෙළින්ම කොටස්වල ගණන් ගනු ලබන අයිතමවලට ඒවා අදාළ වන ප්‍රමාණයට හැර ඉතිරි ප්‍රමාණයටය. මෙහිකී පිළිවෙලින් අනෙකුත් විස්තීරණ ආදායම්වල හෝ කෙළින්ම කොටස්වල ද බදු ගණන් ගැනේ.

**අ ජංගම බදුකරණය**

2006 අංක 10 දරන දේශීය ආදායම් පනතේ සහ එහි සංශෝධනවල විධිවිධාන අනුව සමාගමට ජංගම බදු බැරකම් ඇතිවේ. සැබෑ බැරකම් පිළිබිඹු කරන්නක් වශයෙන් කළමනාකාරිත්වය විශ්වාස කරන යතෝක්ත ප්‍රතිපාදන යොදා ගනිමින් මූල්‍ය ප්‍රකාශවල මේ බැරකම් සඳහා ප්‍රතිපාදන සපයනු ලැබේ. ගනුදෙනු පිළිබඳව සංස්ථාව විසින් ගනු ලැබූ ස්ථාවරය අදායම් අධිකාරීන් විසින් අභියෝගයට ලක් කරන අවස්ථා තිබිය හැක. මෙම කරුණු නිසා ඇතිවන කවර හෝ අතිරේක පිරිවැයක් සංස්ථාව මත බැරකම තහවුරු කරන අවස්ථාවේ බදු වියදමක් ලෙස ගිණුම් ගත කරනු ලැබේ.

ප්‍රවර්තන වසර සහ පෙර කාල සීමාවන් සඳහා ජංගම බදු වත්කම් සහ බැරකම් මණිනු ලබන්නේ ආදායම් අධිකාරියට ආපසු අයකර ගැනීමට හෝ ගෙවීමට අපේක්ෂා කරන ප්‍රමාණයන්ගෙනි. ප්‍රමාණය ගණනය කිරීම සඳහා භාවිතා කළ බදු අනුපාත හෝ බදු නීති වනුයේ ශේෂ පත්‍ර දින වනවිට පනවනු ලබන හෝ සත්තාවීව පනවනු ලබන ඒවා ය. ජංගම බදු සඳහා ප්‍රතිපාදන පදනම් වනුයේ මූල්‍ය ප්‍රකාශනයන්හි වාර්තාකර ඇති පරිදි ආදායම් සහ වියදම් අංග පදනම්ව ය.

**ආ විලම්භිත බදුකරණය**

වත්කම් සහ බැරකම්වල බදු පදනම සහ මූල්‍ය වාර්තාකරණ කාර්යයන් සඳහා ඒවායේ ධාරණ වටිනාකම අතර ශේෂපත්‍ර දිනට ඇති තාවකාලික වෙනස්කම් මත බැරකම් ක්‍රම වේදය භාවිතා කරමින් විලම්භිත බදු පිළිගනු ලැබේ. ව්‍යාපාර සංයෝජනයක් නොවන සහ ගිණුම්කරණයට හෝ බදු අයකළ හැකි ලාභයට බලනොපාන ගනුදෙනුවක දී වත්කම් සහ බැරකම් ආරම්භක පිළිගැනීමෙන් මතුවන තාවකාලික වෙනස්කම් සහ පූර්වේක්ෂිත අනාගතයේ ප්‍රතිවර්තනය නොවීමට ඉඩ ඇති ප්‍රමාණයට අයෝජන ආශ්‍රිත වෙනසකම් සඳහා විලම්භිත බදු බැරකම් පිළිගනු නොලැබේ. ඊට අමතරව, කීර්තිනාමය ආරම්භක පිළිගැනීම මත මතුවන බදු අයකළ හැකි තාවකාලික වෙනස්කම් සඳහා ද විලම්භිත බදු බැරකම් පිළිගනු නොලැබේ. වාර්තාකරණ දිනය වනවිට පනවා ඇති හෝ සත්තාවීව පැනවීමට ඉඩ ඇති නීති මත පදනම්ව තාවකාලික වෙනස්කම් ප්‍රතිවර්තනය

වනවිට දී යොදා ගැනීමට අපේක්ෂා කරන ලබන බදු අනුපාතයන්ට විලම්භිත බදු ගණනය කෙරේ. ජංගම බදු බැරකම් සහ වත්කම් හිලව් කිරීම පිණිස නෛතිකව බලාත්මක කළ යුතු හිමිකමක් වේ නම් සහ එම බදු අයකළ හැක අස්තිත්වයට එහ බදු අධිකාරීන් විසින් ම අයකරනු ලබන අදායම් බදුවලට ඒවා අදාළ වන්නේ නම් විලඹිහිත බදු වත්කම් සහ බැරකම් හිලව් කරනු ලැබේ.

විලම්භිත බදු වත්කම් පිළිගනු ලබන්නේ තාවකාලික වෙනසකම් උපයෝජනය සඳහා යොදාගත හැකි අනාගත බදු අයකළ හැකි ලාභ ඇතිවිය හැකිතාක් දුරට පමණි. එක් එක් වාර්තාකරණ දිනයට විලම්භිත බදු වත්කම් සමාලෝචනය කරනු ලබන අතර ආශ්‍රිත බදු ප්‍රතිලාභ උපලබ්ධිවීම තවදුරටත් සිදුනොවිය හැකි ප්‍රමාණයට අඩුකරනු ලැබේ.

## 3.2.10. සේවක ප්‍රතිලාභ

### 3.2.10.1. විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම්

**අ) නිර්වචිත ප්‍රතිලාභ සැලැස්ම - විශ්‍රාම පාරිතෝෂික ප්‍රතිපාදනය**

නිර්වචිත ප්‍රතිලාභ සැලැස්මක් යනු නිර්වචිත දායක සැලැස්මක් හැරුණුකොට පශ්චාත් රැකියා ප්‍රතිලාභ සැලැස්මකි. නිර්වචිත ප්‍රතිලාභ සැලැස්මට අදාළව මූල්‍ය ප්‍රකාශණයේ පිළිගනු ලබන බැරකම වාර්තාකරණ දිනයට නිර්වචිත බැඳීමේ වත්මන් වටිනාකමයි. නිර්වචිත ප්‍රතිලාභ බැඳීමේ වත්මන් වටිනාකම නිර්ණය කරනු ලබන්නේ ඇස්තමේන්තුගත අනාගත මුදල් ගලායාම වට්ටම් කිරීම මගිනි.

ප්‍රතිලාභ ගෙවනු ලබන මුදල් ඒකකයන්හි සහ ආශ්‍රිත බැරකමේ කාල සීමාවන්ට සමීප වන්නා වූ කල්පිරීමේ කාලසීමා සහිත පොළී අනුපාත භාවිතා කරමින් ප්‍රතිලාභ ගෙවනු ලැබේ.

විශ්‍රාමික ප්‍රතිලාභ පිරිවැය පිළිබඳ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 16 (2006 ප්‍රතිශෝධිත) අනුකූල වන පරිදි සියලු ස්ථිර සේවකයන් සඳහා සේවයේ පළමු වසර සම්පූරණ කිරීමේ සිට විශ්‍රාමික පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන සලසා ඇත. කෙසේ වෙතත්, 1983 අංක 12 දරන පාරිතෝෂික ගෙවීම් පනත සමග සේවකයකු සඳහා වන වගකීම ඇති වනුයේ පස් වසරක අඛණ්ඩ සේවා කාලයක් සම්පූර්ණ කිරීමේ දී පමණි. බැරකම් සඳහා බාහිරින් අරමුදල් සපයනු නොලැබේ.

මෙම බැරකම සඳහා බාහිරින් අරමුදල් සපයනු නොලැබේ. ආයුගණකගේ ප්‍රධාන උපකල්පනයන්ට පහත දෑ ඇතුළත් වේ.

01. පොළී අනුපාතය 11%
02. වැටුප් වර්ධක අනුපාතය 5%
03. සියලු සේවකයන්ගේ විශ්‍රාම ගන්නා වයස අවුරුදු 60

ආ) **නිර්වචිත දායක සැලසුම් සේවක අර්ථසාධක අරමුදල සහ සේවක භාරකාර අරමුදල**

සේවක අර්ථසාධක අරමුදලේ සහ සේවක භාරකාර අරමුදලේ දායක මුදල් සඳහා හිමිකම් ලබා ඇති සියලුම සේවකයන් ඒ ඒ ප්‍රඥප්ති සහ රෙගුලාසි ප්‍රකාරව අදාළ දායක අරමුදල්වලින් ආවරණය කෙරේ. නිර්වචිත දායක සැලසුම් සඳහා දායක මුදල් දරන ලදවිට දී ආදායම් ප්‍රකාශයේ වියදමක් ලෙස හඳුනා ගැනේ.

**3.2.11. රජයේ ප්‍රදාන**

ප්‍රදානයට අදාළ කොන්දේසිවලට සමාගම අනුකූල වන බවට සහ ප්‍රදානය ලැබෙන බවට සාධාරණ සහතිකයක් ඇත්නම් රජයේ ප්‍රදාන ඒවායේ සාධාරණ වටිනාකමට පිළිගනු ලැබේ.

පිරිවැයට අදාළ රජයේ ප්‍රදාන විලම්භනය කරනු ලබන අතර හානිපූරණය කිරීමට අපේක්ෂා කරන පිරිවැය සමග ඒවා ගැලපීම පිණිස අවශ්‍ය කාලසීමාව පුරා විස්තීරණ ආදායම් ප්‍රකාශයේ පිළිගනු ලැබේ.

දේපල, පිරියත සහ උපකරණ සහ ජීව විද්‍යාත්මක වත්කම්වලට අදාළ ප්‍රදාන විලම්භිත ආදායමක් ලෙස ජංගම නොවන වගකීම්වල ඇතුලත් කරනු ලබන අතර ආශ්‍රිත වත්කම්වල අපේක්ෂිත ආයුකාලය පුරා සරල රේඛීය පදනමක් මත ආදායම් ප්‍රකාශයට බැර කරනු ලැබේ.

**3.2.12. ප්‍රතිපාදන**

අතීත සිදුවීමක ප්‍රතිඵලයක් ලෙස වත්මන් නෛතික හෝ සම්මුතික බැඳීමක් සංස්ථාව සතුවීටදී, එම බැඳීම පියවීම සඳහා ආර්ථික ප්‍රතිලාභ මූර්තිමත් කරමින් සම්පත් ගලා යැමක් අවශ්‍යවීම සිදුවිය හැකිවිටක දී සහ බැඳිමේ වටිනාකමට විශ්වාසනීය ඇස්තමේන්තුවක් සිදුකළ හැකිවිට දී ප්‍රතිපාදන හඳුනාගනු ලැබේ.

**3.2.13. අසම්භාව්‍ය බැරකම් සහ අසම්භාව්‍ය වත්කම්**

අසම්භාව්‍ය බැරකමක් යනු සංස්ථාවේ පාලනයෙන් පරිබාහිර වන අවිනිශ්චිත අනාගත සිදුවීම් එකක් හෝ කිහිපයක් හට ගැනීම හෝ හට නොගැනීම මගින් සිය පැවැත්ම සනාථ වන අතීත සිදුවීම්වලින් හෝ එකී බැඳිමෙන් නිදහස් වීම සඳහා සම්පත් බැහැරට ගලා යාමක් සිදුවීම සඳහා සම්පත් බැහැරට ගලා යෑමක් සිදුවීමේ හැකියාවක් නැති නිසා පිළිනොග ැනෙන වර්තමාන බඳීමකින් හෝ පැන නැගීමට හැකියාවක් ඇති බැඳීමකි. විශ්වසනීය ලෙස මැනිය නොහැකි බැරකමක් පවතින බෙහෙවින් දුර්ලභ අවස්ථාවල දී ද බැරකමක් හඳුනා නොගන්නා නමුත් එවැන්නක පැවැත්ම මූල්‍ය ප්‍රකාශවලින් අනාවරණය කරයි.

අසම්භාව්‍ය වත්කමක් යනු සංස්ථාවේ පාලනයෙන් පරිබාහිර අවිනිශ්චිත අනාගත සිදුවීම් එකක් හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හට ගැනීමෙන් සිය පැවැත්ම සනාථ වන අතීත සිදුවීම්වලින් පැන නැගීමට ඉඩ ඇති වත්කමකි. සංස්ථාව අවිනිශ්චිත වත්කම් හඳුනා නොගන්නා නමුත් ආර්ථික ප්‍රතිලාභ ඇතුළට ගලා ඒම් සිදුවිය හැකි වුවත් එය සැබවින්ම ස්ථිර නොවන අවස්ථාවල දී එවැනි දේවල පැවැත්ම අනාවරණය කරයි.

### 3.2.14. වෙළෙඳ ගෙවිය යුතු දෑ

සාමාන්‍ය ව්‍යාපාරික කටයුතුවල දී සැපයුම්කරුවන්ගෙන් ලබාගන්නා ලද භාණ්ඩ හෝ සේවා වෙනුවෙන් ගෙවීම් කිරීමට ඇති බැඳීම් ය. ගෙවීම් කළ යුතු වන්නේ වසරක් තුළ හෝ ඊට අඩු කාලයක් තුළ නම් (හෝ ඊට වඩා කාලය දිගුවේ නම් ව්‍යාපාරයේ සාමාන්‍ය මෙහෙයුම් චක්‍රය තුළ දී) ගෙවිය යුතු ගිණුම් ජංගම බැරකමක් වශයෙන් වර්ගීකරණය කරනු ලැබේ.

වෙළෙඳ ගෙවිය යුතු දෑ ආරම්භයේ දී සාධාරණ අගයට පිළිගනු ලබන අතර ඉන් පසුව සඵල පොළී ක්‍රමවේදය භාවිතා කරමින් ක්‍රමක්ෂිත පිරිවැයට මණිනු ලැබේ.

### 3.2.15. මූල්‍ය කල්බදු බැඳීම්

කල්බදු ගත් අයිතමවල හිමිකමට ආනුෂංගික සියලු අවදානම් සහ ප්‍රතිලාභ සැළකිය යුතු ලෙස සංස්ථාවට පවරන්නා වූ මූල්‍ය කල්බදු මත ලබාගත් දේපල, පිරියත හා උපකරණ කල්බද්ද ආරම්භයේ දී කල්බදු ගත් දේපලේ සාධාරණ වටිනාකමට හෝ වඩා අඩුනම් සමුච්චිත ක්ෂයවීම අඩුකොට ආරම්භයේ දී අවම කල්බදු ගෙවීමේ වටිනාකමේ වර්තමාන අගයට ප්‍රාග්ධනායිත කරනු ලැබේ.

ගෙවිය යුතු මුළු පොළිය අවිනිශ්චිත පොළියක් සේ ගිණුම්ගත කරනු ලැබේ. අනුරූපී ණය බදුදීමනාකරුට ගෙවිය යුතු මුදලක් සේ වාර්තා කරනු ලැබේ. ගෙවන ලද වාරික බැරකම අඩුකිරීම සඳහා යොදා ගනු ලැබේ.

වසර සඳහා අයකරන පොළිය පොළී අවිනිශ්චිත ගිණුමේ සිට ආදායම් ප්‍රකාශනයට මාරු කරනු ලැබේ.

### 3.2.16. ආදායම් ප්‍රකාශනය

#### 3.2.16.1. ආදායම පිළිගැනීම

ලැබුණු හෝ ලැබිය යුතු ප්‍රතිෂ්ඨාවේ සාධාරණ වටිනාකමට අනුව ආදායම ගණන් ගනු ලබන අතර සපයන ලද සේවා සඳහා ලැබිය යුතු මුදල් ප්‍රමාණ පෙන්නුම් කරන අතර වට්ටම් සහ වටිනාකම එකතු කළ බදු අඩුකොට සදහන් කරනු ලැබේ. ආදායම් ප්‍රමාණ විශ්වසනීය ලෙස මැණිය හැකිවිට දී, අනාගත ආර්ථික ප්‍රතිලාභ සංස්ථාව වෙත ප්‍රවාහයවීමට ඉඩ ඇතිවිට දී, සහ සංස්ථාවේ එක් එක් ක්‍රියාකාරකම සඳහා නිශ්චිත නිර්ණායක සපුරා ඇතිවිට දී සංස්ථාව ආදායම පිළිගනියි. පහත විස්තර කර ඇති පරිදි, ගනුදෙනුකාර වර්ගය, ගනුදෙනු වර්ගය සහ එක් එක් සැකසුමේ නිශ්චිත තොරතුරු සැලකිල්ලට ගනිමින් සංස්ථාව සිය ප්‍රතිලාභ ඇස්තමේන්තු ඓතිහාසික ප්‍රතිඵල මත පදනම්කර ගනී.

**(අ) ගුවන් කාලය අලෙවිය**

ආදායම ගුවන් කාලය විකිණීමෙන් සමන්විත වෙයි. වෙළඳ දැන්වීම් ප්‍රචාරය වනවිට දී ගුවන් කාලය විකිණීමේ ආදායම පිළිගනු ලැබේ.

**(ආ) පොළී ආදායම**

එකතුකර ගැනීමට හැකි බව පිළිබඳ සැකයක් ඇත්නම් මිස කාල පදනමින් උපචිත වූ පොළිය ලෙස (වත්කමේ සඵල ඵලදාව සැලකිල්ලට ගනිමින්) පොළී ආදායම පිළිගනු ලැබේ.

(ඇ) **දේපල, පිරියත හා උපකරණ බැහැර කිරීම් මත ශුද්ධ ලාභ සහ අලාභ**

දේපල, පිරියත හා උපකරණ බැහැර කිරීම් මත ශුද්ධ ලාභ සහ අලාභ නිර්ණය කරනු ලබන්නේ ශුද්ධ විකුණුම් මුදල් දේපල, පිරියත හා උපකරණවල ධාරණ වටිනාකම සැසඳීමෙන් වන අතර ආදයම් ප්‍රකාශයේ පිළිගනු ලැබේ.

(ඈ) **වෙනත් ආදායම්**

අනෙකුත් සියලු ආදායම් පිළිගනු ලබන්නේ උපචිත පදනමක් මතය.

**3.2.17.1. වියදම් පිළිගැනුම**

අ) **මෙහෙයුම් වියදම්**

ආදායම් ප්‍රකාශයේ වියදම් පිළිගනු ලබන්නේ දරන ලද පිරිවැය සහ නිශ්චිත ආදායම් අයිතම අතර ඍජු සබඳතා පදනම මතය. ව්‍යාපාරය පවත්වා ගෙන යාමේදී සහ කාර්යක්ෂම තත්ත්වයක් තුළ දේපල, පිරියත සහ උපකරණ නඩත්තු කිරීමේ දී දරනු ලබන සියලු වියදම් වර්ෂයේ ලාභ/පාඩු නිගමනය කිරීමේදී ආදායමෙන් අඩු කරනු ලැබ ඇත. බොල් සහ අඩමාන ණය, දන්නා සියලු බැරකම් සහ දේපල, පිරියත හා උපකරණ මත ක්ෂයවීම සඳහා ද ප්‍රතිපාදන සලසා ඇත.

ආ) **මූල්‍ය වියදම්**

පොළී ආදායම් උපචිත පදනමකින් පිළිගනු ලැබේ. ණයගැනුම් පිරිවැය ඒවා දරන ලද කාලසීමාවේ දී වියදමක් ලෙස පිළිගනු ලැබේ.

**3.2.18. තුලනාත්මක සංඛ්‍යා**

අවශ්‍ය අවස්ථාවල දී ප්‍රවර්තන වර්ෂය තුළ කරනු ලබන ඉදිරිපත් කිරීම්වලට අනුකූල වනු පිණිස තුලනාත්මක සංඛ්‍යා ගලපනු ලැබ ඇත.

**4. තීරණාත්මක ගිණුම්කරණ ඇස්තමේන්තු සහ විනිශ්චයන්**

සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීමේදී ආදායම්, වියදම්, වත්කම් සහ බැරකම්වල වාර්තාකර ඇති සංඛ්‍යා සහ වාර්තාකරණ දිනයට අසම්භාව්‍ය බැරකම් හෙළිදරව් කිරීම කෙරෙහි බලපාන විනිශ්චයන්, ඇස්තමේන්තු සහ උපකල්පන සිදුකිරීමට කළමනාකාරිත්වයට සිදුවේ. කෙසේ වෙතත් මෙම උපකල්පන සහ ඇස්තමේන්තු පිළිබඳ අවිනිශ්චිතතාව, අනාගත කාල සීමාවන්හි සිදුකරනු ලබන වත්කම් හෝ බැරකම්වල ධාරණ වටිනාකමට ද්‍රව්‍යමය වෙනස්කම් අවශ්‍ය කරන්නා වූ ප්‍රතිඵල ඇතිකිරීමට හැක.

විනිශ්චයන්, ඇස්තමේන්තු සහ පාදක වූ ඇස්තමේන්තු ඓතිහාසික අත්දැකීම් සහ අනෙකුත් මූලාශ්‍රයන්ගෙන් පහසුවෙන් හඳුනාගත නොහැකි වත්කම්, බැරකම් සහ අසම්භාව්‍ය බැරකම්වල ධාරණ ප්‍රමාණ පිළිබඳ විනිශ්චයන්, ඇස්තමේන්තු සහ උපකල්පන සිදුකිරීමේ දී පදනම සකස් කරන්නා වූ අවස්ථානුගත තත්වයන් යටතේ සාධාරණයැයි විශ්වාස කරනු ලබන අනෙකුත් විවිධ සාධකවල ප්‍රතිඵල මත පදනම් වී ඇත.

විනිශ්චයන්, ඇස්තමේන්තු සහ පාදක වූ ඇස්තමේන්තු අඛණ්ඩ පදනමකින් සමාලෝචනය කරනු ලැබේ. ගිණුම්කරණ ඇස්තමේන්තු සඳහා ප්‍රතිශෝධන, එකී ප්‍රතිශෝධන වත්මන සහ අනාගත

කාලසීමා සඳහා බලපාන්නේ නම් එම ඇස්තමේන්තු ප්‍රතිශෝධනය කරනු ලබන කාල සීමාවේ දී පිළිග නු ලැබේ. ශ්‍රී ලංකා ගිණුම් ප්‍රමිත යොදා ගැනීමේ දී කළමනාකාරිත්වය විසින් සිදුකරන විනිශ්චයන්, ඇස්තමේන්තු සහ ඇස්තමේන්තු මූල්‍ය ප්‍රකාශ කෙරෙහි සැළකිය යුතු බලපෑමක් ඇති කළ හැක.

**(අ) විශ්‍රාම ප්‍රතිලාභ**

විශ්‍රාම බැඳීම්වල වර්තමාන වටිනාකම උපකල්පන ගණනාවක් භාවිත කරමින් ආයුගණක පදනමක් මත නිර්ණය කරනු ලබන සාධක ගණනාවක් මත රඳා පවතී. විශ්‍රාම වැටුප් සඳහා ශුද්ධ පිරිවැය (ආදායම) නිශ්චය කිරීමේ දී යොදාගනු ලබන උපකල්පනවලට වට්ටම් අනුපාතය ඇතුලත් වේ. මෙම උපකල්පනයන්හි කවර හෝ වෙනසක් විශ්‍රාම වැටුප් බැඳීම්වල ධාරණ මුදල් ප්‍රමාණය කෙරෙහි බලපානු ඇත.

උචිත වට්ටම් අනුපාතය සෑම වසරක් අවසානයේදීම සංස්ථාව නිශ්චය කරනු ලැබේ. විශ්‍රාම වැටුප් බැඳීම් පියවීමට අවශ්‍ය යැයි අපේක්ෂා කරනු ලබන අනාගත මුදල් ගලායාම්හි වර්තමාන වටිනාකම නිශ්චය කිරීම සඳහා භාවිතා කළ යුතු පොළී අනුපාතය වන්නේ මෙයයි. උචිත වට්ටම් අනුපාතය නිශ්චය කිරීමේ දී සංස්ථාව ආයතනික බැඳුම්කරවල පොළී අනුපාත සැලකිල්ලට ගනියි. විශ්‍රාම වැටුප් බැඳීම් අනෙකුත් ප්‍රධාන උපකල්පන වත්මන් වෙළෙඳපොල තත්වයන් මත ද අර්ධ වශයෙන් පාදක වේ.

**(ආ) ආදායම් බදු ආදායම**

සංස්ථාව ආදායම් බදුවලට යටත් වේ. ආදායම් බදු සඳහා ප්‍රතිපාදනය නිශ්චය කිරීමේ දී සැළකිය යුතු විනිශ්චයක් අවශ්‍ය වේ. බොහෝ ගනුදෙනු සහ ගණනය කිරීම් ඇති අතර ඒ සඳහා අවසාන බදු නිශ්චය කිරීම අවිනිශ්චිතය. අතිරේක බදු ලැබීමට නියමිත ද යන්න පිළිබඳ ඇස්තමේන්තු මත පාදකව අපේක්ෂිත බදු විගණන ගැටලු සඳහා සංස්ථාව බැරකම් පිළිගනු ලැබේ. මෙම කරුණුවල අවසාන බදු ප්‍රතිඵලය ආරම්භයේ දී වාර්තා කළ ප්‍රමාණයන්ට වඩා වෙනස්වනවිට දී, එම වෙනස්කම් එවැනි නිශ්චයකිරීම් සිදුකරනු ලැබූ කාලසීමාව තුළ ජංගම සහ විලම්භිත ආදායම් බදු වත්කම් සහ බැරකම් කෙරෙහි බලපානු ඇත.

## 5. මූල්‍ය අවදානම් කළමනාකරණය

### 5.1 මූල්‍ය අවදානම් සාධක

සංස්ථාවේ ක්‍රියාකාරකම් එය මූල්‍ය අවදානම් මිශ්‍රණයකට නිරාවරණය කරයි, වෙළඳපොළ අවදානම, (ව්‍යවහාර මුදල්, සාධාරණ වටිනාකම පොළී අනුපාත අවදානම, මුදල් ප්‍රවාහ පොළී අනුපාත අවදානම සහ මිල අවදානම ඇතුළුව) ණය අවදානම සහ ද්‍රවශීලතා අවදානම ඒ අතර වේ. සංස්ථාවේ සමස්ත ණය කළමනාකරණ වැඩසටහන් සංස්ථාවේ මූල්‍ය කාර්යසාධනය මත අහිතකර බලපෑම් ඇතිකළ හැකි අහිතකර ප්‍රතිඵල අවම කිරීමට ඉලක්කගත වී ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත ප්‍රතිපත්ති යටතේ මූල්‍ය අංශය විසින් අවදානම් කළමනාකරණය සිදුකරනු ලැබේ.

### අ) අවදානම් කළමනාකරණය

#### (i) විදේශ විනිමය අවදානම

සංස්ථාව තමන්ට අවශ්‍ය උපකරණ ජාත්‍යන්තරව ආනයන කරන අතර මූලිකවම ඇමෙරිකානු ඩොලර්වලට අදාළව ව්‍යවහාර මුදල් නිරාවරණයන්ගෙන් මතුවන විදේශ විනිමය අවදානම්වලට නිරාවරණය වේ. අනාගත වාණිජ ගනුදෙනුවලින් සහ පිළිගත් වත්කම් සහ බැරකම්වලින් මතුවන සිය විදේශ විනිමය අවදානම් කළමනාකාරණය කිරීම පිණිස සමාගම දේශීය නියෝජිතයන් සමග ගිවිසුම්වලට එළඹේ.

#### (ii) මිල අවදානම

වෙළෙඳ භාණ්ඩ මිල අවදානමට සංස්ථාව නිරාවරණය වේ. ප්‍රධාන සැපයුම්කරුවන සමග ගිවිසුම්වලට එළඹීම මගින් සංස්ථාව අවදානම් අවම කරයි.

#### (iii) ණය අවදානම්

ණය අවදානමට නිරාවරණය වනුයේ මූලිකවම වෙළඳ ලැබිය යුතු දෑ වලින් වන අතර සේවා සැපයීමට පෙර සිය නව ගනුදෙනුකරුවන් සෑම කෙනෙකුම සඳහාම ණය අවදානම කළමනාකරණය කිරීමේ සහ විශ්ලේෂණය කිරීමේ වගකීම සංස්ථාව සතුය.

ණය අවදානම මතුවනුයේ මුදල් හා මුදලට සමාන දෑ, බැංකු සහ මූල්‍ය ආයතනවල ඇති තැන්පතු මෙන්ම ගනුදෙනුකරුවන්ගේ ලැබිය යුතු දෑ සහ වාණිජ ගනුදෙනු වෙත ණය නිරාවරණයවීම් මගිනි. බැංකු සහ මූල්‍ය ආයතන සඳහා, ස්වාධීනව ශ්‍රේණිගත කරනු ලැබූ  අවම වශයෙන් ‘A’ ශ්‍රේණිගත කිරීම සහිත පාර්ශව පමණක් පිළිගනු ලැබේ. අවදානම් පාලනය ගනුදෙනුකරුගේ මූල්‍ය තත්වය, අතීත අත්දැකීම් සහ අනෙකුත් සාධක සැලකිල්ලට ගනිමින් ණය ගුණත්වය තක්සේරු කරනු ලැබේ. අභ්‍යන්තර හෝ බාහිර ශ්‍රේණිගත කිරීම් මත පාදකව කේවල ණය සීමා පනවනු ලැබේ. ණය සීමා උපයෝජනය නිරන්තරයෙන් අධීක්ෂණය කරනු ලැබේ.

#### (iv) ද්‍රවශීලතා අවදානම්

සංස්ථාව විසින් මූල්‍ය පූර්වකථනය සිදුකරනු ලබන අතර සංස්ථාවේ ද්‍රවශීලතා අවශ්‍යතා සහතික කිරීම පිණිස නිරතුරුව සමාලෝචනය කරනු ලැබේ. එබඳු පූර්වකථනයන්හිදී සංස්ථාවේ ණය මූල්‍යකරණ සැලසුම්, ප්‍රඥප්ති අනුකූලතාව සැලකිල්ලට ගනු ලැබේ. කාරක ප්‍රාග්ධන කළමනාකරණය සඳහා අවශ්‍ය කරනු ලබන ශේෂයට වඩා සහ ඉහළින් සංස්ථාව විසින් රඳවාගෙන ඇති අතිරික්ත මුදල්, බැඳීම් සපුරාලීම සඳහා යෝග්‍ය කල්පිරීම් සහිත පොළී ආදායම් උපයනු පිණිස කාල තැන්පතුවලට මාරු කරනු ලැබේ.

### 6. ආශ්‍රිත පාර්ශව ගනුදෙනු

| *සබඳතාවයේ නම* | *තනතුර* | *ගනුදෙනුවේ ස්වභාවය* |
|---|---|---|
| නන්ද මුරුත්තෙට්ටුවේගම මයා | සභාපති | නැත |
| ඩබ්ලිව්. ජයසිරි මහතා | අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික | නැත |
| දීපිකා ප්‍රියදර්ශනී පීරිස් මෙනෙවිය | අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික | නැත |
| චන්ද්‍රිකා කුලතිලක | භාණ්ඩාගාරයේ නියෝජිත | නැත |
| ආචාර්ය අරුන්දතී ශ්‍රී රෙන්ගනාදන් | අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික | නැත |
| කිත්සිරි සමරසිංහ මයා | අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික | නැත |

**සටහන - 1**

**ආදායම**

| විස්තරය | 2014 | 2013 | ගැලපීම් | 2013 අනුමත |
|---|---|---|---|---|
| එයාර් ටයිම් ඒෂියා සේවයේ ගුවන් කාලය විකිණීම | 17,525,053 | 19,156,921 | | 19,156,921 |
| T.W.R. ගුවන් කාලය විකිණීම | 77,034,801 | 78,121,561 | | 78,121,561 |
| දේශීය සේවයේ ගුවන් කාලය විකිණීම | 431,226,096 | 398,178,327 | 1,972,590 | 396,205,737 |
| නිෂ්පාදන ගාස්තු - දේශීය සේවය | 4,863,033 | 5,103,667 | 72,500 | 5,031,167 |
| අවමංගල්‍ය දැන්වීම් | 4,322,106 | 4,513,474 | | 4,513,474 |
| BBC ගුවන් කාලය විකිණීම | 11,317,400 | | | 11,317,400 |
| FEBA ගුවන් කාලය විකිණීම | 3,382,704 | 1,358,049 | | 1,358,049 |
| PCJ ගුවන් කාලය විකිණීම | 132,270 | | | |
| සිටි ඇන්ඩ් ගිල්ඩ්ස් පාඨමාලා ගාස්තු | | | | |
| | **538,486,063** | **517,749,399** | **2,045,090** | **515,704,309** |

**සටහන - 2**

**විකුණුම් පිරිවැය**

| විස්තරය | 2014 | 2013 |
|---|---|---|
| වැටුප්, වේතන හා දීමනා | 195,667,088 | 173,365,646 |
| සේවක අර්ථසාධක අරමුදලට දායකත්වය | 26,583,887 | 21,797,452 |
| සේවක භාරකාර අරමුදලට දායකත්වය | 4,924,964 | 4,588,106 |
| කාර්යමණ්ඩලය සඳහා අතිකාල | 1,517,627 | 7,336,580 |
| ගමන් සහ යැපුම් දීමනා | 773,952 | 845,154 |
| වැඩසටහන් වියදම් | 7,212,010 | 6,033,369 |
| දුරකථන | 2,325,369 | 1,589,542 |
| සහන කාර්යය මණ්ඩලය | 14,569,139 | 16,214,567 |
| වාහන ධාවන වියදම් | 7,785,725 | 7,418,629 |
| නඩත්තු පිරිවැය | 12,853,663 | 3,168,678 |
| විදුලිය | 112,512,994 | 115,946,922 |
| සුභසාධනය | | 89,226 |
| අනෙකුත් වියදම් | 6,783,584 | |
| | **393,510,002** | **358,393,871** |

## සටහන - 3

## අනෙකුත් මෙහෙයුම් වියදම්

| විස්තරය | 2014 | 2013 | ගැලපීම් | 2013 අනුමත |
|---|---|---|---|---|
| ණය මත පොළී | 2,936,467 | 10,558,231 | | 10,558,231 |
| විවිධ ආදායම් (වෙනත්) | 51,623,952 | 50,497,496 | (270,068) | 50,767,565 |
| ආපසු හරවා යවනු ලැබූ චෙක්පත් සඳහා දඩ | 25,774 | 49,493 | | 49,493 |
| නිවාස කුලී | 20,951 | 2,782 | (25,788) | 28,569 |
| විශේෂ පටිගත කිරීම් | 207,086 | 172,388 | | 172,388 |
| ප්‍රමාද බලපත්‍ර සඳහා දඩ මුදල් | 8,571 | 285 | | 285 |
| ආනයනකරුවන්, වෙළෙන්දන්, එක්රැස් කරන්නන්, අලුත්වැඩියා කරන්නන් සඳහා බලපත්‍ර | 8,715,940 | 9,398,973 | (13,640) | 9,412,613 |
| කැසට් පට අලෙවිය | 1,073,715 | 6,395,905 | | 6,395,905 |
| දඩ ගිණුම් | 1,799 | 5,000 | 5,000 | |
| සංචාරක බංගලාවෙන් ලත් ආදායම - අඹේවෙල | 802,954 | 998,625 | | 998,625 |
| ප්‍රකාශන අලෙවිය | 227,767 | 198,108 | | 198,108 |
| ආදායම - ත්‍රිකුණාමල ව්‍යාපෘතිය | 23,394,866 | (10,369,767) | | (10,369,767) |
| උප එකතුව | **89,039,842** | **67,907,519** | **(304,496)** | **68,212,015** |
| රජයේ ප්‍රදානය ක්‍රමක්ෂය | 62,272,581 | 75,624,269 | | 75,624,269 |
| ත්‍රිකුණාමල ප්‍රදානය ක්‍රමක්ෂය | 177,769,097 | 177,769,097 | | 177,769,097 |
| බලපත්‍ර ගාස්තු සඳහා රජයේ දීමනාව | 218,160,000 | 96,020,000 | | 96,020,000 |
| බඳවා ගැනීමේ වියදම් සඳහා රජයේ ප්‍රදානය | | 24,997,535 | | 24,997,535 |
| **උප එකතුව** | **458,201,678** | **374,410,901** | - | **374,410,901** |
| **මුළු එකතුව** | **547,241,520** | **442,318,420** | **(304,496)** | **442,622,916** |

3.1) Rs. 218.16 million received from the government as grant in lieu of radio license.

## සටහන - 4

## බෙදාහැරීමේ පිරිවැය

| විස්තරය | 2014 | 2013 |
|---|---|---|
| ව්‍යාපාර ප්‍රවර්ධන වියදම් | 3,452,297 | 1,181,919 |
| ගුවන් කාලය විකිණීමෙන් කොමිස් මුදල් (දේශීය) | 55,645,241 | 54,615,635 |
| ගුවන් කාලය විකිණීමෙන් කොමිස් මුදල් (විදේශීය) | 2,062,577 | 2,897,304 |
| හදිසි වැඩසටහන් ගාස්තු | | 18,000 |
| බොල් සහ අඩමාණ ණය සඳහා ප්‍රතිපාදන | 2,541,373 | 416,534 |
| කතෘ භාග වියදම් | 17,364,788 | 2,194,526 |
| | **81,066,276** | **61,323,918** |

**සටහන - 5**

**අනෙකුත් මෙහෙයුම් පිරිවැය**

| විස්තරය | 2014 | 2013 | ගැලපීම් | 2013 අනුමත |
|---|---|---|---|---|
| වැඩසටහන් වියදම් | 4,076,399 | 5,773,617 | | 5,773,617 |
| බාහිර ගුවන්විදුලි සංවිධාන සඳහා දායකත්වය | 2,434,285 | 2,935,220 | | 2,935,220 |
| පුවත් සේවා සහ පුවත් සාරාංශ | 1,114,865 | 722,940 | | 722,940 |
| වෙළෙඳ දැන්වීම් සහ ප්‍රචාරණය | 583,665 | 1,016,042 | | 1,016,042 |
| විදුලිය සහ බලශක්තිය | 19,995,905 | 15,449,666 | (1,054,721) | 16,504,387 |
| තැපැල් ගාස්තු, විදුලි පණිවුඩ සහ දුරකථන (i) සිට (ii) | 8,973,145 | 9,607,300 | | 9,607,300 |
| මුද්‍රණ සහ ලිපිද්‍රව්‍ය | 5,261,523 | 6,765,180 | | 6,765,180 |
| මෝටර් රථ ධාවන වියදම් | 13,684,531 | 19,238,569 | | 19,238,569 |
| ගුවන්විදුලි උපකරණ අලුත්වැඩියා සහ නඩත්තු | 1,819,239 | 11,755,291 | | 11,755,291 |
| සංගීත උපකරණ අලුත්වැඩියා සහ නඩත්තු | 56,100 | 13,200 | | 13,200 |
| ලී බඩු සහ සවිකිරීම් අලුත්වැඩියා සහ නඩත්තු | 8,254,443 | 2,467,247 | | 2,467,247 |
| ගොඩනැගිලි සහ උද්‍යාන අලුත්වැඩියා සහ නඩත්තු | 3,610,881 | 14,317,756 | 314,297 | 14,003,459 |
| ක්ෂයවීම් | 50,005,060 | 68,459,187 | 2,218,881 | 66,240,306 |
| ත්‍රිකුණාමලය ක්ෂයවීම | 178,531,044 | 178,044,930 | | 178,044,930 |
| බදුකරණය (ආර්ථික සේවා ගාස්තු) | 6,273,298 | 5,839,153 | | 5,839,153 |
| ශ්‍රාවක සමීක්ෂණය සහ වෙළෙඳපොල පර්යේෂණය | 13,600 | 176,280 | | 176,280 |
| වාහන කුලියට ගැනීමේ ගාස්තු | 6,203,846 | 962,940 | | 962,940 |
| මුද්දර ගාස්තු | 134,303 | 26,027 | | 26,027 |
| ගුවන්විදුලි සංඛ්‍යාත ගාස්තු | 15,000,000 | 20,061,714 | | 20,061,714 |
| | **326,026,131** | **363,632,260** | **1,478,458** | **362,153,802** |

**සටහන - 6**

**පරිපාලන පිරිවැය**

| විස්තරය | 2014 | 2013 | ගැලපීම් | 2013 අනුමත |
|---|---|---|---|---|
| දීමනා - සංස්ථාවේ සභාපති සහ අ.ම. සාමාජිකයන් | 2,069,200 | 1,788,500 | | 1,788,500 |
| වැටුප්, වේතන සහ දීමනා | 158,625,985 | 163,087,801 | (294,745) | 163,382,546 |
| සේවක අර්ථසාධක අරමුදලට දායකත්වය | 26,316,412 | 27,997,533 | | 27,997,533 |
| සේවක භාරකාර අරමුදලට දායකත්වය | 5,655,096 | 5,366,608 | | 5,366,608 |
| කාර්යමණ්ඩලය සඳහා අතිකාල | 19,244,178 | 9,005,624 | | 9,005,624 |
| සහන කාර්යමණ්ඩලය | 19,202,221 | 18,018,341 | | 18,018,341 |
| කොන්ත්‍රාත් කාර්ය මණ්ඩලය සඳහා වේතන | 29,505,949 | 29,728,773 | | 29,728,773 |
| කාර්යමණ්ඩල පුහුණු ගාස්තු (දේශීය) | 42,500 | 44,500 | | 44,500 |
| ගමන් සහ යැපුම් | 1,669,304 | 1,643,625 | | 1,643,625 |
| නිවාඩු දින වැටුප් | 2,490,725 | 2,905,158 | | 2,905,158 |
| පාරිතෝෂික | 44,218,603 | 33,506,189 | | 33,506,189 |
| සභාපති විසින් සංග්‍රහ | 730,702 | 376,483 | | 376,483 |
| අධ්‍යක්ෂ මණ්ඩලය විසින් විනෝදාස්වාද | 233,567 | 166,385 | | 166,385 |
| සුබසාධනය | 1,277,041 | 1,783,784 | | 1,783,784 |
| වෛද්‍ය සේවා | 157,890 | 379,873 | | 379,873 |
| සාමාන්‍ය ගාස්තු | 1,705,107 | 1,293,468 | | 1,293,468 |
| කුලී අනුපාත සහ බදු | 7,035,380 | 7,313,859 | | 7,313,859 |
| රක්ෂණ | 2,428,299 | 1,925,451 | | 1,925,451 |
| විගණන ගාස්තු | 550,000 | 600,000 | | 600,000 |
| නෛතික ගාස්තු | 2,039,208 | 802,453 | | 802,453 |
| ප්‍රකාශන සහ වාර සඟරා | 455,222 | 508,197 | | 508,197 |
| පාරිතෝෂිකය, උසාවි ගාස්තු සඳහා දඩ | 1,218,609 | 574,508 | | 574,508 |
| | **326,871,198** | **308,817,113** | **(294,745)** | **309,111,858** |

6.1) 2014 වසරේ දී කාර්යමණ්ඩල සාමාජිකයනන්ගේ ඥාතීන්ගේ මරණ දැන්වීම් ප්‍රචාරය කිරීම වෙනුවෙන් සංස්ථාව රු.290,268.00 ක වියදමක් දැරීය. මෙම දැන්වීම් ප්‍රචාරය කරනු ලැබුයේ බලාත්මක දැනට පවතින යෝජනා ක්‍රමය යටතේ ය. මෙය සෑම වසරක ම සංස්ථාව අනුගමනය කළ ක්‍රියාදාමයයි.

**පවතින නඩු**

ශ්‍රේෂ්ඨාධිකරණයේ නඩුවක් විභාග වෙමින් පවතී. එය දිස්ත්‍රික් උසාවියේ පැමිණිලිකරුවකු වෙනුවෙන් නඩු ගාස්තු සමඟ රු.10,000.00 ප්‍රදානය කරන ලෙස දිස්ත්‍රික් උසාවි නඩු අංක 23089/MR තීන්දුව ඉවත දමන ලෙස අයැදීමකි

මහාධිකරණයේ නඩු දෙකක් විභාග වෙමින් පවතී. වාණිජ මහාධිකරණයේ නඩු දෙකක් ද දිස්ත්‍රික් උසාවියේ නඩු පහක් ද විභාග වෙමින් පවතී.

මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු පහක් ද කම්කරු දෙපාර්තමේන්තු බේරුම්කරණයේ නඩු දෙකක් ද විභාග වෙමින් පවතී.

**සටහන - 7**

**මූල්‍ය වියදම**

| විස්තරය | 2014 | 2013 | ගැලපීම් | 2013 අනුමත |
|---|---|---|---|---|
| බැංකු ගාස්තු | 490,217 | 693,070 | | 693,070 |
| අයිරා පොලී | 5,683,109 | 2,805,348 | (20,000) | 2,825,348 |
| විනිමය මත ලාභ/ පාඩු | 170,572 | 53,463 | | 53,463 |
| ණයවර කාඩ්පත් කොමිස් මුදල් | 48,521 | 47,851 | | 47,851 |
| කල්බදු පොලිය | 2,490,894 | 4,232,450 | | 4,232,450 |
| | **8,883,313** | **7,832,182.36** | **(20,000)** | **7,852,182** |

**සටහන - 8**

**8 (I) ආදායම් බදු**

| | 2014 | 2013 |
|---|---|---|
| ගිණුම් අනුව ශුද්ධ ලාභය/ අලාභය | **(50,629,337)** | **(140,508,406)** |
| | | |
| **එකතු කළා : ආදායම් බදු අඩු කළ නොහැකි වියදම්** | | |
| ක්ෂය වීම් | 50,005,060 | 66,240,306 |
| ක්ෂය වීම් ත්‍රිකුණාමලය | 178,531,044 | 178,044,930 |
| බොල් ණය සඳහා ප්‍රතිපාදන | 2,541,373 | 416,534 |
| පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන | 44,218,603 | 33,506,189 |
| සංග්‍රහ | 964,269 | 542,868 |
| ආර්ථික සේවා ගාස්තු | 6,273,298 | 5,839,153 |
| | **282,533,647** | **284,589,980** |
| **අඩු කළා : ආදායම් බදු අඩු කළ හැකි වියදම්** | | |
| ප්‍රාග්ධන දීමනාව | 125,289,729 | 107,673,562 |
| කල් බදු කුලී | 15,520,524 | 15,520,524 |
| පාරිතෝෂික ගෙවීම | 10,104,537 | 12,269,407 |
| රජයේ ප්‍රදානය | 218,160,000 | 96,020,000 |
| | **369,074,790** | **231,483,493** |
| | | |
| බදු අයකළ හැකි ලාභය/ අලාභය | (137,170,480) | (87,401,919) |
| ඉදිරියට ගෙනා බදු අලාභ | | |
| ඉදිරියට රැගෙන ගිය මුළු බදු අලාභය | **(137,170,480)** | **(87,401,919)** |
| **ආදායම් බදු සඳහා ප්‍රතිපාදනය** | | **(692,759)** |

ආදායමෙන් ව්‍යුත්පන්න වන ලාභය මත 28% ක අනුපාතයකට ආදායම් බදු සඳහා සංස්ථාව යටත් වේ. සංස්ථාවේ ගලපන ලද බදු අයකළ හැකි ලාභ හේතුකොට ගෙන ආදායම් බදු සැලකිල්ලට ගනිමින් මෙම මූල්‍ය ප්‍රකාශනයන්හි ප්‍රතිපාදනයක් සලසා ඇත.

## 8 (II) විලම්බිත බදුකරණය ශ්‍රී.ල.ගි.ප්‍ර.12 ප්‍රකාරව විලම්බිත බදුකරණ පිළිගැනීම ගණනය කර සලකා බලයි.

### විලම්බිත බදු වත්කම් සහ බැරකම්

| විස්තරය | 2014 | 2013 |
|---|---|---|
| **මූල්‍ය තත්ත්වය** | | |
| විලම්බිත බදු බැරකම් | 85,864,191 | 65,647,681 |
| විලම්බිත බදු වත්කම් | (945,105) | (1,139,358) |
| ශුද්ධ විලම්බිත බදු වත්කම් | **84,919,086** | **64,508,323** |
| | | |
| **විස්තීරණ ආදායම් ප්‍රකාශය** | | |
| විලම්බිත බදු බැරකම් | 20,216,510 | 19,819,243 |
| විලම්බිත බදු වත්කම් | 194,253 | 179,812 |
| ශුද්ධ විලම්බිත ආදායම් බදු ආදායම/ (වියදම්) | **(20,410,763)** | **(19,999,055)** |

සටහන - 9

## ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාවේ දේපල, පිරියත හා උපකරණ

| දළ ධාරණ මුදල පිරිවැයට | 2014.01.01 දිනට ශේෂය රු. | එකතු කිරීම්/ පැවරුම් රු. | බැහැර කිරීම්/ පැවරුම් රු. | 2014.12.31 දිනට ශේෂය රු. | ක්ෂය වීම් සඳහා ප්‍රතිපාදන 2014.01.01 රු. | කාලසීමාව සඳහා ගාස්තු රු. | බැහැර කිරීම්/ පැවරුම් රු. | ක්ෂය වීම් සඳහා ප්‍රතිපාදන 2014.12.31 රු. | 2014.12.31 දිනට NBW |
|---|---|---|---|---|---|---|---|---|---|
| ඉඩම | 7,764,234 | | | 7,764,234 | | | | | 7,764,234 |
| ගොඩනැගිලි | 168,153,640 | 139,997 | | 168,293,637 | 111,883,602 | 3,816,972 | | 115,700,574 | 52,593,063 |
| පිරියත හා යන්ත්‍රෝපකරණ | 593,569,358 | 651,570 | | 594,220,928 | 472,515,724 | 4,770,667 | | 477,286,391 | 116,934,537 |
| සංගීත උපකරණ | 6,859,440 | | | 6,859,440 | 6,640,656 | 45,122 | | 6,685,778 | 173,662 |
| මෝටර් රථ වාහන | 16,058,169 | 19,267,570 | | 35,326,129 | } 45,594,186 | 8,234,282 | | 53,828,468 | 15,242,518 |
| මූල්‍ය කල්බදු - රථ වාහන | 52,963,457 | | (19,218,600) | 33,744,857 | } | | | | |
| ලී බඩු, සවිකිරීම් | 131,950,959 | 162,756 | (214,075) | 131,899,640 | 103,232,706 | 4,471,960 | | 107,686,827 | 24,212,813 |
| තැටි හා පටි | 24,598,606 | 325,948 | | 24,924,554 | 24,548,606 | 100,789 | | 24,649,395 | 275,159 |
| ශ්‍රව්‍ය සංඛ්‍යානය | 878,472,516 | 1,604,972 | | 880,077,488 | 717,716,887 | 8,755,120 | | 726,472,007 | 153,605,481 |
| සම්ප්‍රේශක | 1,409,956,468 | 654,237 | | 1,410,610,705 | 943,853,539 | 16,927,472 | | 960,781,012 | 449,829,693 |
| පරිගණක උපකරණ | 34,527,097 | 529,359 | | 35,056,456 | 27,643,332 | 2,882,656 | 2,236,721 | 32,762,709 | 2,293,747 |
| පුස්තකාල පොත් | 445,646 | 2,114 | | 447,760 | | | | | 447,760 |
| සුළු ආයුධ | 107,675 | | | 107,675 | 103,551 | 20 | | 103,570 | 4,105 |
| | **3,325,427,266** | **23,338,913** | **(19,432,675)** | **3,329,333,504** | **2,453,732,791** | **50,005,060** | **2,236,721** | **2,505,956,732** | **823,376,772** |

## දේපල, පිරියත හා උපකරණ

| දළ ධාරණ මුදල පිරිවැයට | 2014.01.01 දිනට ශේෂය රු. | එකතු කිරීම්/ පැවරුම් රු. | බැහැර කිරීම්/ පැවරුම් රු. | 2014.12.31 දිනට ශේෂය රු. | ක්ෂය වීම් සඳහා ප්‍රතිපාදන 2014.01.01 රු. | කාලසීමාව සඳහා ගාස්තු රු. | බැහැර කිරීම් / පැවරුම් රු. | ක්ෂය වීම් සඳහා ප්‍රතිපාදන 2014.12.31 රු. | 2014.12.31 දිනට NBW |
|---|---|---|---|---|---|---|---|---|---|
| පිරියත හා යන්ත්‍රෝපකරණ | 203,231,757 | | | 203,231,757 | 30,484,763 | 15,242,382 | | 45,727,145 | 157,504,611.82 |
| මෝටර් රථ වාහන | 4,344,000 | | | 4,344,000 | 2,172,000 | 1,086,000 | | 3,258,001 | 1,085,999.20 |
| ලී බඩු, සවිකිරීම් | 3,228,585 | | | 3,228,585 | 484,288 | 242,144 | | 726,432 | 2,502,153.12 |
| කාර්යාල උපකරණ | 8,848,274 | | | 8,848,274 | 1,769,655 | 884,827 | | 2,654,482 | 6,193,791.60 |
| විදුලි උත්පාදක | 234,689,948 | | | 234,689,948 | 35,202,428 | 17,601,746 | | 52,804,174 | 181,885,773.60 |
| ශ්‍රව්‍ය සංඛ්‍යානය | 57,280,268 | | | 57,280,268 | 8,592,040 | 4,296,020 | | 12,888,060 | 44,392,207.60 |
| සම්ප්‍රේෂක | 1,665,970,376 | 9,070,777 | | 1,675,041,153 | 249,517,888 | 125,240,784 | | 374,758,672 | 1,300,282,480.84 |
| පරිගණක උපකරණ | 73,612,786 | | | 73,612,786 | 73,612,786 | | | | 73,612,786.00 |
| සුළු ආයුධ | 5,266,693 | | | 5,266,693 | 790,004 | 395,002 | | 1,185,006 | 4,081,686.60 |
| උපකරණ | 180,561,849 | | | 180,561,849 | 26,800,960 | 13,542,139 | | 40,343,099 | 140,218,750.32 |
| | **2,437,034,539** | **9,070,777** | | **2,446,105,313** | **429,426,813** | **50,005,060** | | **534,345,072** | **1,911,760,240.70** |

**සටහන - 10**

**අලෙවිය සඳහා පවතින**

| විස්තරය | 2014 | 2013 |
|---|---|---|
| ලංකා පුවත් සමාගමේ ආයෝජනය | 1,000,000 | 1,000,000 |

**සිදුකරමින් පවතින ප්‍රාග්ධන වැඩ**

| විස්තරය | 2014 | 2013 | ගැලපීම් | 2013 |
|---|---|---|---|---|
| සිදුකරමින් පවතින ප්‍රාග්ධන වැඩ | 142,180,474 | 20,884,033 | 100,222 | 20,984,255 |
| | **142,180,474** | **20,884,033** | **100,222** | **20,984,255** |

සටහන - 11

වෙළෙඳ සහ අනෙකුත් ලැබිය යුතු දෑ

| විස්තරය | 2014 | 2013 | ගැලපීම් | 2013 අනුමත |
|---|---|---|---|---|
| ණයගැති ගුවන් කාලය | 197,360,736 | 182,178,530 | 1,963,812 | 180,214,718 |
| අඩුකළා : මූල්‍ය වත්කම් හානි | (100,307,731) | (98,041,358) | | (98,041,358) |
| කාර්යමණ්ඩල සඳහා ණය | 6,745,921 | 6,819,205 | | 6,819,205 |
| කාර්යමණ්ඩල සඳහා අනෙකුත් අත්තිකාරම් | 9,107,983 | 9,909,801 | | 9,909,801 |
| කාර්යමණ්ඩල ණයගැතියෝ සේ.අ.අ. | 319,973 | 327,195 | | 327,195 |
| කලින් සිදුකළ ගෙවීම් | | 857,394 | | 857,394 |
| සැපයුම්කරුවන් සඳහා අත්තිකාරම් ගෙවීම | 2,793,558 | 2,386,419 | | 2,386,419 |
| විවිධ ණය ගැතියෝ | 20,073,043 | 5,306,017 | | 5,306,017 |
| අගරු චෙක්පත් | 3,921,340 | 4,040,514 | (6,400) | 4,046,914 |
| P.M.G ජංගම ගිණුම - අවමංගල්‍ය දැන්වීම් | 7,997,854 | 7,997,854 | | 7,997,854 |
| ලක්හඬ ශාඛා ගිණුම් | 12,807,862 | 12,807,862 | | 12,807,862 |
| G.S.T. පාලන ගිණුම | 237,267 | 237,267 | | 237,267 |
| ලැබිය යුතු ආදායම (වෙනත්) | 7,862,609 | 33,392,883 | (3,134,230) | 36,527,113 |
| රඳවා ගැනීමේ බද්ද | (133,967) | (133,967) | | (133,967) |
| P.M.G ජංගම ගිණුම ගුවන්විදුලි බලපත්‍ර ගාස්තු | 195,700 | 195,700 | | 195,700 |
| අවිනිශ්චිත ගිණුම | 221,965 | 221,965 | | 221,965 |
| අවිනිශ්චිත ගිණුම (සරෆ්) | 281,110 | 281,110 | | 281,110 |
| විලම්භිත ආදායම | 5,102,000 | 10,204,000 | | 10,204,000 |
| අනෙකුත් තැන්පතු | 9,264,962 | 9,664,962 | | 9,664,962 |
| | **183,852,186** | **188,653,353** | **(1,176,818)** | **189,830,171** |

සටහන - 12

මුදල් හා මුදලට සමාන දෑ

| විස්තරය | 2014 | 2013 |
|---|---|---|
| ලංකා බැංකුව - මාතර | 61,150 | 1,825 |
| මහජන බැංකුව ජාත්‍යන්තර අංශය | 194,498 | (65,206) |
| ලංකා බැංකුව - ටොරින්ටන් - ප්‍රධාන ගිණුම | (48,087,342) | (48,529,414) |
| ස්ටේට් බෑන්ක් ඔෆ් ඉන්ඩියා | 377,104 | 384,391 |
| ලංකා බැංකුව - අනුරාධපුර | (16,020) | 17,900 |
| ලංකා බැංකුව - මහනුවර | 982,282 | 836,481 |
| නේෂන්ස් ට්‍රස්ට් බෑන්ක් | 6,840,698 | (303,317) |
| ලංකා බැංකුව - ටොරින්ටන් - ගුවන්විදුලි බලපත්‍ර | 9,415,910 | 303,130 |
| ගිණුම | 1,626,410 | 706,524 |
| ලංකා බැංකුව - ටොරින්ටන් - එෆ්.එම්. ව්‍යාපෘතිය | 205,530 | 114,287 |
| මුදල් අග්‍රිමය | 10,581,799 | 994,212 |
| ලංකා බැංකුව - ටොරින්ටන් - කැසට් | 980,886 | 549,989 |
| ලංකා බැංකුව - මදුරාසිය | | 25,000 |
| සුළු මුදල් අග්‍රිමය | 11,080,809 | 2,631,599 |
| මුදල් පොත - ත්‍රිකුණාමල ව්‍යාපෘතිය | | |
| ලංකා බැංකුව - ඉතුරුම් | 85,502 | 82,155 |
| ස්ථාවර තැන්පතු | 20,133,672 | 59,969,349 |
| සැනසුම | 322,147 | 322,147 |
| ගිණුම් ආන්තිකය (මහජන බැංකුව) | 86,308,377 | 5,204 |
| | **101,096,412** | **18,046,256** |

## සටහන - 13

### රඳවාගත් ඉපැයුම්

| විස්තරය | 2014 | 2013 |
|---|---|---|
| ආදායම් සංචිතය ජනවාරි 01 | (219,291,349) | (75,806,365) |
| ආදායම් සංචිතය ගැලපුම | | 17,138,355 |
| **ආදායම් සංචිතය** | **(71,040,100)** | **(161,200,220)** |
| ආදායම් සංචිතය ගැලපුම 2014 | | 576,881 |
| **ආදායම් සංචිතය (ගලපන ලද)** | | **(160,623,339)** |
| **එකතුව** | **(290,331,449)** | **(219,291,349)** |

## සටහන - 15

### වෙළෙඳ සහ අනෙකුත් ලැබිය යුතු දෑ

| විස්තරය | 2014 | 2013 | ගැලපීම් | 2013 අනුමත |
|---|---|---|---|---|
| ණයහිමියාගේ ගුවන් කාලය විකිණීම | 7,772,612 | 8,828,329 | | 8,828,329 |
| ආපසු ගෙවන විවිධ තැන්පතු | 10,002,729 | 9,793,729 | | 9,793,729 |
| උපචිත වියදම් | 246,510,016 | 233,486,179 | (21,703,891) | 255,190,070 |
| සේ.අ.අ. | 3,863,076 | 3,313,155 | | 3,313,155 |
| ලබා නොගත් වැටුප් සහ වේතන | 487,477 | 487,477 | | 487,477 |
| විවිධ ණයහිමියෝ | 20,181,326 | 17,526,848 | 278,658 | 17,248,190 |
| විවිධ ණයහිමියෝ | 10,000 | 10,000 | | 10,000 |
| ආරක්ෂක තැන්පතුව | 895,371 | 356,624 | | 356,624 |
| සැනසුම - සුනාමි | 322,147 | 322,147 | | 322,147 |
| ජර්මන් ගුවන්විදුලිය | 16,932,095 | 16,932,095 | | 16,932,095 |
| කල්බදු ගිණුම | 8,047,022 | 13,560,440 | | 13,560,440 |
| සිටි ඇන්ඩ් ගිල්ඩ් විභාග ගාස්තු | | (295,089) | | (295,089) |
| රජරට සංචාරක බංගලාව | 270,096 | | | |
| | **315,293,967** | **304,321,934** | **(21,425,233)** | **325,747,167** |

## සටහන - 16

### මූල්‍ය නොවන බැරකම්

| විස්තරය | 2014 | 2013 |
|---|---|---|
| ජා.ආ.බ. | 15,007,806 | 15,007,806 |
| ජාතිය බේරාගැනීමේ අරමුදල | (12,418) | (12,418) |
| ආදායක බද්ද | (192,098) | (211,044) |
| රඳවාගැනීමේ බද්ද | (32,861,470) | (32,103,873) |
| වැට් පාලන ගිණුම | 34,237,030 | 31,219,222 |
| ආ.සේ.ගා. | 58,041,334 | 51,768,036 |
| ජා.ගො. බද්ද | 40,402,845 | 30,881,016 |
| ජාතික ආරක්ෂක අරමුදල | 2,835 | 2,835 |
| ආදායම් බද්ද සඳහා ප්‍රතිපාදනය | 692,759 | 692,759 |
| | **115,318,63** | **97,244,339** |

**සටහන - 14**

**මූල්‍ය කල්බදු**

| **විස්තරය** | **2014** | **2013** |
| --- | --- | --- |
| මූල්‍ය කල්බදු (මෝටර් රථ) | 30,029,135 | 44,746,910 |
| | 30,029,135 | 44,746,910 |
| කල්බදු කුලී | (16,266,392) | (14,717,775) |
| | 13,762,743 | 30,029,135 |
| **අඩුකළා** | | |
| කල්බදු පොළී අවිනිශ්චිත ගිණුම | (1,221,490) | (3,712,384) |
| | 12,541,253 | 26,316,751 |
| ජංගම බැරකම | 8,047,022 | 13,560,440 |
| ජංගම නොවන බැරකම | 4,494,231 | 12,756,311 |

# 2014 දෙසැම්බර් මස 31 වෙනි දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශය පිළිබඳ විගණකාධිපති වාර්තාව

# විගණකාධිපති දෙපාර්තමේන්තුව
# கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
# AUDITOR GENERAL'S DEPARTMENT

මගේ අංකය / எனது இல. / My No. } ටීඑම්/ඩී/එස්එල්බීසී/1/14/316   ඔබේ අංකය / உமது இல. / Your No. }   දිනය / திகதி / Date } 2015 ඔක්තෝබර් 29 දින

සභාපති,
ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාව.

**ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාවේ 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 14 (2) (සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව.**

---

ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාවේ 2014 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1966 අංක 37 දරන ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථා පනතේ 27 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2) (සී) වගන්තිය ප්‍රකාර සංස්ථාවේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. මුදල් පනතේ 13(7) (ඒ) වගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාවක් සංස්ථාවේ සභාපති වෙත යථා කාලයේදී නිකුත් කරනු ලැබේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 –1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලැසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරීවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීම පිණිස සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් සංස්ථාවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගැයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගැයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) හා (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවැරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4 අහිතකර මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලට ගැලපීම් කර තිබුණේ නම් අනුගාමී මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බොහොමයක් මූලිකාංගවලට ප්‍රමාණාත්මක ලෙස බලපෑ හැකිව තිබුණි.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 අහිතකර මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවල වැදගත් බව හේතුවෙන් 2014 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු නොකරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 2.2.1 ආයතනයේ අඛණ්ඩ පැවැත්ම

සංස්ථාවේ මූල්‍ය තත්ත්වය දිගින් දිගටම පිරිහෙමින් පවතින බව එහි මූල්‍ය තත්ත්වය පිළිබඳ කරන ලද විශ්ලේෂණයේදී අනාවරණය විය. සමාලෝචිත වර්ෂය අවසානයට සංස්ථාවේ බැංකු අයිරාව රු.මිලියන 36.7 ක් වූ අතර මේ සඳහා වර්ෂය තුළදී ගෙවා තිබුණු පොළිය රු. මිලියන 5.7 ක් විය. ඉහත පරිදි බැංකු අයිරාවක් ඇති වීමට පෙර 2011 වර්ෂයේදී මූලධන වැය සඳහා මහා භාණ්ඩාගාරයෙන් ලබාදී තිබුණු රු. මිලියන 77.5 ක මුදලින් රු. මිලියන 40 ක් අයභාර වියදම් සඳහා යොදවාගෙන තිබුණි. සංස්ථාවේ පවතින අයහපත් මූල්‍ය තත්ත්වය හේතු කොටගෙන සංස්ථාව පවත්වාගෙන යාම් සඳහා මහා භාණ්ඩාගාරය විසින් ප්‍රතිපාදන ලබාදී තිබුණු අතර සමාලෝචිත වර්ෂයේදී ප්‍රාග්ධන හා අයභාර වියදම් සඳහා මහා භාණ්ඩාගාරයෙන් ලබාදී තිබුණු මුදල රු.මිලියන 436 ක් විය. මේ අනුව මහා භාණ්ඩාගාරයේ මූල්‍ය ප්‍රතිපාදන නොමැතිව සංස්ථාව පවත්වාගෙන යාම අවිනිශ්චිත බව නිරීක්ෂණය විය.

2.2.2 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති (ශ්‍රී.ලං.ගි.ප්‍ර.) හා ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති (ශ්‍රී.ලං.වා.ප්‍ර)

පහත දැක්වෙන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට හා ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම් විගණනයේදී නිරීක්ෂණය විය.

| | ප්‍රමිතිවලට යොමුව | අනුකූල නොවීම |
| --- | --- | --- |
| (අ) | ශ්‍රී ලංකා වාර්තාකරණ ප්‍රමිති 5 | (i) දීර්ඝ කාලයක් තිස්සේ ප්‍රතිලාභයක් ලබා නොතිබූ රු.1,000,000 ක ආයෝජන විකිණීම සඳහා ඇති වත්කම් ලෙස 2012 වර්ෂයේදී හඳුනාගෙන තිබුණු නමුත් එම වත්කම් විකිණීමට හෝ වෙළඳපල වටිනාකම හා ධාරණ අගය යන දෙකෙන් අඩු අගයට ගණනය කර ගිණුම්ගත කිරීමට හෝ කටයුතු කර නොතිබුණි. |
| | | (ii) යම් ඒකකයක් (සේවා මධ්‍යස්ථානයක්) වසා දැමීමේදී / අත්හිටුවීමේදී එම අංශයේ ආදායම, වියදම, බදු පෙර ලාභය/ අලාභය, පිළිබඳව හෙළිදරව් කළ යුතු වුවත්, සමාලෝචිත වර්ෂයේ අප්‍රේල් 04 දින සිට වසා දමන ලද කොත්මලේ විකාශනාගාරය පිළිබඳ මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කර නොතිබුණි. |
| (ආ) | ශ්‍රී ලංකා වාර්තාකරණ ප්‍රමිති 8 | සංස්ථාව සතුව ප්‍රාදේශීය සේවාවන් 06 ක්, නාලිකා 8ක් සහ වෙනම ව්‍යාපෘතියක් ලෙස පවත්වාගෙන යනු ලබන ඩොයිෂ්වෙල් ප්‍රතිවිකාශනාගාරයක්ද පවතින අතර, එම සේවාවන් හා ඒවායින් වාර්ථා කළ යුතු කොටස් (segment) වලට අදාළ වත්කම්, වගකීම් සහ ආදායම් ප්‍රභවයන් මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කර නොතිබුණි. |
| (ඇ) | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 1 | ස්ථාවර තැන්පතු වෙනුවෙන් 2000 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා ලද පොළියෙන් බැංකුව විසින් අඩුකර තිබුණු රඳවා ගැනීමේ බදු එකතුව රු32,862,470 ක් ඒ ඒ වර්ෂයේ ලාභයට ගැලපිය යුතු නමුත් එම මුළු මුදලම මූල්‍යමය නොවන වගකීම් යටතේ මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. |
| (ඈ) | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 7 | මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කර තිබුණු මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ තුලනය නොවූ වෙනස කාරක ප්‍රාග්ධනයේ ලැබිය යුතු ශේෂයේ වෙනසට ගලපා තුලනය කර තිබුණි. ඒ හේතුවෙන් මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ ලැබියයුතු (ණයගැතියෝ ) ශේෂයේ විචලනය, රු.328,367 ක් අඩුවෙන් දක්වා තිබුණි. |
| (ඉ) | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 16 | අපහරණය කර ඇති වත්කම් ජංගම නොවන වත්කම් වලින් ඉවත්කර මූල්‍ය ප්‍රකාශනවල පෙන්විය යුතු වුවත් ඉකුත් වර්ෂවලදී රු. 1,661,326 කට සහ සමාලෝචිත වර්ෂය තුළදී රු. 186,396 කට අපහරණය කර තිබුණු වත්කම්වල පිරිවැය හා සමුච්චිත ක්ෂය ජංගම නොවන වත්කම් ගිණුම්වලින් ඉවත් කර නොතිබුණි. |
| (ඊ) | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 17 | පිරිවැය හෝ සාධාරණ අගය යන දෙකෙන් අඩු අගයට කල්බදු ක්‍රමය මත මිලදීගත් වාහන ගිණුම් තැබිය යුතු වුවත් ප්‍රමිතියේ නියමයන්ට පටහැනිව රු.2,155,753 ක් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල පිරිවැයට දක්වා තිබුණ අතර, එහි ක්ෂය වීම්ද අඩුවෙන් ගණනය කර තිබුණි. |

(උ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 18 — සමාලෝචිත වර්ෂයේදී සංස්ථාව විසින් දීර්ඝ කාලීන වෙළඳ දැන්වීම් ප්‍රචාරණය වෙනුවෙන් ඇති කරගත් ගිවිසුම් වලින්, සමාලෝචිත වර්ෂය තුළදී ප්‍රචාරණය කළ වෙළෙඳ දැන්වීම් ප්‍රමාණය හා ඉදිරියේදී ප්‍රචාරණය කිරීමට බැඳී ඇති වෙළෙඳ දැන්වීම් ප්‍රමාණය වෙනමම දැක්වෙන පරිදි හඳුනාගත් ආදායම හා ඉදිරියේදී ඉටුකළ යුතු ප්‍රචාරණ බැඳීම මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කර නොතිබුණි.

(ඌ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 19 — විශ්‍රාම ප්‍රතිලාභ ගෙවීම් ගිණුම් තැබීම සම්බන්ධව සංස්ථාව අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති, වර්තමාන හා අතීත සේවා පිරිවැය, ආයුගණක ලාභ සහ අලාභ සම්බන්ධ විස්තර මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි.

(එ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 20 — සමාලෝචිත වර්ෂය තුළදී ප්‍රාග්ධන හා අයභාර වියදම් සඳහා සංස්ථාව වෙත රු.436,162,836 ක රජයේ ආධාර ලැබී තිබුණ ද , රාජ්‍ය ප්‍රදාන සඳහා ගිණුම් තැබීම සඳහා යොදාගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති හා රජයේ ප්‍රදානවලට අදාලව සපුරා නොමැති කොන්දේසි සහ ප්‍රාග්ධන ආධාර ක්‍රමක්ෂය කිරීම පිළිබඳ විස්තර මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කර නොතිබුණි.

(ඒ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 21

(i) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට සංස්ථාවේ විදේශ ණයගැතියන් ප්‍රමාණය එක්සත් ජනපද ඩොලර් 1,040,090 ක් හා ඉන්දියන් රුපියල් 547,718ක් සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට පැවති විනිමය අනුපාතය මත පරිවර්තනය කර රු. මිලියන 139 ක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබීම නිසා විදේශ විනිමය විචලන වාසිය රු.මිලියන 73 ක් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල පෙන්නුම් කර තිබුණි.

(ii) විදේශීය වෙළෙඳ නියෝජිත ආයතන හරහා මෙරට විකාශය වන දැන්වීම් හතරක් සහ විදේශ විකාශන සේවා දෙකකින් ලැබිය යුතු ආදායම් ගිණුම්ගත කිරීමේදී අදාල ගනුදෙනුව සිදුකළ දිනට පැවති විනිමය අනුපාතය මත ආදායම් ගිණුම්ගත කරනු වෙනුවට ගිවිසුම ආරම්භ කළ දින පැවති විනිමය අනුපාතය මත ගුවන් කාල විකුණුම් ආදායම් ගිණුම් ගත කිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය සඳහා ගුවන් කාල විකුණුම් ආදායම හා ණයගැතියන් රු.952,603 ක් බැගින්අඩුවෙන් ගිණුම්ගත වී තිබුණි.

(iii) සමාලෝචිත වර්ෂයේ විදේශ ගුවන් කාල විකුණුම් වටිනාකම රු.197,962,756 ක් විය. එසේ වුවත් මෙකී ගුවන් කාල විකුණුම් හා ඒ සඳහා මුදල් ලැබීම් අතර කාල පරතරය වෙනුවෙන් විනිමය විචලන වාසි / අවාසි හඳුනාගෙන අදාල ගැලපීම් සිදුකර නොතිබුණි.

(ඔ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 24 — සම්බන්ධිත පාර්ශවයන් ලෙස සලකනු ලබන රාජ්‍ය ආයතනවලට ගෙවිය යුතු ශේෂ පිළිබඳව මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි.

(ඕ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 38 — ගුවන් විදුලි සේවාවන් සඳහා ස්වයංක්‍රීය පහසුකම් ලබාගැනීමට ඉකුත් වර්ෂවලදී රු.3,400,000 ක් වැයකර තිබූ අතර, එය අස්පෘශ්‍ය වත්කම් යටතේ මූල්‍ය ප්‍රකාශනවල දක්වනු වෙනුවට පරිගණක උපාංග යටතේ ගිණුම්ගත කර ක්ෂය ප්‍රතිපාදනයක් ද ඇතිකර තිබුණි.

2.2.3 ගිණුම්කරණ ප්‍රතිපත්ති

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ගුවන් කාල විකුණුම් ආදායම් ගිණුම්ගත කිරීමේ ගිණුම්කරණ ප්‍රතිපත්තියක් සංස්ථාව විසින් හඳුන්වා දී නොතිබුණි. විකුණුම් ඉන්වොයිසිය පදනම් කරගෙන විකුණුමේ වටිනාකම හඳුනාගනු වෙනුවට ප්‍රචාරණ උපලේඛන පදනම් කරගෙන ගිණුම් තැබීම සිදුකර තිබුණි. විගණනයේදී නිරීක්ෂණය වූ පරිදි ගුවන් කාල විකුණුම් උපලේඛන සකස් කිරීමේ අභ්‍යන්තර පාලන දුර්වලතා හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ ගුවන් කාල විකුණුම් ආදායම වූ රු.534,031,687 ක අගයෙහි නිවැරදිතාවය විගණනයේදී සනාථ කරගත නොහැකි විය.

(ආ) 1980 වර්ෂයේදී ආරම්භ කරන ලද හා 2012 ජනවාරි 01 දින සිට සංස්ථාවට නොමිලේ පවරා තිබුණු ත්‍රිකුණාමල ප්‍රතිවිකාශනාගාරයේ පැවති වත්කම්, ප්‍රත්‍යාගණනය කර ප්‍රත්‍යාගණිත වටිනාකම ගිණුම් ගත කරනු වෙනුවට එම ප්‍රතිවිකාශනාගාරය සඳහා ජර්මන් රජය වත්කම් මිලදීගත් දිනයන්හි පැවති පිරිවැය (යුරෝ) වටිනාකම 2012 දෙසැම්බර් 31 දිනට පැවති විනිමය අනුපාත මත රුපියල්වලට පරිවර්ථනය කර වත්කම්වල වටිනාකම රු.2,430,781,990 ක් ලෙස ගිණුම්ගත කර එම අගය මත 2012 වර්ෂයේ සිට ක්ෂය කර තිබුණි. සමාලෝචිත වර්ෂයේදී ද වත්කම් ප්‍රත්‍යාගණනය කිරීමට කටයුතු කර නොතිබුණි.

2.2.4 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2010 වර්ෂයේදී ස්ථාවර වත්කම් ක්ෂය කිරීමේ ප්‍රතිපත්තිය සරල මාර්ග ක්‍රමයේ සිට හීනවන ශේෂ ක්‍රමයට මාරුකිරීමේදී සිදුකර තිබුණු ක්ෂය ගණනය කිරීමේ දෝෂ හේතුවෙන් සහ රු. 73,612,786 ක පරිගණක මෘදුකාංග ක්ෂය කර නොතිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේදී ආරම්භක සමුච්චිත අලාභය සහ වර්ෂයේ ක්ෂය වියදම පිළිවෙලින් රු.338,927,087 ක් හා රු. 20,144,777 ක් අඩුවෙන් දක්වා තිබුණි.

(ආ) ගුවන් කාල විකුණුම් ණයගැති ශේෂවලට අදාළ එකතුකළ අගය මත බදු වටිනාකම හා ජාතිය ගොඩනැගීමේ බදු වටිනාකම ණයගැති ගිණුමින් අත්හැරී තිබීම හේතුවෙන් එකතුකළ අගය මත බදු ගිණුම, ජාතිය ගොඩනැගීමේ බදු ගිණුම හා ණයගැති ගිණුම් පිළිවෙලින් රු.24,436,043 ක්, රු.2,277,082 ක් හා රු.26,713,124 ක් අඩුවෙන් පෙන්නුම් කර තිබුණි.

(ඇ) ප්‍රධාන කාර්යාලයේ ගිණුම්වල පවත්වාගෙන යනු ලබන ප්‍රාදේශීය සේවාවන් සඳහා වන ජංගම ගිණුම් හා එක් එක් ප්‍රාදේශීය සේවාවන්හි පවත්වාගෙන යනු ලබන ප්‍රධාන කාර්යාලය සමඟ ජංගම ගිණුම් සමඟ සැසඳුම් කර ගිණුම්වලට කළයුතු ගැලපීම් සිදුනොකර ප්‍රධාන කාර්යාලයේ ජංගම් ගිණුම්වල සමාලෝචිත වර්ෂය අවසානයට පැවති ශේෂ එකතුව වන රු.4,845,298 ක බැර ශේෂය වර්ෂ අවසානයේ ණයහිමියන්ට එකතු කර දක්වා තිබුණි.

(ඈ) 2011 වර්ෂයේදී සහ සමාලෝචිත වර්ෂයේදී සංස්ථාව නමින් ලියාපදිංචි කර තිබූ වටිනාකම රු.12,890,000 ක් වූ වාහන දෙකක අගය මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි.එම නිසා සමාලෝචිත වර්ෂයේ ක්ෂය වියදම හා සමුච්චිත ක්ෂය වටිනාකම පිළිවෙලින් රු.1,691,562 ක් හා රු. 5,106,288 ක් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ඉ) භාවිතයෙන් ඉවත් කර තිබුණු වාහන දෙකක් පසුව රු. 4,480,200 ක් වැයකර නැවත භාවිතය සඳහා යොදවාගෙන තිබුණි. එසේ වුවත් මෙම වාහන නැවතත් ගිණුම්ගත කිරීමේදී රු.680,031 ක් අඩුවෙන් වත්කම් ලේස ගිණුම්ගත කර තිබුණි.

(ඊ) ඉකුත් වර්ෂ වෙනුවෙන් ගෙවන ලද පුරස්කාර භාගය රු.510,000 ක් අතීතානුයෝගීව ගැලපීම් නොකර හා ඉදිරි වර්ෂය සඳහා ගෙවූ රු. 16,854,788 ක් ඉදිරි ශේෂයක් ලෙස සටහන් නොකර සමාලෝචිත වර්ෂයේ වියදමක් ලෙස දක්වා තිබුණි.

(උ) සමාලෝචිත වර්ෂයේ දී ප්‍රතිවිකාශන මධ්‍යස්ථාන මගින් වැඩසටහන් සම්බන්ධ කිරීම සඳහා ගෙවා තිබුණු රු.5,081,632 ක වියදම විකුණුම් පිරිවැයට අදාල සෘජු වියදමක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වනු වෙනුවට උපකරණ හා සවිකිරීම් නඩත්තු වියදම් යටතේ මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. සමාලෝචිත වර්ෂයේ මාස 02 ක විකාශන සම්බන්ධිත ගාස්තුව වන රු.1,020,408 ක මුදල සමාලෝචිත වර්ෂයේ වියදමක් ලෙස හඳුනාගෙන නොතිබුණි.

(ඌ) සමාලෝචිත වර්ෂයේ බදු වියදම ගණනය කිරීමේදී කල්බදු වාරික වල වටිනාකම රු.272,170 ක් වැඩියෙන් බදු වියදමට ගලපා තිබුණු අතර ආරම්භක කල් බදු වගකීම රු.802,979 කින් වැඩියෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(එ) ආදායම් බදු දෙපාර්තමේන්තුව විසින් එවන ලද තක්සේරු දැන්වීම් අනුව පසුගිය වර්ෂ 10 කට අදාළව ගෙවිය යුතු ආර්ථික සේවා ගාස්තු වටිනාකම රු.51,368,972 ක් වුවත් මූල්‍ය ප්‍රකාශනවල රු.58,041,334 ක් ලෙස දක්වා තිබීමෙන් වගකීම් රු.6,672,362 ක් වැඩියෙන් දක්වා තිබුණි.

(ඒ) තොග පාලන (ඉන්වෙන්ට්‍රි) ගිණුමේ ශේෂයට සිදුකර තිබුණු විවිධ ගැලපීම්වලට අනුව එම ගිණුමේ ශේෂය රු. 3,296,381 ක් විය යුතුව තිබුණද භෞතික තොග සමීක්ෂණ ශේෂය රු.2,129,075 ක් වුයෙන් එම ශේෂයෙහි රු.1,167,306 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ඔ) ගුවන් විදුලි සංස්ථාව සහ ඌව පළාත් සභාව විසින් ඇතිකරගෙන තිබුණු අවබෝධතා ගිවිසුම අනුව සමාලෝචිත වර්ෂයේදී සංස්ථාවට ලැබියයුතු රු.3,323,333 ක මුදලින් රු.2,323,333 ක ආදායමක් මූල්‍ය ප්‍රකාශනවල අඩුවෙන් දක්වා තිබුණි.

(ඕ) ත්‍රිකුණාමලය ව්‍යාපෘතියෙන් ලද රු.23,394,866 ක් වෙනත් ආදායම් යටතේ දක්වා තිබුණ නමුත් එහි ක්ෂය වියදම වූ රු.178,531,044 ක් සංස්ථාවේ වියදමක් ලෙසද ව්‍යාපෘතියෙහි වියදම් විකුණුම් පිරිවැයටද එකතු කර මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ක) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු බාහිර විකාශන ආයතන සඳහා දායකය වියදම් ගිණුමේ හා උපචිත වියදම් ගිණුම්වල වැරදි විනිමය අනුපාතයකට ගණනය කර 2012, 2013 හා 2015 වර්ෂවලට අදාල වියදමද 2014 වර්ෂයට අදාල වියදම් ලෙස ගණනය කර රු. 2,079,496 ක් සමාලෝචිත වර්ෂයේ වියදමක් ලෙස දක්වා තිබුණි. ඒ අනුව සමාලෝචිත වර්ශයේ වියදම රු.1,419,054 ක් වැඩියෙන්ද සමුච්චිත ලාභයට රු. 1,429,902 ක් අඩුවෙන්ද දක්වා ඇති අතර උපචිත වියදම් ගිණුම රු.10,848ක් අඩුවෙන් ගිණුම් ගතකර තිබුණි.

(ග) පුද්ගලික ආයතනවලට කුළුණු බදු දීම හේතුවෙන් 2013 වර්ෂයට අදාලව සමාලෝචිත වර්ෂයේදී ප්‍රතිපූරණය කරන ලද රු. 2,074,016 ක විදුලි වියදම, ආදාල ලැබිය යුතු ගිණුමට බැර කිරීම වෙනුවට උපචිත විදුලි වියදම් ගිණුමට බැර කිරීම හේතුවෙන් එම ප්‍රමාණයෙන් උපචිත විදුලි වියදම් ගිණුම හා ලැබිය යුතු ආදායම් ගිණුම වැඩියෙන් දක්වා තිබුණි.

(ජ) ඉකුත් වර්ෂයේදී විගණන වාර්තාවලින් පෙන්වා දුන් අඩුපාඩු නිවැරදි නොකිරීම නිසා සමුච්චිත අලාභය, වත්කම් සහ වගකීම්වලට පිළිවෙලින් රු. 3,046,987 ක, රු. 35,687,683 ක හා රු. 5,121,333 ක බලපෑමක් ඇතිවී තිබුණි.

### 2.2.5 නොසැසඳූ පාලන ගිණුම්

ගිණුම් විෂයයන් තුනකට අදාළව විගණනය වෙත ලබාදුන් උපලේඛනයන්හි දැක්වෙන ශේෂයන් හා මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණු ශේෂයන් අතර රු.13,875,844 ක වෙනසක් නිරීක්ෂණය වූ අතර ගිණුම් විෂයන් හතරකට අදාළව විගණනය වෙත ලබාදුන් උපලේඛනයන්හි රු.14,726,349 ක හඳුනා නොගත් ශේෂයක් ඇතුලත්කොට මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ශේෂයට සමාන කර ඉදිරිපත්කර තිබුණි.

### 2.2.6 පැහැදිලි නොකළ වෙනස්කම්

විෂයයන් 6 කට අයත් තොග ශේෂයන්ට අදාලව මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණු වටිනාකම සහ තොග සමීක්ෂණ මණ්ඩල වාර්තාවල දක්වා තිබුණු වටිනාකම් අතර රු. 2,636,228 ක වෙනසක් නිරීක්ෂණය විය.

### 2.2.7 අවිනිශ්චිත ගිණුම්

වසර 21 කට වැඩි කාලයක සිට හඳුනාගත් වංචාවක් හේතුවෙන් ඇතිවී තිබුණු රු.221,965 ක මුදල් ඌනතාවය හා 2007 වර්ෂයේ හඳුනාගත් මුදල් වංචාවකට අදාල වූ රු.281,110 ක් අවිනිශ්චිත ගිණුමකට මාරුකර තිබුණු අතර එය මූල්‍ය ප්‍රකාශනවල ජංගම වත්කම් යටතේ අවිනිශ්චිත ගිණුම් ශේෂයක් ලෙස දක්වා තිබුණි.

### 2.2.8 විගණනය සඳහා සාක්ෂි නොවීම

පහත දැක්වෙන එක් එක් වත්කම් සහ වගකීම්වලට අදාලව එම වත්කම් හා වගකීම්වල පැවැත්ම, අයිතිය හා වටිනාකම සනාථ කරගැනීමට අදාල සාක්ෂි නොමැතිවීම හේතුවෙන් එම වත්කම් හා වගකීම් විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට හෝ පිළිගැනීමට නොහැකි විය.

| | විස්තරය | වටිනාකම<br>රු. | ඉදිරිපත් නොවූ සාක්ෂි |
|---|---|---|---|
| (අ) | ස්ථාවර වත්කම් (2014 දෙසැම්බර් 31 දිනට වාහන හා 2012, 2013 හා 2014 වර්ෂවල මිලදීගත් වත්කම් පිරිවැය හැර) | 3,038,827,778 | පොදු 287 ආකෘති ප්‍රකාරව පිළියෙල කළ ස්ථාවර වත්කම් ලේඛනය සහ පොදු 288 ආකෘතිය ප්‍රකාරව පිළියෙල කළ ස්ථාවර වත්කම් ලෙජරය හා භාණ්ඩ සමීක්ෂණ වාර්තාව |
| (ආ) | ව්‍යාපෘති ආදායම් (ත්‍රිකුණාමල ව්‍යාපෘතිය) | 23,394,866 | ගණනය කිරීම් විස්තර |

| | | | |
|---|---|---|---|
| (ඇ) | වාහන වට්නාකම | 16,816,920 | මූල්‍ය ප්‍රකාශනය අනුව 2014 දෙසැම්බර් 31 දිනට තිබුණු පිරිවැය රු.73,414,986 වාහන වට්නාකම සහ ප්‍රවාහන අංශයේ වාහන වට්නාකම අතර වෙනස සනාථ කිරීමේ උපලේඛනයක් |
| (ඇ) | අගරු චෙක්පත් | 2,468,535 | අගරු චෙක්පත් ලේඛනය/ විස්තරාත්මක උපලේඛන |
| (ඉ) | ගෙවිය යුතු තැන්පතු | 9,259,694 | විස්තරාත්මක උපලේඛන |
| (ඊ) | ණයගැතියන් (මරණ දැන්වීම්) | 7,997,854 | විස්තරාත්මක උපලේඛන |
| (උ) | ලැබිය යුතු තැන්පතු | 561,272 | විස්තරාත්මක උපලේඛනය හා තැන්පත් ලේඛනය |
| (ඌ) | ත්‍රිකුණාමල (ඩොයිෂ්වෙල්)ප්‍රතිවිකාශනාගාරයේ ස්ථාවර වත්කම් | 2,446,105,313 | භාණ්ඩ සමීක්ෂණ වාර්තා |
| (එ) | ත්‍රිකුණාමල ප්‍රතිවිකාශනාගාරයේ ලිබඩු උපකරණ | වට්නාකම ගිණුම් වලට ඇතුළත් කර නොතිබුණි. | භාණ්ඩ සමීක්ෂණ වාර්තා |
| (ඒ) | ත්‍රිකුණාමල ප්‍රතිවිකාශනාගාරයේ ට්‍රාන්ස්මීටර්,ඇන්ටනාවලට අදාළව පවතින අමතර කොටස් (Spare Parts) | වට්නාකම ගිණුම් වලට ඇතුළත් කර නොතිබුණි. | ඉන්වෙන්ට්‍රි ලේඛනයක් හෝ පැවරුම් ලේඛණයක් සහ භාරගත් භාණ්ඩ පිළිබඳ උපලේඛනයක් |
| (ඔ) | කෙරීගෙන යන වැඩ සඳහා ගෙවීම් | 130,000,000 | ඉන්වොයිසි, ලදුපත්, අපේක්ෂිත වැඩ සැලැසුම, වියදම් ඇස්තමේන්තු, ගෙවීම් අනුමත කිරීමේ ලියවිලි |
| (ඕ) | සේවක අත්තිකාරම් | 7,684,737 | විස්තරාත්මක උපලේඛනය හා සැසඳීම් ප්‍රකාශ |
| (ක) | ගිණුම් ගැලපීම් (ජර්නල් සටහන් 17 ක් සම්බන්ධයෙන්) | 65,486,992 | උපයෝගි ලියවිලි |
| (ග) | ගිණුම් ගැලපීම් | 124,221 | ජර්නල් වවුචර් හා උපයෝගි ලියවිලි |
| (ජ) | ණයගැතියෝ | 35,301,041 | ශේෂ තහවුරු කිරීමේ සහ උපයෝගි ලියවිලි ඇතුළත් ලිපිගොණු |
| (ට) | විදේශ ගුවන් කාල විකුණුම් | 80,417,505 | ඉන්වොයිසි |

| | | |
|---|---|---|
| (ඩ) වසර 10 කට අධික කාලයක සිට ගිණුම්වල පවතින වෙළඳ හා වෙනත් ලැබිය යුතු ශේෂ (ලක්හඬ ශාඛා ගිණුම) | 12,807,802 | සම්බන්ධ ලිපි ගොනු විස්තර හා වටිනාකම සැදී ඇති ආකාරය දැක්වෙන උපලේඛණ |
| (න) විවිධ ගෙවීම් | 294,689,798 | ගෙවීම්වලට අදාළ වවුචර්පත් 96 ක් හා උපයෝගී ලියවිලි |
| (ත) ගුවන් කාල ණයගැතියෝ | 29,551,845 | විස්තරාත්මක උපලේඛන |
| (ද) ගුවන් කාල ණයහිමියෝ | 16,717,242 | විස්තරාත්මක උපලේඛන |

## 2. 3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) විගණනයට ඉදිරිපත් කරන ලද උපලේඛන අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට වූ දේශීය හා විදේශීය ගුවන් කාල විකුණුම් ණයගැති ශේෂ එකතුව රු.201,356,608 ක් වන අතර, ඉන් විදේශීය ණයගැති ශේෂයන්ගේ එකතුව රු.66,117,780 ක් විය. එම ණයගැති ශේෂයන්ගෙන් සියයට 90 ක්ම වර්ෂ 10 ට වඩා පැරණි ණය ශේෂ විය.

(ආ) කෙටිකාලීන විකාශන වැඩසටහන් ප්‍රචාරය කිරීමට පෙර මුදල් අයකළ යුතු වුවද, මෙම ප්‍රතිපත්තියට පටහැනිව වැඩසටහන් ප්‍රචාරය කිරීම නිසා කෙටි කාලීන වැඩසටහන් ප්‍රචාරය කිරීම වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු රු.14,570,437 ක මුදලක් ණයගැතියන් ලෙස දක්වා තිබුණි. සංස්ථාවේ ඉඩ දෙන සාමාන්‍ය ණය කාල සීමාව මාස 02 ක් වුවත් ඉහත ණය ශේෂය තුළ වසර 10 ට වැඩි රු.783,285 ක ශේෂයක්ද වසර 5ත් 10ත් අතර රු. 5,481,053 ක් ද වසර 1ත් 5 ත් අතර රු.532,214 ක ශේෂයක්ද විය.

(ඇ) ලැබිය යුතු තැන්පතු මුදල් ලෙස සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පැවති රු.9,264,962 ක ශේෂයෙන් සියයට 82 ක් එනම් රු.7,628,917 ක මුදලක් වර්ෂ 05 ට වැඩි කාලයක සිට පැවත එන ශේෂයන් බව නිරීක්ෂණය විය.

(ඈ) 2007 වර්ෂයේ සිට 2011 වර්ෂය දක්වා කාලපරිච්ඡේදය සඳහා ගෙවිය යුතු රු 3,035,760 ක විගණන ගාස්තු පියවීමට කටයුතු කර නොතිබුණි.

(ඉ) සැපයුම්කරුවන්ට ලබා දී තිබුණු රු.2,793,558 ක අත්තිකාරම් මුදල් මාස 3 සිට වර්ෂ 2 කටත් වඩා වැඩි කාලයක් සැපයුම්කරුවන් භාරයේ පැවතුණි.

(ඊ) 2010 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා සේවාදායකයින්ගෙන් අයකර ගත් ජාතිය ගොඩනැගීමේ බද්ද රු.40,402,845 ක් ආදායම් බදු දෙපාර්තමේන්තුව වෙත ප්‍රේෂණය නොකොට මූල්‍යමය නොවන වගකීම් යටතේ මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

## 2.4. නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

**පහත සඳහන් නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීමේ අවස්ථා විගණනයේදී නිරීක්ෂණය විය.**

| නීති, රීති, රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | |
| (i)මු.රෙ.104(1) (අ) | 2009 දෙසැම්බර් මස මිලදීගත් හදිසි අනතුරක් නිසා ධාවනයෙන් ඉවත් කළ වාහනය වෙනුවෙන් සිදුවූ අලාභය හා ඒ සඳහා වගකිව යුතු පාර්ශ්ව හඳුනාගැනීමට කිසිදු පරීක්ෂණයක් පවත්වා නොතිබුණි. මෙම වාහනය සඳහා රක්ෂණ වන්දියක් ලෙස රු. 2,779,300 ක් 2015 වර්ෂයේදී ලැබී තිබුණි. |
| (ii) මුදල් රෙගුලාසි 110 | හානි හා පාඩු ලේඛනයක් නඩත්තු කර නොතිබුණි |
| (iii) මුදල් රෙගුලාසි 155 | සමාලෝචිත වර්ෂයට අදාලව නිකුත් කරන ලද විගණන විමසුම් 13 ක් සඳහා 2015 ජූලි 11 දින වන විටත් පිළිතුරු සපයා නොතිබුණි. |
| (iv) මුදල් රෙගුලාසි 396 (ඈ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින දක්වා මාස 06 ට වැඩි කාලයක් ගෙවීම් සඳහා ඉදිරිපත් නොකළ රු.599,321 ක චෙක්පත් 97 ක් සම්බන්ධයෙන් රෙගුලාසිය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. 2015 මාර්තු බැංකු සැසැඳුම අනුව ඉහත චෙක්පත් වලින් රු 584,570 ක් වූ චෙක්පත් 89 ක් එලෙසම පැවතුණි. |
| (v) මුදල් රෙගුලාසි 371(2)(ආ) | සමාලෝචිත වර්ෂයේදී, රු.20,000 සීමාව ඉක්මවා රු.22,500 ක සිට රු.249,000 ක් දක්වා පරාසයක අවස්ථා 60 කදී රු.3,246,907 ක් අත්තිකාරම් ලෙස ලබාදී තිබුණි. |
| (vi) මුදල් රෙගුලාසි 371(2)(ඇ) | ලබාගත් අත්තිකාරම් රු.706,476 ක් අදාළ කාර්යය නිමවී මාස 02 ක සිට 05 ක් දක්වා කාලයක් ප්‍රමාද වී නිරවුල් කළ අවස්ථා 20 ක් නිරීක්ෂණය විය. |
| (vii) මුදල් රෙගුලාසි 371(5) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පෙර පියවිය යුතුව තිබුණු රු.473,130 ක අත්තිකාරම් 2015 මාර්තු 31 දින වන විටත් නිරවුල් කර නොතිබුණි. |
| (viiii) මුදල් රෙගුලාසි 1645 හා 1646 | වාහන ධාවන සටහන්පත් හා මාසික සාරාංශ ආයතනයේ ප්‍රධානියා මාර්ගයෙන් විගණකාධිපති වෙත එවිය යුතු නමුත් ඒ අනුව කටයුතු කර නොතිබුණි. |

| | |
|---|---|
| (ix) මුදල් රෙගුලාසි 1645 (ආ) | පොදු 267 නියමිත ආකෘතියයේ ලොග් පොත් 2006 වර්ෂයෙන් පසුව යාවත්කාලීනව පවත්වාගෙන ගොස් නොතිබුණි. |
| (x) මුදල් රෙගුලාසි 1647(ඇ) | වාහන අළුත්වැඩියාවේදී ඉවත් කරන අමතර කොටස් පිළිබඳ වාර්තා පවත්වා නොතිබුණු අතර, ඒවා නැවත ගබඩාවට භාරදීම සම්බන්ධයෙන්ද විධිමත් ක්‍රමවේදයක් අනුගමනය කර නොතිබුණි. |
| (ආ) 2003 ජූනි 02 දිනැති අංක පීඊඩී 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 4.2.2 ඡේදය | මාසික මුදල් ප්‍රවාහ ප්‍රකාශ , ද්‍රවශීලතා තත්ත්වය හා ණයගැනීම් පිළිබඳ වාර්තා පිළියෙල කර සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩලයෙහි අවධානයට යොමුකර නොතිබුණි. |

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

සංස්ථාවේ සමාලෝචිත වර්ෂය සඳහා මූල්‍ය ප්‍රතිඵලය රු.50,629,337 ක බදු පූර්ව අලාභයක් වූ අතර එයට අනුරූපීව ඉකුත් වර්ෂයේ බදු පූර්ව අලාභය රු.139,931,525 ක් වූයෙන් මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.89,302,188 ක වර්ධනයක් පෙන්නුම් කෙරුණි. රජයේ ප්‍රාග්ධන ප්‍රදාන මත අත්පත් කරගත් වත්කම් සඳහා වූ රු.240,041,678 ක ක්‍රමක්ෂය සහ අයභාර වියදම් සඳහා රජයෙන් ලද රු.218,160,000 ක් දායකය වශයෙන් එකතුව රු.458,201,678 ක් ආදායම් ලෙස හඳුනා ගැනීම නිසා සමාලෝචිත වර්ෂයේ අලාභය මෙම ප්‍රමාණය දක්වා අඩුවීමට ප්‍රධාන හේතුව වී තිබුණි.

### 3.2 කාරක ප්‍රාග්ධන කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) වැදගත් අනුපාත විශ්ලේෂණයන් පහත දැක්වේ.

| අනුපාත | 2014 | 2013 |
|---|---|---|
| <u>ද්‍රවශීලතා</u> | | |
| (i) ජංගම | 0.74:1 | 0.61 : 1 |
| (ii) ක්ෂණික | 0.66:1 | 0.51 : 1 |
| <u>ලාභදායිත්ව</u> | | |
| (i) දළ ලාභය (සියයට) | 26.92 | 30.78 |
| (ii)ශුද්ධ අලාභය (සියයට) | (9.41) | (27.02) |

(ආ) ඉකුත් වර්ෂය සමඟ සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ දළ ලාභ අනුපාතය සියයට 31 සිට සියයට 27 දක්වා සියයට 04 කින් අඩුවී තිබුණු අතර ඉකුත් වර්ෂයට සාපේක්ෂව ශුද්ධ අලාභය සියයට 18 කින් අඩු වී තිබුණි.

(ඈ) ප්‍රධාන බැංකු ගිණුමේ සමාලෝචිත වර්ෂය තුළ දිගින් දිගටම වර්ධනය වූ අයිරාවක් පැවතීම නිසා සංස්ථාවට සමාලෝචිත වර්ෂය තුළදී බැංකු අයිරා පොළී වශයෙන් රු.5,683,109 ක් ගෙවීමට සිදුවී තිබුණි. මෙම තත්ත්වය ඉකුත් වර්ෂය හා සසඳන විට සියයට 103 ක වැඩිවීමක් බව නිරීක්ෂණය විය.

(ඇ) ණය අයකර ගැනීමේ කාර්යක්ෂමතාවයක් නොවීම සහ ජංගම වත්කම් යටතේ දක්වා තිබුණු රු. මිලියන 184 ක වත්කම් අඩු ද්‍රවශීලතාවයකින් යුක්ත වීම නිසා ඉහත දක්වා ඇති ජංගම හා ක්ෂණික අනුපාතයන් තවදුරටත් පිරිහීමට ලක්වී තිබුණි.

## 3.3 සංස්ථාවට එරෙහිව හෝ සංස්ථාව විසින් ආරම්භ කර ඇති නෛතික සිද්ධීන්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ ශ්‍රී ලංකා එංගලන්ත ක්‍රිකට් තරගාවලියේ ප්‍රචාරක අයිතිය සංස්ථාව විසින් විධිමත්ව ලබාගැනීමට කටයුතු නොකර ක්‍රිකට් ප්‍රචාරයේදී වෙළඳ දැන්වීම් ලබා ගැනීමට ප්‍රචාරක කටයුතු කිරීම නිසා විධිමත් ලෙස ප්‍රචාරක අයිතිය ලබාගත් ආයතනය රු.මිලියන 50 ක වන්දි මුදලක් ඉල්ලා නඩුවක් පවරා තිබුණි. ඒ සඳහා සංස්ථාවට රු.872,000 ක් නීතිඥ ගාස්තු ලෙස සමාලෝචිත වර්ෂයේදී ගෙවා තිබුණි.

(ආ) සංස්ථා වාහනයක ගමන් කිරීමේදී සිදු වූ හානියක් සම්බන්ධයෙන් රු.මිලියන 08 ක වන්දියක් ඉල්ලමින් සංස්ථා සේවකයෙකු විසින් දිසා අධිකරණයක නඩුවක් පවරා තිබුණි.

(ඇ) අලෙවි විධායක නිලධාරියෙකු විසින් සිදු කරන ලද රු.මිලියන 13.21 ක වංචාවකින් ගිණුම් පොත් හා ලේඛන විධිමත් පරිදි පවත්වා නොතිබීම නිසා රු.මිලියන 5.65 ක් පමණක් අයකර ගැනීම සඳහා අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් නඩුවක් පවරා තිබුණි. පසුව ඉතිරි රු.මිලියන 7.56 ක මුදල අයකර ගැනීමට සංස්ථාව විසින් කොළඹ වාණිජ මහා අධිකරණයේද නඩුවක් පවරා තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කාර්යසාධනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ක්‍රියාකාරී සැලැස්ම කාර්යසාධනය මැන බැලිය හැකි ආකාරයෙන් සකස් කර නොතිබීම නිසා සංස්ථාවේ කාර්යසාධනය ඇගැයීමට ලක්කළ නොහැකි විය

(ආ) 2003 ජූනි 02 දිනැති අංක පීඊඩී 12 දරන යහපාලනය පිළිබඳ රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 4.2.2 අනුව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සංයුක්ත සැලැස්ම, අයවැය හා කාර්යසාධනය කාලීනව විමර්ශනය කොට තථ්‍ය කාර්යසාධනය සැලසුම්ගත කාර්යසාධනයෙන් වෙනස් වන්නේදැයි පරීක්ෂා කොට ඒ අනුව සංයුක්ත සැලැස්ම හා අයවැය වෙනස් කළයුතු වුවත් එවැනි අධීක්ෂණයක් කර නොතිබුණි.

4.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සංස්ථාවට අයත් නිවහන නිවාඩු නිකේතනය බදු දීම වෙනුවෙන් 2005 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂයේ පෙබරවාරි දක්වා ගිවිසුම් ප්‍රකාරව අයවිය යුතු රු. 7,210,000 ක බදුකුලී 2015 ජූලි අවසානය දක්වාම අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. එසේම, බදු ගැණුම්කරුගෙන් දේපළෙහි අයිතිය නැවත ලබා ගැනීමට 2010 වර්ෂයේ සිට වැය කර තිබුණු රු.2,151,206 ක නඩු ගාස්තු 2015 ජූනි 30 දක්වාම අයකර ගැනීමට අවශ්‍ය කටයුතු කර නොතිබුණි.

(ආ) සංස්ථාවේ ගුවන් විදුලි සේවාවන් ස්වයංක්‍රියකරණය කිරීමේ කටයුතු 2008 වර්ෂයේ ආරම්භ කර තිබූ අතර, 2012 මැයි 14 වන විට රු.3,400,000 ක මුදලක් වැය කර තිබුණි. 2015 ජූලි මස වන විටද මෙම ක්‍රියාවලිය සම්පූර්ණ නොකිරීම නිසා මේ මගින් ලබාගැනීමට අපේක්ෂිත වාසි ලබා ගැනීමට සංස්ථාවට නොහැකිව තිබුණි.

(ඇ) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයට පටහැනිව හදිසි මිලදීගැනීම් ලෙස සමාලෝචිත වර්ෂයේ අවස්ථා 14 කදී රු.13,951,244 ක් වටිනා මිලදී ගැනීම් විද්‍යුත් තැපැල් පැවරුම් ක්‍රමය මගින් සිදුකර තිබුණි. නමුත් එසේ ඇණවුම් කළ භාණ්ඩ ලැබීමට මාස 02 ත් මාස 09 ත් අතර කාලයක් ගතවී තිබුණි. මෙයින් එකතුව රු. 6,860,574 ක් වූ මිලදී ගැනීම් 3ක් රු.මිලියන 2 ක් ඉක්මවූ මිලදී ගැනීම් වන අතර එකතුව රු. 3,943,046 ක් වූ මිලදී ගැනීම් 3ක් රු.මිලියන 1 ඉක්මවූ මිලදී ගැනීම් විය. සංස්ථාව වෙත ලැබී තිබුණු භාණ්ඩ අදාළ පිරිවිතරයන් හා ගැලපේද යන්න පිළිබඳව සහතිකයක් ලබාගෙන නොතිබුණි. .

(ඈ) සංස්ථාව විසින් රු.860,000 ක් ගෙවා මිලට ගෙන තිබුණු නිවාස දෙකක් පැවරුම් සහතික ලබාගෙන නිසි පරිදි අයිතිය ලබාගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඉ) සංස්ථාව සතු නිල නිවාස 22 කින් නිවාස 03 ක් ශ්‍රී ලංකා යුධ හමුදාව විසින් භාවිතා කරනු ලබන අතර, තවත් නිවාස 02 ක් සංස්ථාවේ සේවකයින් නොවන පුද්ගලයින් විසින් භාවිතා කරනු ලබන බවත් නිරීක්ෂණය විය. අනුරාධපුර නගර සීමාවේ පිහිටා තිබූ අධ්‍යක්ෂ බංගලාව ප්‍රයෝජනයට නොගැනීම හේතුවෙන් අනාරක්ෂිතව පැවතීම නිසා කඩා ඉවත් කිරීමට සිදුවී තිබුණි. තවත් නිවාස 03 ක් භාවිතයෙන් තොරව අනාරක්ෂිතව පවතී.

ඊට අමතරව නිල නිවාස කාර්ය මණ්ඩලයේ නිලධාරීන්ට ලබාදීමද විධිමත් ක්‍රමවේදයක් යටතේ සිදුකර නොතිබුණි. දැනට නිල නිවාසවල පදිංචිව සිටින නිලධාරීන් හා ඔවුන්ට එම නිවාස ලබාදුන් ආකාරය හා කුලී අයකරනවාද යන්න තහවුරු කිරීමට අවශ්‍ය උපයෝගී ලියවිලි හෝ වාර්තා නඩත්තු කර නොතිබුණි.

(ඊ) ජංගම වගකීම් යටතේ දක්වා තිබුණු උපචිත වියදම්වල වසර 2 ත් 10 ත් අතර වූ රු.135,375,722 ක උපචිත වියදම් ද ඇතුළත් කර තිබුණි. එසේම වගකීම් කාලය ඉක්මවා ඇති හෝ තථ්‍ය වගකීමක් නොමැති වියදම් විශ්ලේෂණය කර පොත්වලින් ලියාහැරීමට පියවර ගෙන නොතිබුණි.

(උ) ගුවන්කාල ණයහිමි උපලේඛණය අනුව 2014 දෙසැම්බර් 31 දිනට රු.1,269,922 ක් ගෙවිය යුතු ලෙස සඳහන් ගණුදෙනුකරුවෙකු වෙත වෙළඳ අංශය මගින් රු.136,969 ක බැර ශේෂයක් පවතින බව ලිපියක් මගින් දන්වා තිබුණි.

(ඌ) සමාලෝචිත වර්ෂයට අදාළව වෙළඳ අංශය මගින් ඉන්වොයිසි නිකුත්කර ඇති ගිවිසුම් තුනක් සඳහා ගිණුම් අංශය මගින් ප්‍රචාරණ උපලේඛණ පදනම්කර විකුණුම් නොමැති ලෙස සටහන්වී තිබුණි.

4.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) පුත්තූර්හි ඇන්ටනා කුළුණු ඉදිකිරීමට අදාල ව්‍යාපෘතිය අත්හැර දැමීමෙන් රු. මිලියන 9.2 ක අලාභයක් සංස්ථාවට සිදුව තිබුණි. කොන්ත්‍රාත්තුව භාරදුන් හස්ත කර්මාන්ත මණ්ඩලයට ඉදිකිරීම් කටයුතු කරගෙන යාමේ හැකියාවක් නොවීම හා රු. 5,024,998 ක මුදලක් යකඩ සඳහා එම ආයතනයට සාවද්‍යව ගෙවා තිබීම හා අත්තිකාරම් ගෙවීම මෙයට හේතුවී තිබුණි. ඉහත සම්පූර්ණ අලාභයෙන් රු 4,348,041 ක් නැවත ගෙවීමට 2014 ජූලි 16 දින එහි සභාපති විසින් එකගවී 2015 සැප්තැම්බර් වන විට නැවත ගෙවා තිබුණි. නමුත් ඉතිරි අලාභය අයකර ගැනීම සඳහා හා අදාල ගිවිසුමට ඇතුලත්වීමේදී ඉදිකිරීම් කටයුතු කරගෙනයාමේ හැකියාව වරදවා දැක්වීම හා හස්ත කර්මාන්ත මණ්ඩලය වෙනුවෙන් බාහිර පුද්ගලයෙකු අත්සන්කර වංචාවක් සිදුකර තිබීම සම්බන්ධව නීතිමය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ආ) සංස්ථාවේ විකාශනාගාර කුළුණෙහි පොලිස් රේඩියෝ ඇන්ටනාවක් සවිකර තිබුණ අතර එය පැය 24 පුරාම ක්‍රියාත්මක වන බවත් ඊට අවශ්‍ය විදුලිබලය සංස්ථාවට අයත් විදුලි පරිපථය හරහා සපයා තිබුණි. ඇන්ටනාව වෙනුවෙන් වැය වූ විදුලි ඒකක ප්‍රමාණය ඇස්තමේන්තු කිරීමක් හෝ ගණනය කිරීමක් කර අයකර ගැනීමට මේ දක්වා කටයුතු කර නොතිබුණි.

(ඇ) ගුවන් විදුලි සම්ප්‍රේෂණ කුළුණු බදු දීමේ ගිවිසුම්වලට අනුව සංස්ථාව විසින් රු. 100,000 ක් බැගින් 16 දෙනෙකුගෙන් රු.1,600,000 ක තැන්පත් මුදලක් අදාල බදුකරුවන්ගෙන් අයකරගත යුතුව තිබුණද, එම තැන්පතු අයකර නොතිබුණි.

4.4 හඳුනාගන්නා ලද පාඩු

------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) විශ්‍රාම ගිය සේවකයන් වෙනුවෙන් පාරිතෝෂික අඩුවෙන් ගෙවා තිබීම නිසා කම්කරු දෙපාර්තමේන්තුවේ නියෝග මත සමාලෝචිත වර්ෂයේදී රු.1,218,609 ක අධිභාරයක් ගෙවීමට සිදුවී තිබුණි.

(ආ) ආර්ථික සේවා ගාස්තු නියමිත දිනට ප්‍රේෂණය නොකිරීම නිසා 2004/2005 තක්සේරු වර්ෂයේ සිට 2013/2014 දක්වා හිඟ බදු මත රු.11,979,867 ක අධිභාරයක් පනවා තිබුණි. මෙම අධිභාරය 2015 මැයි 31 දින දක්වාම ගෙවා නොතිබුණි.

(ඇ) 2011 වර්ෂයේදී බාහිර ප්‍රචාරක අංශයෙහි සිදුකරන ලද භාණ්ඩ සමීක්ෂණ වාර්තාවට අනුව හානිවූ සහ අස්ථානගත වූ වර්ග 21කට අයත් භාණ්ඩ 77ක් සම්බන්ධයෙන් වටිනාකම හඳුනාගෙන පොත්වලින් ඉවත්කිරීමට හා මුදල් රෙගුලාසි 101හා 113 ප්‍රකාරව අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට මෙම වාර්තාවේ දින දක්වා කටයුතු කර නොතිබුණි.

(ඇ) සංස්ථාවට අයත්ව තිබුණු වීරකැටිය විකාශනාගාරයේ අක්කර 30 ක ඉඩමක් සහ මහව විකාශනාගාරයේ අක්කර 68 ක් හා සංස්ථාව විසින් ඉදිකරන ලද ගොඩනැඟිලි රජයට පවරා දී තිබුණද, එම ඉඩම්වල වර්තමාන වෙළෙඳපල වටිනාකම වෙනුවෙන් වන්දි අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඉ) වීරකැටිය විකාශනාගාරයේ ඉඩම අක්කර 30 ක් සාගර විශ්වවිද්‍යාලයට හා යොවුන් සේනාංක වැඩසටහනට නිදහස් කර තිබුණ ද සංස්ථාව විසින් මිලට ගෙන තිබුණු එම ඉඩමේ හා ගොඩනැඟිලිවල වර්තමාන වටිනාකම අයකර ගැනීමට මේ දක්වා කටයුතු කර නොතිබුණි.

## 4.5 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු

අමාත්‍යාංශයේ උපදෙස් අනුව කටයුතු නොකර 2012 වර්ෂයේදී ප්‍රතිවිකාශන මධ්‍යස්ථාන සඳහා වැඩසටහන් සම්බන්ධ කිරීමට මූලිකව රු. මිලියන 15 ක් හා මාසිකව රු.400,000 ක බදු මුදලකට යටත්ව පුද්ගලික ආයතනයකින් තාක්ෂණික සහය ලබාගෙන තිබුණි. මෙම බදු මුදල සමාලෝචිත වර්ෂයේදී රු.510,204 ක් දක්වා වැඩිකර තිබුණ ද ලබාදී තිබුණ සම්බන්ධතාව ඇතිකිරීම කඩින් කඩ අකර්මන්‍ය වන බැවින් ලබාදී තිබුණු සේවාව කාර්යක්ෂම නොවන බව නිරීක්ෂණය විය. එසේ වුවත් 2000 වර්ෂයේදී ස්ථාපනය කරන ලද නිසිපරිදි ක්‍රියානොකරන බව දැන්වූ රු.45,175,730 ක් වටිනා මයික්‍රො ලින්ක් පද්ධතිය අළුත්වැඩියා කර භාවිතයට ගැනීමට හෝ සංස්ථාවට ගැලපෙන ස්ථාවර පද්ධතියක් ලබා ගැනීමට 2015 ජූනි දක්වාම කළමනාකරණය විසින් කටයුතු කර නොතිබුණි.

## 4.6 විධිමත් පරිදි පවරා නොගත් ඉඩම්/දේපලවල ව්‍යාපෘති ආරම්භ කිරීම

නුවරඑළිය දිස්ත්‍රික්කයේ හාවා එළිය ග්‍රාම නිලධාරි කොට්ඨාශයට අයත් රූඩ් 01 පර්චස් 20 ක භූමි ප්‍රදේශයක පිහිටි නිවහන නිවාඩු නිකේතනය ගොඩනැඟිල්ලෙහි අයිතිය පමණක්, රු.250,000 ක මුදලක් ගෙවා 1979 වර්ෂයේදී සංස්ථාව මිලදී ගෙන තිබුණි. 1987 ජනවාරි 08 දිනැති නුවරඑළිය අතිරේක දිසාපති හා නියෝජ්‍ය ඉඩම් කොමසාරිස්ගේ ලිපියට අනුව අවුරුද්දකට රු.6,000 බැගින් 1985, 1986 හා 1987 වර්ෂයන් සඳහා බදු මුදල් ගෙවා අදාල ඉඩමෙහි බදු අයිතිය ලබාගන්නා මෙන් දන්වා තිබු නමුත් මුදල් ගෙවා ඉඩමෙහි බදු අයිතිය 2015 ජූනි 30 දක්වාම ලබාගෙන නොතිබුණි.

## 4.7 වෙනත් රාජ්‍ය ආයතන වෙත ලබා දුන් සංස්ථාවේ සම්පත්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ඒකල විකාශනාගාරය පිහිටා තිබුණු ඉඩමෙන් අක්කර 12ක පමණ භූමි භාගයක සංස්ථාවට අයත් නොවන යන්ත්‍ර සූත්‍ර විශාල ප්‍රමාණයක් නවතා තිබුණි. ඊට අමතරව සංස්ථාවේ ජලය හා විදුලිය බාහිර පුද්ගලයින් විසින් භාවිතා කර තිබුණි. සංස්ථාවේ වත්කම් පරිහරණය කරන බාහිර පුද්ගලයින් පිළිබඳ තොරතුරු හා ඔවුන් විසින් පරිහරණය කළ ජලය හා විදුලිය වෙනුවෙන් සංස්ථාව වැය කළ මුදල ගණන් බලා හඳුනාගෙන ඒ අයගෙන් අයකර ගැනීමට සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින දක්වාම කටයුතු කර නොතිබුණි.

(ආ) සැලසිනෝ ආයතනය පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය ගොඩනැඟිලි පහසුකම් සංස්ථාව මඟින් 2004 වර්ෂයේ සිට 2014 අප්‍රේල් දක්වා සපයා තිබුණු අතර, ඒ සඳහා ගිවිසුම්ගත එකඟතාවයක් ඇතිකරගෙන නොතිබුණි. ගොඩනැඟිලි කුලී වශයෙන් කිසිදු ගාස්තුවක් අයකර නොතිබුණු අතර ජල පහසුකම් සැපයීම සඳහාද 2004 සිට 2014 අප්‍රේල් දක්වාම කිසිදු මුදලක් එම ආයතනයෙන් අයකර නොතිබුණි.

4.8 **කාර්ය මණ්ඩල පරිපාලනය**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2006 සැප්තැම්බර් 22 දිනැති අංක 30 දරන කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු චක්‍රලේඛ විධිවිධානවලට අනුගත වන පරිදි බඳවාගැනීමේ හා උසස්වීමේ පරිපාටි සකස්කර අනුමැතිය සඳහා අමාත්‍යාංශය වෙත එවන ලෙස කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව දන්වා තිබුණද, 2015 ජූනි 30 දින වන විටත් අමාත්‍යාංශ ලේකම් වෙත බඳවාගැනීමේ පරිපාටිය ඉදිරිපත් කර නොතිබුණි.

(ආ) බඳවා ගැනීමේ පරිපාටිය අනුමත කරවා ගැනීමෙන් තොරව සේවකයන් බඳවා නොගත යුතු බව දක්වා තිබියදී කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ නියමයට පටහැනිව අනුමැතියකින් තොරව 2012 , 2013 හා 2014 වර්ෂවලදී ස්ථිර සේවකයන් 160 ක් සහ කොන්ත්‍රාත් පදනමින් සේවකයන් 90 ක් බඳවාගෙන තිබුණි.

(ඇ) 2004 වසරේ නියමිත බඳවාගැනීමේ පරිපාටිය අනුගමනය කර අයදුම්පත් කැඳවා එම වර්ෂයේ ජූලි 01 දින අධ්‍යක්ෂ (සංගීත) තනතුර සඳහා බඳවාගත් නිලධාරියාට අධ්‍යක්ෂ තනතුරක් නොමැති කැසට්පටි විකුණුම් අංශය භාරදී තිබුණ අතර, අධ්‍යක්ෂ (සංගීත) තනතුර සඳහා අයදුම්පත් ඉදිරිපත් නොකළ හා එම අධ්‍යක්ෂ තනතුර සඳහා සුදුසුකම් නොමැති නිලධාරියකු වැඩ බැලීම සඳහා 2009 වසරේ පත්කර තිබූ අතර 2015 ජූනි දක්වාම එය නිවැරදි කර නොතිබුණි.

(ඈ) ඉදිරිපත් කළ තොරතුරුවලට අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට සංස්ථාවේ ස්ථිර කාර්ය මණ්ඩලය 886 ක් වෙනුවෙන් සහ කොන්ත්‍රාත් පදනම මත නියුක්ත නිලධාරීන් 3 ක් වෙනුවෙන් රු.383,304,981 ක් ද, සහන කාර්ය මණ්ඩලයට රු.33,771,360 ක්ද වැටුප් හා වේතන ලෙස ගෙවා තිබුණි. ස්ථිර කාර්ය මණ්ඩලය අතිරික්තව සිටියදී සහන කාර්ය මණ්ඩලයේ සේවය සහ කොන්ත්‍රාත් පදනම මත සේවය ලබාගැනීම ගැටළු සහගත වේ.

(ඉ) සංස්ථාවේ ප්‍රධාන මාණ්ඩලික තනතුරු 03ක් එනම්, නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (මුදල්), නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (ඉංජිනේරු) හා නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (පාලන) යන තනතුරු දිගුකාලයක සිට පුරප්පාඩුව පවතින අතර, නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (පාලන) තනතුර සඳහා 2012 ජූලි 06 දින සිට 2014 දෙසැම්බර් 31 දක්වා කොන්ත්‍රාත් පදනම මත බඳවාගත් නිලධාරියකු සේවයේ යොදවා තිබුණි.

(ඊ) පැවරුම් පදනම මත බඳවාගෙන තිබුණු නිලධාරීන් 15 දෙනෙකු හා උපදේශකවරයෙකුගේ සේවා කාලය සමාලෝචිත වර්ෂයේදී අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය පමණක් ලබාගෙන දීර්ඝ කර තිබුණි. ඔවුන්ගේ කාර්යසාධනය පරීක්ෂා කිරීමකින් තොරව දීමනා වශයෙන් රු.4,685,000 ක් ගෙවා තිබුණි. එසේම උපදේශකවරුන්ගේ සේවා කාලය දීර්ඝ කිරීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාගෙන නොතිබුණි.

(ඊ) නිලධාරීන් සඳහා ප්‍රධාන කාර්යාලය තුළ හා ප්‍රාදේශීයව සිදුකරන ලද රාජකාරි පැවරුම් ලිපි පිටපත් විගණනයට ඉදිරිපත් නොකරන ලද අතර පරීක්ෂා කරන ලද පුද්ගලික ලිපිගොණු අනුව රාජකාරි පැවරුම් නිසියාකාරව සිදුකර නොතිබුණි.

## 5 ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

### 5.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2003 ජූනි 02 දිනැති අංක පීඊඩී 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 වගන්තිය ප්‍රකාරව ගිණුම් වර්ෂය අවසන්වී දින 60 ක් ඇතුළත මූල්‍ය ප්‍රකාශන විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත්, මූල්‍ය ප්‍රකාශන විගණකාධිපති වෙත ඉදිරිපත් කර තිබුණේ 2015 මැයි 08 දිනදීය.

### 5.2 සංයුක්ත සැලැස්ම

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2003 ජූනි 02 දිනැති අංක පීඊඩී 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 5.1.2 ඡේදය ප්‍රකාරව 2012-2016 සංයුක්ත සැලැස්ම පිළියෙල කර නොතිබුණි.

(ආ) ඉහත චක්‍රලේඛයේ 5.1.3 වගන්තිය සහ 2007 දෙසැම්බර් 18 දිනැති පීඊඩී 47 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය ප්‍රකාරව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද සංයුක්ත සැලැස්ම හා යාවත්කාලීන කරන ලද අයවැය ලේඛනය රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවට හා භාණ්ඩාගාරයට ඉදිරිපත් කළ යුතු වුවත් එසේ අනුමත කර ඉදිරිපත් කර නොතිබුණි.

### 5.3 ක්‍රියාකාරී සැලැස්ම

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ක්‍රියාකාරී සැලැස්ම සංයුක්ත සැලැස්මට අනුකූලව සකස් කළයුතු වුවත්, සංයුක්ත සැලැස්මේ ඇතුළත් කර තිබුණු අංශ 05 ක් ක්‍රියාකාරී සැලැස්මේ සඳහන් කර නොතිබුණ අතර, ඉදිරිපත් කර තිබූ අංශවල ඇතැම් ක්‍රියාකාරකම්ද ඇතුළත් කර නොතිබුණි.

(ආ) ක්‍රියාකාරී සැලැස්මෙහි ඇතුළත්වූ අංශ 5න් අංශ 3 ක් යටතේවූ ක්‍රියාකාරකම් 41 කින් ක්‍රියාකාරකම් 07 ක් ක්‍රියාත්මක කර නොතිබුණි.

### 5.4 අභ්‍යන්තර විගණනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) අභ්‍යන්තර විගණන අංශය විසින් 2011 වර්ෂය සඳහා විගණන විමසුම් 20 ක් ද, 2012 වර්ෂය සඳහා විගණන විමසුම් 25 ක් ද, 2013 වර්ෂය සඳහා 30 ක් ද සමාලෝචිත වර්ෂය සඳහා 25ක්ද වශයෙන් විගණන විමසුම් 100 ක් නිකුත් කර තිබුණද, කළමනාකරණය විසින් 2015 ජූනි 30 වන විට එම විමසුම්වලින් 20 කට පමණක් පිළිතුරු ලබාදී තිබුණි.

(ආ) අනුමත කාර්ය මණ්ඩලයට අනුව අභ්‍යන්තර විගණන අංශයේ ස්ථිර විගණන සහායක තනතුරු 04ක් පැවතියද, 2014 දෙසැම්බර් 31 දිනට විගණන සහායකයන් දෙදෙනකු පමණක් සේවයේ යොදවා තිබුණි.

5.5 විගණන කමිටු

2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 7.4.1 වගන්තිය ප්‍රකාරව කමිටු අවම වශයෙන් විධායක නොවන අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් තිදෙනකුගෙන්වත් සමන්විත විය යුතු වුවත්, ඉන් බැහැරව පැවරුම් පදනම මත සංස්ථාවේ සේවයේ යෙදී සිටිය අධ්‍යක්ෂවරයකුද සහභාගී වී තිබුණි.

5.6 වාර්ෂික වාර්තා සභාගත කිරීම

2012 වර්ෂයේ වාර්ෂික වාර්තාව 2015 ජුනි 31 දින වන විටත් පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි.

5.7 නොවිසඳී ඇති විගණන ඡේද

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 1996 වර්ෂයේදී මීටර් 60 ක් හා මීටර් 100 ක් උස ඇන්ටනා කුළුණු 2ක් ගෙන්වීම සඳහා රු.23,119,683 ක් වැයකර තිබුණු අතර, කුළුණු සවිකිරීම සඳහා පෞද්ගලික ආයතනයකට අත්තිකාරම් ලෙස රු.2,568,000 ක් ගෙවා තිබුණි. සවිකළ යුතු ස්ථාන තීරණය කර නොතිබුණු බැවින් සමාලෝචිත වර්ෂය අවසාන වනවිටත් එම කුළුණු සවිකර නොතිබුණි. තවද මෙම සම්පූර්ණ වටිනාකම 2010 වර්ෂය වනතෙක් කෙරීගෙන යන ගිණුම යටතේ ගිණුම්ගත කර පසුව 2010 වර්ෂය අවසානයේදී නිවැරදි පදනමකින් තොරව වත්කම් (Audio Frequency) ගිණුම යටතේ ගිණුම්ගත කිරීමද නිවැරදි කර නොතිබුණි.

(ආ) කොන්ත්‍රාත් 32 ක් මෙහෙයවා තිබුණු අලෙවි විධායක විසින් රු.6,356,853 ක් වටිනා මුදලක් වංචාකර ඇති බව හඳුනාගෙන තිබුණත්, රු.945,000 ක් පමණක් අයකර ගැනීමට පොලීසියෙන් නඩු පවරා තිබුණු අතර අයවිය යුතු එම ඉතිරි මුදල අයකර ගැනීම සඳහා 2014 ජූලි 24 දින වනවිටත් නීතිමය පියවර ගැනීමට කටයුතු කර නොතිබීම.

5.8 පාරිසරික හා සමාජ වගකීම් ඉටු කිරීම

විකාශනයන්හි ශ්‍රවණ තත්ත්වය පිළිබඳ පැමිණිලි ඉදිරිපත් කිරීමට නියමිත ඒකකයක් සංස්ථාව තුළ ස්ථාපනය කර නොතිබුණු අතර, ශ්‍රාවකයන්ගෙන් සංස්ථාවට ලැබෙන පැමිණිලි ලේඛණගත කිරීම සංස්ථාවේ කිසිදු අංශයකින් සිදුකර නොතිබුණි. පැමිණිලි ශ්‍රවණ පර්යේෂණ අංශය වෙත යොමුකර සුදුසු ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කළයුතු වුවත් මෙවැනි ක්‍රියාපිළිවෙතක් නොවීම නිසා සංස්ථාවට කාලීන පියවර ගැනීමට නොහැකි වී තිබුණි.

6. **පද්ධති හා පාලනයන්**

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලනයේ අඩුපාඩු වරින්වර සංස්ථාවේ සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත දැක්වෙන පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුය.

(අ) වත්කම් පාලනය
(ආ) ගුවන් කාල ආදායම්
(ඇ) ණයගැතියෝ
(ඈ) කාර්ය මණ්ඩලය පාලනය
(ඉ) කළමනාකරණ තොරතුරු
(ඊ) වෙළඳ දැන්වීම් නියෝජිත ආයතන ආදායම් පාලනය
(උ) ප්‍රසම්පාදන
(ඌ) අයවැය
(එ) ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම
(ඒ) අත්තිකාරම් ගෙවීම

ඩබ්ලිව්.පී.සී. වික්‍රමරත්න
විගණකාධිපති (වැඩබලන)

# 2014 විගණකාධිපති වාර්තාව සඳහා සංස්ථාවේ පරිකථනය

**ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාවේ 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක 38 දරණ මුදල් පනතේ 14 (2) (සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව**

ඉහත සඳහන් කරුණ පිළිබඳව ඔබගේ අංක ටීඑම්/ඩී/එස්එල්බීසී/1/14/316 හා 2015 ජූලි 15 දිනැති 14(2) සී කෙටුම්පත් වාර්තාව සම්බන්ධයෙනි.

වාර්තාවේ 1.2, 1.3 වගන්ති හි සඳහන් කරුණුවලට එකඟ වෙමි.

**2.2. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**2.2.1. ආයතනයේ අඛණ්ඩ පැවැත්ම**

මෙම ඡේදයේ සඳහන් පරිදි නිවැරදි අයිරාව මිලියන 36.7 සහ පොළිය 5,683,106/- කි.

ප්‍රවර්ථන වර්ෂය සඳහා ලැබී ඇති ප්‍රාග්ධන හා අයභාර වියදම ලෙස පෙන්වා ඇති රු.2,426,477,649/- වැරදිය. ලැබී ඇති මුදල 436,162,000/- ක් වේ.

සියලු රාජ්‍ය ආයතන භාණ්ඩාගාර ප්‍රතිපාදන මත පවත්වාගෙන යනු ලබන අතර සංස්ථාවේ පැවැත්ම පිළිබඳ අනිශ්චිතතාවයක් ඇත යන මතයට එකඟ නොවෙමි.

**2.2.2. ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත**

අ. *ප්‍රමිත අංක 05*

i. ආයෝජන ලෙස පෙන්වා ඇති 1,000,000/- ක මුදල ලංකා පුවත් ආයතනයේ ආයෝජනය කර ඇත්තේ එම ආයතනය ආරම්භ කිරීම සඳහා අමාත්‍යාංශය විසින් කරන ලද ඉල්ලීමක් අනුවය. තවද මෙය විකිණීමට හෝ වෙළෙඳපල අගය ගණනය කිරීමට හැකි ගනුදෙනු නොවන ආයතනයකි. එමනිසා අමාත්‍යාංශ විමසා තීරණයක් ගතයුතුය.

ii. මෙම විකුණා ඇති වත්කම් ඉතාමත් පැරණි ඒවා බැවින්, පිරිවැය වටිනාකම සහ ක්ෂය ගණනය කරගැනීමට අවශ්‍ය ලිපිලේඛන නොමැති නිසා ආදායම් ලෙස ගිණුම්ගත කර ඇත.

ආ. *ප්‍රමිත අංක 07 - හෙළිදරව් කර ඇත.*

ඇ. *ප්‍රමිත අංක 08*

i. ශ්‍රී ලංකා වාර්තාකරණ ප්‍රමිත අංක 08 අනුව පෙන්වා ඇත්තේ භූගෝලීය හා ආර්ථික සාධක පදනම් කරගනිමින් පවත්වාගෙන යනු ලබන ආයතන සම්බන්ධ ශාඛා ව්‍යාපාරවල වත්කම් වගකීම් සහ ආදායම් ප්‍රභවයන් මූල්‍ය ප්‍රකාශවලින් පැහැදිලි කළ යුතු බවය. එසේ වුවද ගුවන්විදුලි සංස්ථාව ප්‍රාදේශීය සේවාවන් පවත්වාගෙන යනු ලබන්නේ මුළු දිවයිනම ආවරණය වන පරිදි පැහැදිලි ශ්‍රවණ තත්ත්වයක් ලබාදීම සඳහා විකාශන මධ්‍යස්ථාන ලෙසය. මේවා වෙනම ගිණුම් ඒකක නොවේ. එමනිසා ඡේදයට එකගවිය නොහැකිය. ත්‍රිකුණාමල ඩොයිෂවෙල ප්‍රතිවිකාශනාගාරය ජර්මන් සමූහාණ්ඩුව යටතේ වෙනම ආයතනයක් ලෙස පවත්වාගෙන ගොස් සංස්ථාවට පැවරීම නිසා වෙනම ඒකකයක් ලෙස සලකා ආදායම් වෙන්ව ගිණුම්වල හෙළිදරව් කර ඇත.

ii. කොත්මලේ වෙනම ඒකකයක් ලෙස සලකා ලාභඅලාභ ගණනය කිරීමක් කර නොමැති බැවින්, එසේ පෙන්වීමේ අවශ්‍යතාවයක් නොතිබුණු අතර, ඡේදයේ සදහන් කරුණුවලට එකඟ විය නොහැක.

ඈ. *ප්‍රමිත අංක 01*

i. ඡේදයේ සඳහන් නිරීක්ෂණයට එකඟ වෙමි. ඒ ඒ වර්ෂවල දී සංස්ථාවට මුහුණදීමට සිදු වූ මූල්‍ය දුෂ්කරතා හේතුවෙන් ගෙවීම ප්‍රමාද කරන ලද මෙවැනි මුදල් කාලය ඉක්ම වූ පමණින්ම පොත්වලින් ලියා විගණනය මගින් යෝජනාකර ඇති පරිදි, පොත්වලින් ලියා තැබීමට හැකියාවක් නොමැත. ඉදිරි වර්ෂවල දී මෙය ගෙවීම සිදුවිය හැක.

ii. රඳවාගැනීමේ බදු ලෙස අඩුකරගත් මුදල ලැබිය යුතු මුදලක් බැවින් මූල්‍යමය නොවන වගකීම්වල අඩුකර පෙන්වා ඇත. එම වර්ෂවලදී ආදායම් බදු ගෙවීමට සිදු වූයේ නම් මෙම මුදල ගෙවූ ආදායම් බදු ලෙස අඩුකර ගැනීම හැර මුදලින් ආපසු ලැබීමක් සිදුනොවේ. එමනිසා ගිණුම්වල ඒ අන්දමින් හෙළිදරව් කිරීමෙන් වරදක් සිදුවී ඇති බව නොපෙනේ. මෙය මූල්‍යමය නොව, වගකීම් යටතේ අඩුකර පෙන්වා ඇත.

ඉ. *ප්‍රමිත අංක 05*

විකුණා ඇති වත්කම් ඉතාමත් පැරණි ඒවා වන අතර වෙන් වෙන් වශයෙන් හදුනාගත නොහැකි ලී බඩු උපකරණවල කොටස් බැවින් පිරිවැය වටිනාකම සහ ක්ෂය ගණනය කරගැනීම අපහසු නිසා ගිණුම්වල වෙන්කර දැක්වීමට නොහැකි විය. මෙම කරුණු 2013 වර්ෂයේ දී ද පැහැදිලි කර ඇත.

ඊ. *ප්‍රමිත අංක 07*

පෙර වර්ෂ සදහා කරන ලද ගැලපීම් කිහිපියක ප්‍රතිඵලයක් ලෙස මෙම වෙනස පවතින බව පිලිගනිමි.

උ. *ප්‍රමිත අංක 12*

ප්‍රමිතය මගින් පැහැදිලිකර ඇති ඡේදය ලෙස පෙන්වා ඇති බව පෙනේ. අපේක්ෂිත කරුණ අපහැදිලිය. එමනිසා නිශ්චිත පිළිතුරක්දීම අපහසුය.

ඌ. *ප්‍රමිත අංක 17*

කල්බදු ක්‍රමය මත ගත් වාහනවල වටිනාකම ගිනුම්වල දක්වා ඇතතේ පිරිවැය මිල හා ගෙවිය යුතු පොළිය ඇතුළත් වටිනාකම අනුවය. සාධාරණ අගය ලෙස ගණනයකර පෙන්වා ඇති රු.55,119,210/- වැරදිය. එමනිසා මෙම ඡේදයට එකඟ විය නොහැක.

එ. *ප්‍රමිත අංක 18*

i. ගුවන්විදුලි සංස්ථාවේ ගුවන්කාල ආදායම ගිණුම්ගත කරනු ලබන්නේ ප්‍රචාරක උපලේඛන පදනම් කරගෙනය. අලෙවි අංශය ඇතිකර ගන්නා ගිවිසුම අනුව වෙළෙඳ දැන්වීම් ප්‍රචාරය කරනු ලබන අතර එය ප්‍රචාරය කිරීමෙන් පසු නිවේදකගේ උපලේඛනය අනුව ගුවන් කාල ආදායම හදුනාගෙන ගිණුම්ගත කරනු ලැබේ. විගණනය විසින් පෙන්වාදෙනු ලබන නිර්ණායකයන් නොසලකා හැර ගුවන්කාල ආදායම ගිණුම් ගතකර ඇත යන මතයට එකග විය නොහැක. 2013 වර්ෂයේ දී ද මේ පිළිබඳ කරන පැහැදිලි කිරීම්, පිළිගෙන නැති බව ද පෙනේ.

ii. ඡේදයෙන් හදුන්වා දී ඇති පරිදි දීර්ඝකාලීන වෙළෙද දැන්වීම් ප්‍රචාරය වෙනුවෙන් ඇතිකර ගන්නා ගිවිසුම් අනුව වර්ෂයට අදාළව අයවිය යුතු මුදල් ප්‍රචාරන උපලේඛන අනුව ගිණුම්ගත කෙරේ. ඉදිරියට ප්‍රචාරය කිරීමට අපේක්ෂිත වෙළෙද දැන්වීම්වලින් ලැබිය යුතු ආදායම හඳුනාගෙන ලැබිය යුතු ආදායමක් ලෙස මූල්‍ය ප්‍රකාශනවලින් හෙළිදරව් කිරීම පලදායී වැඩපිළිවෙලක් නොවේ. එම නිසා ඡේදයට එකඟ විය නොහැක.

ඒ. *ප්‍රමිත අංක 19*

මූල්‍ය වාර්තාවේ 3.2.1 (A) ඡේදය යටතේ සටහන් මගින් මේ සම්බන්ධයෙන් පැහැදිලි කිරීමක් කර ඇත.

ඔ. *ප්‍රමිත අංක 20*

සමාලෝචිත වර්ෂය තුළ දී ප්‍රාග්ධන හා අයභාර වියදම් සඳහා සංස්ථාව වෙත ලැබී ඇතැයි සඳහන් රු.2,426,472,649/- සාවද්‍ය වේ. ලැබී ඇති රාජ්‍ය ප්‍රාග්ධනය රු.436,162,000.00 කි. ක්‍රමක්ෂය සඳහා උපලේඛන අවසන් ගිණුම් සමඟ ඉදිරිපත් කර ඇත.

ඕ. *ප්‍රමිත අංක 21 **i,ii,iii***

විදේශ ණයගැතියන් වශයෙන් ලැබිය යුතු ඩො. 1,040,089.87 වැරදිය. ඉන්දියන් රුපියල් වලින් ඇති 547,717.99 ක ණයගැති ශේෂයන් ද ඩොලර් අගයන් හා එකතුකර දක්වා ඇත. 2000 වර්ෂයේ සිටි 2013 දක්වා පවතින ණයගැති වටිනකම ඒ ඒ වර්ෂවල පැවති විනිමය අනුපාතිකයට අනුව ගණනය කර ගිණුම්වල දක්වා ඇති අතර මෙයින් වැඩි කොටසක් අයකර ගත නොහැකි ණය බවද සඳහන් කරනු කැමැත්තෙමි. යොජනා කරන පරිදි අය නොවන ණය වර්තමානයේ පවතින අගයට ගණනය කර ගිණුම් තැබීම මගින් විශාල බදු මුදලක් ද ගෙවීමට සිදුවනු ඇත. මෙම කරුණු 2013 වර්ෂයේ ද පැහැදිලි කර ඇත. එමනිසා මෙම ඡේදයට කිසිසේත් එකගවිය නොහැක. මෙසේ අය නොවන ණය වර්තමාන අගයට ගණනය කිරීමෙන් විශාල ලෙස බදු ගෙවීම්වලට බැදේ.

ක. *ප්‍රමිත අංක 24*

i. වාර්තාවේ පෙන්වා ඇත්තේ වර්තමාන අධ්‍යක්ෂ මණ්ඩලය බව පිළිගන්නා අතර 2014 වර්ෂයේ ඉවත්ව ගිය අධ්‍යක්ෂ මණ්ඩලයේ තොරතුරු වාර්ෂික වාර්තාවට අතුළත් කරමි. ඉවත්ව ගිය අධ්‍යක්ෂ මණ්ඩලයේ නම් සහිතව මූල්‍ය වාර්තාවේ 6 වන ඡේදය සංශෝධනය කර මේ සමග ඉදිරිපත් කරමි. (ඇමුණුම 01)

ii. රාජ්‍ය ආයතනය සම්බන්ධයෙන් පවත්නා බැදීම් මූල්‍ය ප්‍රකාශවල හෙළිදරව් කර ඇත.

ග. *ප්‍රමිත අංක 38*

ස්වයංක්‍රීය පහසුකම ලබාගැනීමට ලබාගෙන ඇති උපකරණ පරිගණක සහ ඒ අදාල උපාංග වන බැවින්, එයින් යම් කොටසක් අස්පෘෂ්‍ය වත්කම් ලෙස හදුනාගත හැකි පරිදි උපකරණ වර්ග කිරීමක් කර ඇත. දැනට 2009, 2010, 2012 වර්ෂවල ගිණුම්වලට අදාළ වාර්ෂික වාර්තාව ප්‍රසිද්ධ කර ඇති බැවින් එම කරුණ 2014 වාර්තාවට ඇතුළත් කිරීම සුදුසු වන්නේ දැයි නැවත සලකා බලන ලෙස ඉල්ලමි.

ජ. *ප්‍රමිත අංක 39*

වෙළඳ ණයගැතියන් වෙනුවෙන් බොල්ණය වෙන්කිරීමේ පදනම සංස්ථා මණ්ඩල පත්‍රිකාවක් මගින් අනුමත කරවාගෙන සාධාරණ පදනමකින් සිදු කරනු ලැබූවකි. එය පදනමකින් තොරව කරන බව සඳහන් ප්‍රකාශයට එකඟ විය නොහැකිය.

**2.2.3. ගිණුම්කරණ ප්‍රතිපත්ති**

අ. වාර්තාවේ 2.2.2 අ II සහ ඉ යටතේ මෙම කරුණ ගෙනහැර දක්වා තිබේ. එමගින් සිදුකරන පැහැදිලි කිරීම මෙයට ද අදාළ වේ.

ආ. පිළිවෙතට අනුව ගුවන්කාල පිරිවැය ගිණුම්ගත කිරීම දැන්වීම් කාලසටහන මත පදනම් වේ. දැන්වීම් කාලසටහන පරීක්ෂා කිරීමෙන් මෙය සනාථ කළ හැක.

නිදසුන් ලෙස උපුටා දක්වන කරුණු සම්බන්ධයෙන්, පහත දැක්වෙන නිරීක්ෂණ සිදුකරනු ලැබේ.

i. නිවැරදි වීම

ii. වර්ෂය තුළ නිකුත් කරනු ලැබූ ඉන්වොයිසි වත්මන් වර්ෂයට පමණක් සීමා වී නොමැති බැවින් මෙම නිරීක්ෂණ සමඟ එකඟවිය නොහැක.

iii. ''විකිණී නොමැත'' යන කරුණට එකඟ විය නොහැක. වැඩසටහන් විකාශනය නොකළ බැවින්, මෙම මුදල් වටිනාකම් ණයහිමි උපලේඛනය යටතේ පෙන්වා ඇත. 2015 වර්ෂයේ දී මෙය නිවැරදි කරනු ඇත.

**2.2.4. ගිණුම්කරන අඩුපාඩු**

අ 2010 වර්ෂය තෙක් හීනවන ශේෂ ක්‍රමය මත ක්ෂය කිරීම් කරන ලද අතර, එම වර්ෂයේ සිට ක්ෂය ප්‍රතිපත්තිය සරළ මාර්ග ක්‍රමයට මාරු කිරීම නිසා එදිනට පැවති වත්කම්වල ජීවිත කාලය සලකා සරළ මාර්ග ක්‍රමයකට ආපසු ගැලපීම් කර ක්ෂය ගණනය කර ඇත. මෙම ක්ෂය ප්‍රතිපත්තිය වෙනස්වීමේ දී 100% නිවැරදිව ක්ෂය ගණනය කිරීමට නම් සෑම ස්ථාවර වත්කමක් ම මිලදී ගත් දිනය හා ගත් මිල හදුනාගෙන හීනවන ක්ෂය ක්‍රමය මත කරන ලද ක්ෂය ප්‍රමාණය, ගණනය කර සරල මාර්ග ක්‍රමයට ක්ෂය කළේ නම් එම ක්ෂය ප්‍රමාණය ද ගණනය කර සසදා බලා ක්ෂය වටිනාකම හදුනාගත යුතුව ඇත. එහෙත් සංස්ථාව සතු ස්ථාවර වත්කම් ඒ අන්දමින් හදුනා ගැනීමට අවශ්‍ය තොරතුරු නොමැති නිසා මෙය 100% ක් නිවැරදිව කළ නොහැකි බව දන්වන අතර, පවතින වත්කම්වල ජීවිත කාලය සළකා බලා ඇස්තමේන්තු කරන ලද ක්ෂය වටිනාකම ගිණුම්වලට ගළපා ඇත. වත්කම්වල ජීවිත කාලය සළකා බලා එසේ තීරණය කිරීමට ප්‍රමිත මගින්ද ඉඩ ලබාදී ඇත. නිරීක්ෂණ මගින් ගණනය කර පෙන්වා ඇති ක්ෂය වටිනාකමට එකඟ විය නොහැක. මෙම කරුණ 2013 වර්ෂයේද පැහැදිලි කර ඇත.

ආගිණුම් සමඟ අමුණා ඇති උපලේඛන අංක 11 හි සඳහන් ගුවන්කාල ණයගැති ශේෂයට අගරු චෙක්පත් උපලේඛන අගය එකතුකළ පසු මෙය සමාන වේ.

ඈ ඡේදයට එකඟ වෙමි.

ඈ ප්‍රාදේශීය කාර්යාල වෙනුවෙන් පවත්වාගෙන යනු ලබන ජංගම ගිණුම්වලට ප්‍රධාන කාර්යාලය මගින් ප්‍රාදේශීය කාර්යාල වෙනුවෙන් එකතු කරන ජංගම ගිණුමට සටහන් කරයි. ඒ ඒ මාසය අවසානයේදී ලැබුණු මුදල් පිළිබඳ විස්තරයක් අදාල ප්‍රාදේශීය කාර්යාලවලට යවනු ලබන අතර එම මුදල්වලට අදාලව ප්‍රචාරණය කරනු ලබන දැන්වීම්වල වටිනාකම ඇතුළත් කර මාසික ජර්නල් සටහනක් එවනු ලබන අතර එමගින් ජංගම ගිණුමේ අවශ්‍ය ගැළපීම් කරනු ලබයි. එසේ ජර්නල් සටහන් ගැලපීමෙන් පසු ඉතිරිවන මුදල ණයහිමියන් යටතේ පෙන්වීම සිදුකරනු ලබයි. මෙය පරීක්ෂාකර බලා නිවැරදි කළයුතු ශේෂයක් බව පිළිගනිමි.

ඉ විගණන නිර්දේශ හා එකඟ වෙමි.

ඊ. 2013 වර්ෂයේ අමාත්‍යාංශයෙන් සහ 2014 වර්ෂයේ දෙසැම්බර් මහා භාණ්ඩාගාරයෙන් ලබාදෙන ලද වාහන ගිණුම්වලට ඇතුළත් නොවූයේ ඒවායේ මිළගණන් ලබාගැනීම ප්‍රමාදවීම නිසාය. 2015 නිවැරදි කරමි.

උ. අලුත්වැඩියා වාහනවල පිරිවැය, ගිණුමට සටහන් නොවූ මුදල් ලෙස විගණනය විසින් පෙන්වා දී ඇති මුදලින් රු.480,012/- වැට් බදු මුදල් වන අතර, රු.200,009/- ක් රඳවාගත් මුදලින් ගෙවූ මුදල්ය. පිරිවැය ගිණුමට ඇතුළත් විය යුත්තේ රඳවාගත් මුදල පමණි. වැට් බදු මුදල පිරිවැය ගිණුමට අයත් නොවේ. පිරිවැය ගිණුමට සටහන් විය යුතු රු.200,009/- ක මුදල 2015 වර්ෂයේ දී නිවැරදි කිරීමට කටයුතු කරමි.

ඌ. විගණන වාර්තාවට අනුව සමාලෝචන වර්ෂයේ දී රු.17,874,788/- ක් ගෙවා ඇති බව පෙන්වා තිබුණ ද, ගිණුමට අනුව ගෙවා ඇති මුදල රු.17,364,788/- කි. මෙම මුදලින් රු.510,000/- ක් 2012, 2013 වර්ෂයට අදාළ වන බව පිළිගන්නා අතර, ගිණුම් ප්‍රමිත අනුව පෙර වර්ෂයකට අත්හැරී තිබූ මුදලක් ප්‍රවර්ථන වර්ෂයේ ගෙවීමේදී අදාළ වර්ෂයට ගැලපීමේ අවශ්‍යතාවයක් නොමැත. එසේ වුවද 2015 පෙබරවාරි මස පවත්වන ලද ලෝක කුසලාන ක්‍රිකට් තරගාවලිය වෙනුවෙන් ප්‍රචාරණ අයිතිය ලබාගැනීම සඳහා ගෙවන ලද පුරස්කාර 2014 වර්ෂයේ වියදමක් ලෙස ගිණුම් ගතකර ඇතත් 2015 වර්ෂයට ඇතුළත් වූයේ නම් සුදුසු බව පිළිගනිමි.

එ. වියදම් ඒ ඒ වැය ශීර්ෂ යටතේ ගිණුම් ගතකර වර්ෂය අවසානයේ දී නාලිකා අනුව වර්ගීකරණයකර පරිපාලන වියදම්, මෙහෙයුම් වියදම් වෙන්කර පිළියෙල කරනු ලබන බැවින්, විකාශන මධ්‍යස්ථාන මගින් වැඩසටහන් සම්බන්ධ කිරීමේ වියදම් ද විකුණුම් පිරිවැය යටතේ බෙදා වෙන්කර ඇත.

මාස 2 ක පිරිවැය වර්ෂයේ වියදම්වලට ඇතුළත් වී නොමැති බව පිළිගනිමි.

ඒ. රේගු ගාස්තු ගෙවා භාණ්ඩ නිදහස්කර තිබුණ ද, භාණ්ඩවල නියම වටිනාකම ගණනය කිරීමට නියෝජිත ආයතන සඳහා ගෙවිය යුතු මුදල් එකතු විය යුතුය. එසේ සියලු වියදම් නිශ්චිතව හදුනාගත් පසු ගබඩාව මගින් භාණ්ඩ ලැබීමේ වව්චරය පිළියෙල කරනු ලැබේ. එතෙක් ගෙවූ මුදල් මාර්ගස්ථ තොග යටතේ පෙන්වා ඇත. මෙම ගිණුම් 2015 වර්ෂයේ නිවැරදිවනු ඇත.

ඔ. පිළිගනිමි. නිවැරදි කරන ලද සටහන් අංක 8 මේ සමග ඉදිරිපත් කරමි. (ඇමුණුම 02)

ඕ. පිළිගනිමි. 2015 වර්ෂයේදී නිවැරදි කර ඇත.

ක. සමාලෝචන වර්ෂය තුළ දී කල්බදු පදනමට වාහන ලබාගෙන නොමැති අතර 2010 සහ 2011 වර්ෂවලදී ලබාගත් වාහනවලින් WPPC 4298, 4283, 4284 යන වාහන අලූත්වැඩියාව සඳහා අදාළ ආයතන වෙත යවා ඇති අතර PB 8583 සහ PB 8531 වාහන දෙක හදිසි අනුතරකට ලක්වීම නිසා ධාවනයෙන් ඉවත් කර ඇත. එක් වාහනයක් සඳහා 2014 දී රක්ෂණ වන්දි ලැබී ගිණුම් ගැලපීම්කර ඇත. අනෙක් වාහනය සඳහා 2015 දී රක්ෂණ වන්දි ලැබී ඇත. අලුත්වැඩියාව සඳහා යවා ඇති වාහන අබල වාහන ලෙස සැලකිය නොහැක.

ග. 2011 දක්වා ආර්ථික සේවා බදු ගණනය කිරීමේ ප්‍රතිශතය 1% ක් වන අතර 2011 අප්‍රේල් 01 න් පසු එය 0.25% ක් ලෙස ගණනය කිරීම නිසා වැඩියෙන් ගණනය කිරීමක් සිදුවී ඇත. එහෙත් මෙම මුදල් දේශීය ආදායම් බදු දෙපාර්තමේන්තුවට ප්‍රේෂණයකර නොමැති අතර 2015 වර්ෂයේ දී මෙය නිවැරදි කිරීමට කටයුතු කරමි.

ජ. මෙම ඡේදය යටතේ පෙන්වා ඇති රු.180,988/- ක් වටිනා භාණ්ඩ තොග පාලන ගිණුමට බැර විය යුතු ඒවා වේ. එමනිසා ගිණුම් තැබීම නිවැරදිය.

රු.277,918/- කට අගය කර ''නොමිලේ ලැබූ භාණ්ඩ'' ලෙස පෙන්වා ඇති භාණ්ඩ නොමිලේ ලැබූ භාණ්ඩ නොව මැදිරි මෙහෙයුම් අංශයට ගෙන්වන ලද භාණ්ඩ වන අතර එහි නිවැරදි වටිනාකම රු.277,936.48 කි. මෙය නිවැරදිව ගිණුම්තබා ඇත.

රු.301,750/- ක් වටිනා සංගීත උපකරණ සැපයුම් අත්තිකාරම් යටතේ 2014 දෙසැම්බර් මස ලබාගෙන තිබුණ අතර, එය ජර්නල් සටහන් මගින් 2015 ජනවාරි මස ගිණුම් තබා ඇත. එම නිසා 2014 දෙසැම්බර් වනවිට සැපයුම් අත්තිකාරම් ලෙස පෙන්වීම නිවැරදි ය.

තොග පාලන ගිණුමේ ශේෂය හා භෞතික ශේෂය අතර වෙනස ඒ අන්දමින් පවතී.

ට. අතහැරුණු වියදමක් හෝ ආදායමක් ඊලග වර්ෂයේ දී ගිණුම් ගතකර ඇත්නම් ප්‍රමිතීන්වලට අනුව වර්ෂයේ ආදායම් ලෙස ගිණුම්ගත කිරීම වරදක් නොවේ. ඡේදයේ සඳහන් කරුණ පිළිග නිමි.

ඩ. 2013 දෙසැම්බර් 12 දින ඉඩම බදුදීම වෙනුවෙන් ලද රු.420,000/- ක මුදලින් 2013 වර්ෂයට දින 20 කට අදාළ කොටස රු.25,013/- ක් වන අතර ඉතිරි මුදල 2014 වර්ෂයට අයත් බව පිළිගනිමි.

න. සංස්ථා තීරණයක් මත ඌව පලාත් සභාවේ විකාශනය නතර කිරීම නිසා ඒ වනවිට ලැබිය යුතු මුදල් ගණනය කර ගිණුමට ඇතුළත් කර ඇත. මේ පිළිබඳ පරීක්‍ෂා කර බලා පසුව පිළිතුරු ඉදිරිපත් කරමි.

ත. ත්‍රිකුණාමල ව්‍යාපෘතිය යටතේ ආදායමින් වියදම් අඩුකර ශුද්ධ මුදල දක්වා ඇති බව පිළිග නිමි. ස්ථාවර වත්කම් සඳහා ක්‍ෂය මෙන්ම ඒ මත ක්‍රමක්‍ෂය ද සංස්ථා විදයම් යටතේ පන්වා ඇත. එහි ශුද්ධ ප්‍රතිඵලය ශුන්‍ය නිසා සංස්ථා ගිණුමට බලපෑමක් නොමැත. වියදම් ලෙස දක්වා තිබූ රු.6,783,584/- සහ ආදායම රු.23,394,866/- ක මුදල ගණනය කිරීමට අදාළ ඉන්වොයිස් පත් ඇතුළු සියලූ විස්තර විගණනයට ඉදිරිපත් කර ඇත.

ද. ත්‍රිකුණාමල ව්‍යාපෘතියේ වත්කම් සම්බන්ධයෙන් පවරා ගැනීම් පිරිවැය වටිනාකම අනුව වත්කම් ගිණුම්ගත කර ඇතත්, පරිගණක උපකරණ පාවිච්චි කරන ලද ඒවා බැවින් ඒවා නැවත ප්‍රත්‍යාගණනය කර වටිනාකම හඳුනාගෙන ගිණුම් තැබීමට ගත් තීරණය නිසා මෙය ක්ෂය කිරීම නොකරන ලදී. යම් ආකාරයකින් මෙය ක්‍ෂය කලේ නම් අනෙක් අතට ක්‍රමක්‍ෂය ගිණුම යටතේ ගැලවීම නිසා ලාභයට බලපෑමක් ඇති නොවේ.

ණ. විදේශීය ආයාතනයේ මුදල් වර්ෂය 2012/2013 ලෙස සටහන් කර ඇතත්, එය සංස්ථාවවිසින් සලකා ඇත්තේ 2012 වර්ෂය ලෙයත් 2013/2014 වර්ෂය 2013 ලෙසත් 2014/2015 වර්ෂය 2014 වර්ෂය ලෙසත් වන පරිද්දෙනි. එමනිසා ගිණුම් තැබීම නිවැරදිය. මෙයින් ගිණුම්වලට විශේෂ බලපෑමක් සිදුනොවේ.

ප. ඡේදයේ සඳහන් කරුණ අපහැදිලි බැවින් පරීක්‍ෂා කර බලා පිළිතුරක් ඉදිරිපත් කරමි.

බ. ණයවර ලිපි නිකුත් කළ පමණින් ඒ සඳහා වෙන් කිරීමක් සිදුකළ යුතු නොවේ.

ම. විගණනයේ නිරීක්‍ෂණ නිවැරදිය.

ය. විගණනයේ නිරීක්‍ෂණ නිවැරදිය.

**පසුගිය වර්ෂයේ ගිණුම්කරණ අඩුපාඩු**

අ. ලැබිය යුතු බදු කුලී ගිණුම්වල පෙන්වා ඇත.

ආ. නිවැරදි කර නැත. හේතුව පවතින ගොඩනැගිලි කිහිපයක් අලුත්වැඩියා කිරීමත්, එක් ගොඩනැගිල්ලක නව කොටසක් එකතු කිරීමත් සඳහා මෙම වියදම් දරා ඇත. මෙය පරීක්ෂාකර බලා 2015 වර්ෂයේ දී නිවැරදි කරමි.

ඇ. 2013 වර්ෂයේ ද මෙම කාරණයට පිළිතුරක් ඉදිරිපත්කර තිබියදී 2014 වෙනුවෙන් ද එම කරුණ නැවත ඉදිරිපත්කර ඇති බව පෙනේ. සීදූව ඉඩම ගුවන්විදුලි දෙපාර්තමේන්තුවට පැවරුණු පැරණි ඉඩමක් වන අතර එදින වටිනාකමක් තක්සේරු කර නොතිබුණි. හමුදාවට පවරාදීමේ දී තක්සේරුකර මුදල් ලැබී ඇති අතර, එම මුදල ගොඩනැගිලි ගිණුමට බැරකර ඇත. ගිණුම් තැබීමේ ක්‍රමයේ වරදක් ඇත.

ගාල්ල හපුගල ඉඩම ද රජයෙන් පැවරුණු ඉඩමක් වන අරත පවරාගත් දිනට වටිනාකමක් ගිණුම්ගත වී නැත. එම නිසා ලද මුදල ආදායමට බැර කර ඇත. ඉඩම සඳහා ක්‍ෂය කිරීමක් නොකරන බැවින් ක්‍ෂය ගිණුමට හා සමුච්චිත ක්‍ෂය ගිණුමට බලපෑමක් නැත.

ඈ. දැනට ඒකල ගබඩාවේ ඇති අමතර කොටස්වලින් සමහර අමතර කොටස් ප්‍රයෝජනයට ගත හැකි බැවින් ගබඩාව වසා දැමීමේ කටයුතු නිමකරන තෙක් මෙම වත්කම් ජංගම වත්කම් ගිණුම යටතේ පෙන්විය යුතුය.

ඉ. නිරීක්‍ෂණය නිවැරදිය.

ඊ. මෙම මිලදී ගැනීම්වලට අදාළ වව්චරු නැවත පරීක්‍ෂාකර බලා පිළිතුරක් ඉදිරිපත් කරමි. නිරීක්‍ෂණයේ පෙන්වා ඇති රු.25,687.683/- ගණනය කරගත් ආකාරය සහ වව්චරුවල විස්තර විමසුමේ පෙන්වා නැති නිසා සහ වසර ගණනක් පැරණි ගනුදෙනුවක් බැවින් නැවත පරීක්‍ෂා කළ යුතුය.

**2.2.5. නොසැසඳුන පාලන ගිණුම්**

අ. ගුවන්කාල ණයහිමියෝ

වාර්තාවේ පෙන්වා ඇති වෙනස නිවැරදිය.

ආ. ගුවන්කාල ණයගැතියෝ

වෙනසක් නොමැත. ගුවන්කාල ණයගැතියන් මූල්‍ය වාර්තාවල කොටසක් ''වෙළඳ ණයගැතියෝ'' සහ අනෙක් කොටස අගරු චෙක්පත් යටතේ වර්ග කර දක්වා ඇත. ශේෂයේ වෙනසක් නැත.

ඇ. ලැබිය යුතු ආදායම් (විවිධ)

ලැබිය යුතු ගුවන්කාල ආදායම් හා කුළුණු ආදායම රු.6,240,717.22 සහ ලැබිව යුතු ස්ථාවර තැන්පතු පොලිය රු.1,681,891.98 යන දෙකින් මෙම ශේෂය සමන්විතය. මෙය උපලේඛනය හා සමාන වන අතර නිවැරදි අගය රු.7,862,609/- කි.

හදුනා නොගත් ශේෂ

(අ) සිට (ඈ) දක්වා පෙන්වා ඇති හදුනානොගත් ශේෂය රු.29,040,205/- ක මුදල 2002 වර්ෂයටත් පෙර සිට පැවත එන ශේෂයක් වන අතර එය හඳුනා ගැනීමට ලිපි ලේඛන නොමැති බැවින් හඳුනාගත නොහැක.

**2.2.6. පැහැදිලි නොකළ වෙනස්කම්**

ගබඩා තොග ගිණුම් යටතේ පෙන්වා ඇති ශේෂ අතරින් වෙනත් අමතර කොටස් ශේෂය හැර අනෙකුත් ශේෂ නිවැරදිය. එහෙත් අමතර කොටස් යටතේ සමීක්ෂණ මණ්ඩල වාර්තා අනුව තොග ශේෂය රු.120,985/- ක් විය යුතුය. ඒ අනුව වෙනස රු.724,415/- ක් විය යුතුය.

**2.2.7. අවිනිශ්චිත ගිණුම නිවැරදිය**

**2.2.8 විගණනය සඳහා සාකෂි නොවීම**

අ. ස්ථාවර වත්කම් සම්බන්ධයෙන් පොදු 287 ප්‍රකාරව අවශ්‍ය විස්තර ඇතුළත් කර ඉඩම් සහ ගොඩනැගිලිවලට අදාලව විස්තරාත්මක වාර්තාව පිළියෙල කර ඇත. ඒ අනුව වත්කම් ලෙජරය ද පිළියෙල කරගෙන යනු ලැබේ. පොදු 287 යටතේ ඉඩම් ගොඩනැගිලි ලේඛනය තවදුරටත් නිවැරදි කරගැනීම සඳහා 2015.06.28 දිනට සකස් කළ ඉඩම් පිළිබඳ විස්තර ලේඛනය මේ සමඟ අමුණා ඇත. (ඇමුණුම 03)

ආ. මූල්‍ය ප්‍රකාශන අනුව පෙන්වා ඇති පිරිවැය වන රු.73,414,986/- නිවැරදිය. ප්‍රවාහන අංශයෙන් ලබාගත් පිරිවැඩ සමග සැසඳීමට හේතු අපැහැදිලිය.

ඇ. හදුනාගත නොහැකි ශේෂයක් බැවින් විස්තරාත්මක උපලේඛනයක් ලබාදිය නොහැක.

ඈ. මෙම උපලේඛනය සකස් කර පසුව ඉදිරිපත් කරමි.

ඉ. මරණ දැන්වීම් සඳහා පෙන්වන ශේෂය නිවැරදිය. පරීක්ෂාකර බලා නිවැරදි කළ යුතු ශේෂයකි.

ඊ. ගෙවිය යුතු තැන්පත් සඳහා වෙන්වන ශේෂය හදුනාගත නොහැකි ශේෂයක් බැවින් උපලේඛනයක් ඉදිරිපත් කළ නොහැක.

උ.ඌ.ඍ. ත්‍රිකුණාමල ප්‍රතිවිකාශනාගාරයේ වත්කම් පිලිබඳව පවතින ඉන්වෙන්ට්‍රි භාරගැනීමෙන් පසු එක් එක් අයිතම පරීක්ෂාකර ඒ ඒ කාමට අනුව ඉන්වෙන්ට්‍රි ලේඛන ලියාගෙන යනු ලැබේ. එසේ ලියා අවසන් කිරීමෙන් පසු භාණ්ඩ සමීක්ෂණය කර 2015 දී සමීක්ෂණ වාර්තාව ඉදිරිපත් කරමි.

ඒ. නව ගොඩනැගිල්ල ඉදිකිරීමේ කටයුතු සඳහා ගෙවා ඇති අත්තිකාරම් මුදල් මේ යටතේ පෙන්වා ඇති අතර මෙහි සියලු වියදම් සහ වැඩ සැලසුම්, වියදම් ඇස්තමේන්තුව නාගරික සංවර්ධන අධිකාරිය යටතේ කරනු ලබන බැවින් සඳහන් කර ඇති උපලේඛන සංස්ථාවට ඉදිරිපත් කළ නොහැකි තත්ත්වයක් පවතී.

ඔ. සේවක අත්තිකාරම්
හදුනාගත නොහැකි ශේෂයක් බැවින් උපලේඛන ඉදිරිපත් කළ නොහැක.

ඕ. ජර්නල් සටහන් සමඟ උපයෝගී ලියවිලි ද අමුණා ඇත. තවදුරටත් අවශ්‍ය උපලේඛන කොමපමණ ද යන්න පෙන්වා දෙන්නේ නම් ඒවා ද ඉදිරිපත් කළ හැක.

ක. - එම -

ග. ණයකැති ශේෂ ලැයිස්තුව ඉදිරිපත් කර ඇත.

ජ. විදේශ ගුවන්කාල විකුණුම් සඳහා ඉන්වොයිසි පත් ලෙස භාවිතා කරනු ලබන්නේ ගිණුම් ප්‍රකාශයයි. ගිණුම් ප්‍රකාශය විගණනයට ඉදිරිපත් කර ඇත. මෙය පදනම් කරගෙන මුදල් අයකරනු ලැබේ.

ට. ලක්හඬ ගුවන්විදුලි සේවය 2001 වර්ෂයට පෙර ගුවන්විදුලි සංස්ථා පරිශ්‍රයේ පවත්වාගෙන ගිය අතර 2001 අප්‍රේල් මස සිට මෙම පරිශ්‍රයෙන් ඉවත්කර ඇත. ඒ දක්වා ගුවන්විදුලි සංස්ථාවෙන් එම සේවයට ලබාදුන් පහසුකම් සඳහා 200 වර්ෂයේදී අංක 118 ජර්නලය මගින් ලැබිය යුතු මුදලක් සේ ගිණුම්ගත කර ඇත. මේ සඳහා මුදල් අධ්‍යක්ෂගේ AP 220 ලිපිගොනුවේ විස්තර සටහන්ව ඇත. මෙම මුදල් ගෙවන ලෙස 2000 දෙසැම්බර් 17 වන දින ස්වාධීන රූපවාහිනී සේවයේ සභාපති වෙත ඉල්ලීමක් ඉදිරිපත් කර ඇතත් මේ දක්වා ගෙවීම කර නැත.

ඩ. ඉදිරිපත් නොකළ වව්චර් අතරින් වව්චර්පත් 12 ක් වැටුප් ගෙවීමට අදාල වන අතර, එහි වටිනාකම රු.289,892,775/- ක් වේ. වැටුප් ලේඛන විගණනයට ඉදිරිපත් කර ඇත. ඉතිරි වව්චර් පත් පරීක්ෂා කර බලා විගනනයට ඉදිරිපත් කරමි. වැටුප් ලේඛන සඳහා වෙනම වව්චරයක් පිලියෙල නොකිරීම නිසා මෙම තත්ත්වය පවතී. 2015 වර්ෂයේ මේ සඳහා වව්චරය පිළියෙල කිරීමට කටයුතු කරමි.

න. ගුවන්කාල ණයහිමි උපලේඛන ඉදිරිපත් කර ඇත.

ත. ගුවන්කාල ණයගැති උපලේඛන ඉදිරිපත් කර ඇත.

**2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

අ. ණයගැති උපලේඛනයේ මෙය පෙන්වා ඇත.

ආ. විගණන නිරීක්ෂණය නිවැරදිය.

ඇ. ලැබිය යුතු මුදල් තැන්පත්කර ඇත්තේ ගුවන්විදුලි සංස්ථාව සඳහා ජලය, විදුලිය, දුරකථන වැනි විවිධ සේවා ලබාගැනීම සඳහාය. එම සේවා ලබාගන්නා තෙක් තැන්පත් මුදල් ආපසු ලබාගත නොහැක. මෙම තැන්පත් සම්බන්ධයෙන් සංස්ථා මණ්ඩල පත්‍රිකාවක් ඉදිරිපත්කර තීරණයක් ගත යුතුය.

ඈ. නිරීක්ෂණය නිවැරදිය.

ඉ. නිරීක්ෂණය නිවැරදිය.

**2.4 නීති රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම.**

(අ) විගණන නිරීක්ෂණය නිවැරදිය.

(ආ) i. විගණන නිරීක්ෂණය නිවැරදිය.
- ii. විගණන නිරීක්ෂණය නිවැරදිය.
- iii. විගණන නිරීක්ෂණය නිවැරදිය.
- iv. පරීක්ෂාකර බලා නිවැරදි කිරීමට කටයුතු කරමි.
- v. විගණන නිරීක්ෂණය නිවැරදිය.
- vi. විගණන නිරීක්ෂණය නිවැරදිය.
- vii. දැනට මෙම මුදල් නිරවුල් වී ඇත.
- viii. ගමන් පිළිබඳ මාසික සාරාංශ නියමිත දිනට ඉදිරිපත් නොකළද පසුව ඉදිරිපත් කර ඇත.
- ix. සියලු වාහන සඳහා ලොග් පොත් දැනට ලියාගෙන යනු ලැබේ.
- x. ගොඩනැගිලි නවීකරණය කිරීමේදී ඉඩකඩ ප්‍රමාණවත් නොවීම නිසා විධිමත් ක්‍රමවේදයක් මත මේවා ගබඩා කිරීමට අපහසු විය. එසේ වුවද ඉදිරියේ දී මෙම තත්ත්වය නිවැරදි කිරීමට කටයුතු කරමි.

(ඇ) සෑම මාසයකදී ම ඉදිරිපත් නොකළ ද, සංස්ථා මණ්ඩලයේ අවශ්‍යතාවය අනුව මුදල් ප්‍රවාහ ප්‍රකාශය හා ආදායම් වියදම් වාර්තාව ඉදිරිපත් කර ඇත.

**2.5. ප්‍රමාණවත් අධිකාර බලයකින් තහවුරු නොවූ ගනුදෙනු**

මේ යටතේ නිරීක්ෂණ දක්වා නැත.

**3. මූල්‍ය සමාලෝචනය**

**3.1. මූල්‍ය ප්‍රතිඵල**

මූල්‍ය ප්‍රතිඵල සම්බන්ධයෙන් විගණනයේ නිරීක්ෂණ නිවැරදිය.

**3.2. විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය**

විගණන නිරීක්ෂණ නිවැරදිය.

**3.3. ආයතනයට එරෙහිව හෝ ආයතනය විසින් ආරම්භකර ඇති නෛතික සිද්ධීන්**

විගණන නිරීක්ෂණ නිවැරදිය.

**3.4. කාරක ප්‍රාග්ධන කළමනාකරණය**

විගණන නිරීක්ෂණ නිවැරදිය.

**4.0. මෙහෙයුම් සමාලෝචනය**

**4.1. කාර්ය සාධනය**

(අ) නිවැරදි කිරීම සඳහා කටයුතු කරමින් ඇත.

(ආ) අදාල වාර්තා සංස්ථා මණ්ඩලය වෙත ඉදිරිපත් කර ඇත.

**4.2. කළමනාකරණ අකාර්යක්‍ෂමතා**

අ. විත්තිකරුගෙන් අයකර ගැනීමට ඇති මුදල් සඳහා කටයුතු කිරීමට නීති අංශයට යොමු කර ඇත.

ආ. විගණන නිරීක්ෂණ නිවැරදිය.

ඇ. ප්‍රසම්පාදන මාර්ගෝපදේශක සංග්‍රහයට පටහැනිව කටයුතු නොකරන අතර හදිසි අවස්ථාවක දී විද්‍යුත් තැපැල් මගින් භාණ්ඩ මිල දී ගැනීම සිදුකරනු ලැබේ. එසේ මිලදී ගත්ත ද, ඒවා මිල දී ගනු ලබන්නේ අදාළ පිරිවිතරයන් හා ගැලපේ ද යන්න පරීක්‍ෂා කිරීමෙන් පසුව ය.

ඈ. නිල නිවාස සම්බන්ධයෙන් පවතින අඩුපාඩු නිවැරදි කිරීමට පියවර ගෙන ඇත.

ඉ. නිවාස දෙකෙහි අයිතිය ලබාගැනීමට කටයුතු කරමින් ඇත.

ඊ. සංස්ථාව සතු හමුදාව විසින් භාවිත කරන නිල නිවාස 3 එවකට පැවති රජයේ ඉල්ලීම මත පවරා දී ඇති අතර, බාහිර පුද්ගලයන් භාවිත කරන නිවාඩ ආපසු ලබාගැනීමට නීති මගින් කටයුතු කර ඇත. භාවිතයට ගත නොහැකි නිවාසද අලුත්වැඩියාකර භාවිතයට ගත හැකිදැයි පරීක්‍ෂා කරමින් පවතී.

**4.3. මෙහෙයුම් අකාර්යක්‍ෂමතා**

(අ) විගණන නිරීක්ෂණය නිවැරදිය.

(ආ) ජාතික ආරක්‍ෂක අවශ්‍යතා අනුව පොලිස් දෙපාර්තමේන්තුවට මෙම කුළුණ සන්නිවේදන කටයුතු සඳහා භාවිතා කිරීමට අවස්ථාව ලබා දී ඇත.

**4.4. නිශ්ක්‍රීය හා ඌණ උපයෝජිත වත්කම්**

සංස්ථාව සතු අබලන් තත්ත්වයේ ඇති නිවාස ප්‍රතිසංස්කරණය කර සංස්ථාවේ ප්‍රයෝජනයට ලබාගැනීමට ඇති හැකියාම සොයා බලමින් සිටී.

**4.5. ආර්ථික නොවූ ගනුදෙනු**

(අ) ආර්ථික නොවූ ගනුදෙනු ලෙස හැඳින්වීමට එකඟ නොවෙමි. නීතිමය තත්ත්වයක් මත කම්කරු දෙපාර්තමේන්තුවේ නියෝග මත ගෙවීමට සිදුව ඇත.

(ආ) සංස්ථාවේ මූල්‍ය දුෂ්කරතා හේතුවෙන් ආර්ථික සේවා ගාස්තු නියමිතය ප්‍රේෂණය නොකිරීම නිසා දඩ මුදල් අයවිය යුතු බව දේශීය ආදායම් කොමසාරිස් දන්වා ඇත.

**4.6. හඳුනාගන්නා ලද පාඩු**

අ. විගණන නිරීක්ෂණ නිවැරදිය.

ආ. ඉඩම් සම්බන්ධයෙන් භුක්තිය පවරාදීමට කටයුතු කරන අවස්ථාවේ තක්සේරු වටිනාකමට වන්දි මුදල් ලබාගැනීමට ඇති හැකියාව සොයාබලමින් ඇත.

ඇ. මෙම ගිණුම්කරණ පද්ධතිය මිලදී ගැනීම සුදුසුකම් පරීක්ෂා කර බලා සිදුකර ඇතත් ආයතනය බන්කොලොත් වීම මත මේ තත්ත්වය සිදුව ඇත.

ඈ. වර්තමාන වටිනාකම තක්සේරු කර අයකර ගැනීමට ඇති හැකියාව සොයා බලමින් ඇත.

**4.7. කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු**

කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩුවක් ලෙස පෙන්වා ඇති එම කරුණුවලට එකඟවිය නොහැක.

**4.8. විධිමත් පරිදි පවරා නොගත් ඉඩම්/ දේපලවල ව්‍යාපෘති ආරම්භ කිරීම.**

මෙහි සඳහන් ඉඩම වසර 30 ක් සඳහා දීර්ඝ කාලීන බද්දකට ලබා දී තිබූ අතර තවදුරටත් බදුකාලය දීර්ඝ කරගැනීම සඳහා අදාල කටයුතු කරමින් ඇත.

**4.9. වෙනත් රාජ්‍ය ආයතන වෙත ලබාදුන් සංස්ථාවේ සම්පත්**

අ. ඒකල විකාශනාගාරය පිහිටා තිබූ ඉඩමෙන් කොටසක් යුධ හමුදාව විසින් අබාධිත රණවිරුවන්ගේ ගොවිපළක් සඳහා ලබාගෙන තිබූ අතර, රාජ්‍ය අනුග්‍රහය මත කරන ලද කටයුත්තක් බැවින් එයට මැදිහත් වීමට ගුවන්විදුලි සංස්ථාවට අපහසුය.

ආ. සැලසිනෙ ආයතනය ජනමාධ්‍ය අමාත්‍යාංශය යටතේ පැවති ආයතනයක් වන බැවින් ගිවිසුමක් නොමැතිව සංස්ථා පරිශ්‍රයේ ස්ථාපිත කර තිබුණි. මේ වෙනුවෙන් අයවිය යුතු මුදල් ගණනය කර ගිණුම්වල පෙන්වා ඇත.

**4.10. කාර්ය මණ්ඩල පරිපාලනය**

(අ) බඳවා ගැනිමේ පරිපාටිය සකස් කිරීම සඳහා අදාළ කටයුතු කරමින් පවතී.

(ආ) සේවා අවශ්‍යතාවය මත මෙම බඳවා ගැනීම් සිදුකර ඇත.

(ඇ) මෙම රාජකාරි කටයුතු මාරු කිරීම එම අංශවල පැවති රාජකාරි අනුව කර ඇත.

(ඈ) කාර්ය මණ්ඩලය අතිරික්ත වුවද එම රාජකාරි අවශ්‍යතා සඳහා යෙදවීමට ප්‍රමාණවත් කාර්ය මණ්ඩලයක් නොමැති නිසා මෙම සේවය ලබාගැනීමට සිදුවේ.

(ඉ) මෙම පුරප්පාඩු පිරවීම සඳහා ඉදිරියේදී ක්‍රියා කිරීමට නියමිතය.

(ඊ) සේවා අවශ්‍යතාවය මත සංස්ථා මණ්ඩල අනුමැතිය අනුව මෙම සේවා කාලය දීර්ඝ කර ඇත.

(උ) ඉදිරියේදී මේ සම්බන්ධයෙන් කටයුතු කිරීමට නියමිතය.

**5.0. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය**

**5.1. මුල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම නිවැරදිය.**

**5.2. සංයුක්ත සැලැස්ම**

(අ) 2016 සංයුක්ත සැලැස්ම සැකසීමේ දී මෙය ඇතුළත් කිරීමට නියමිතය.

**5.3. ක්‍රියාකාරී සැලැස්ම**

(අ) 2016 ක්‍රියාකාරී සැලැස්ම සකස්කරන ලෙස රාජ්‍ය මුදල් චක්‍රලේඛය සම්බන්ධයෙන් අවධානය යොමු කළෙමි.

(ආ) සංයුක්ත සැලැස්ම සම්බන්ධයෙන් විගණනයේ පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කිරීම සඳහා කටයුතු කරනු ඇත.

(ඇ) ක්‍රියාකාරී සැලැස්ම හා සංයුක්ත සැලැස්ම සම්බන්ධයෙන් විගණනයේ පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කිරීමට කටයුතු කරනු ඇත.

**5.4. අභ්‍යන්තර විගණනය**

අ. ඒ ඒ වර්ෂවල දී අභ්‍යන්තර විගණන අංශය විසින් නිකුත්කර ඇති විගණන විමසුම් සඳහා පිළිතුරු දී නොතිබුණත්, පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කිරීමට කටයුතු කර ඇත.

ආ. විගණන නිරීක්ෂණ නිවැරදිය.

**5.5. විගණන කමිටු**

විගණන කමිටු සම්බන්ධයෙන් විගණන නිරීක්ෂණ නිවැරදිය.

**5.6. වාර්ෂික වාර්තා සභාගත කිරීම**

2012 වාර්ෂික වාර්තාව මුද්‍රණයේ පවතී.

**5.7. නොවිසඳී ඇති විගණන ඡේද**

අ. හස්ත කර්මාන්ත මණ්ඩලය වෙනුවෙන් බාහිර පුද්ගලයෙකු පෙනී සිට වංචාවක් සිදුකර තිබේ නම් ඒ සම්බන්ධයෙන් කටයුතු කළයුතු වන්නේ හස්ත කර්මාන්ත මණ්ඩලය විසිනි.

ආ. ඇන්ටනා කුළුණ ගෙන්වීම සඳහා වැය කළ රු.23,119,683/- ගණනය කළ ආකාරය පැහැදිලි නැත. එය කෙරීගෙන යන වැඩ ගිණුම යටතේ පෙන්විය යුතු බව පිළිගනිමි. එහෙත් ඉංජිනේරු අංශයේ වාර්තාවක් අනුව 2010 දී ප්‍රාග්ධන ගිණුමට මාරුකර ඇත. මෙය නැවත පරීක්ෂාකර බලා නිවැරදි කිරීමට පියවර ගනිමි. මේ සම්බන්ධයෙන් නීතිමය කටයුතු කිරීම සඳහා නීති අංශය වෙත යොමු කර ඇත.

**5.8. පාරිසරික හා සමාජ වගකීම් ඉටුකිරීම**

අ. සංස්ථාවේ ශ්‍රවණ තත්ත්වය සම්බන්ධයෙන් අධ්‍යක්ෂ (සම්ප්‍රේෂණ) යටතේ ඒ සම්බන්ධයෙන් ක්‍රියාත්මක නිලධාරීන් වෙත යොමු කිරීම සාමාන්‍ය ක්‍රමවේදයයි. විගණනයේ පෙන්වා දී ඇති කරුනු අනුව ශ්‍රවණ තත්ත්වය පරීක්ෂා කිරීම සඳහා ඇති හැකියාව සොයා බැලීමට ඉදිරියේදී කටයුතු කරනු ඇත.

**6. පද්ධති හා පාලනයන්**

පද්ධති හා පාලනයන් යටතේ පෙන්වා ඇති විෂයයන් කෙරෙහි අවධානය යොමුවිය යුතු බව පිළිගනිමි.

නීතිඥ නන්ද මුරුත්තෙට්ටුවෙගම
සභාපති
ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාව

**පිටපත් :** ලේකම්, ජනමාධ්‍ය අමාත්‍යාංශය
ලේකම්, මුදල් හා ක්‍රමසම්පාදනය අමාත්‍යාංශය